විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சு

MINISTRY OF POWER AND ENERGY





# ප්‍රගති වාර්තාව
# முன்னேற்ற அறிக்கை
# Progress Report
# 2023

# විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

## ප්‍රගති වාර්තාව - 2023


**විදුලිබල අංශය**

අංක 437, ගාලු පාර,
කොළඹ 03.
දුරකථන අංකය - 011 2574922
ෆැක්ස් අංකය - 011 2574741
වෙබ් අඩවිය - www.powermin.gov.lk

**බලශක්ති අංශය**

අංක 80, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.
දුරකථන අංකය - 011 2370033
ෆැක්ස් අංකය - 011 2372115
වෙබ් අඩවිය - www.energymin.gov.lk

CM 39167 - 35 (2023/11) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# අන්තර්ගතය


| | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | vi |
| පළමු පරිච්ඡේදය - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | |
| 1.1 අමාත්‍යාංශයේ දැක්ම , මෙහෙවර හා අරමුණු | 01 |
| 1.2. අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ | 02 |
| 1.3. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන | 02 |
| 1.4 අමාත්‍යාංශය මුහුණ දුන් අභියෝග සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ එහි ප්‍රතිඵල | 03 |
| 1.5 2023 වර්ෂය තුළ විදුලිබල අංශයේ කාර්යසාධනය | 05 |
| 1.6 2023 වර්ෂය තුළ බලශක්ති අංශයේ කාර්යසාධනය | 16 |
| 1.7 විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2023 සැප්තැම්බර් 30 දක්වා මූල්‍ය ප්‍රගතිය | 25 |
| දෙවන පරිච්ඡේදය - ලංකා විදුලිබල මණ්ඩලය | 26 |
| තෙවන පරිච්ඡේදය - සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම | 36 |
| හතරවන පරිච්ඡේදය - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 39 |
| පස්වන පරිච්ඡේදය - සී/ස එල් ටී එල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම | 46 |
| හයවන පරිච්ඡේදය - සී/ස ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම | 58 |
| හත්වන පරිච්ඡේදය - ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය | 60 |
| අටවන පරිච්ඡේදය - ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව | 66 |
| නවවන පරිච්ඡේදය - ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම | 78 |
| දසවන පරිච්ඡේදය - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 82 |
| එකොළොස්වන පරිච්ඡේදය - ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම | 87 |
| දොළොස්වන පරිච්ඡේදය - ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය | 91 |

# වගු නාමාවලිය


| | |
|---|---|
| වගුව 1.1 | උත්පාදන මූලාශ්‍රය අනුව ස්ථාපිත විදුලි ධාරිතාවය |
| වගුව 1.2 | සී/ස සිනොපෙක් ෆුවල් ඔයිල් ලංකා (පුද්ගලික) සමාගමේ ඉන්ධන ආනයන තොරතුරු (2023.09.24 දිනට) |
| වගුව 1.3 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන ආනයන ප්‍රමාණය (2023.01.01 සිට 2023.09.20 දක්වා) |
| වගුව 1.4 | පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභය කෙරෙහි බලපෑම |
| වගුව 1.5 | ජාතික ඉන්ධන අවසර පත්‍රය මගින් ඉන්ධන නිකුත් කිරීමේ ප්‍රගතිය (2022.08.01 සිට 2023.08.01 දක්වා) |
| වගුව 1.6 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගෙවිය යුතු ඩොලර් ණය ප්‍රමාණය (2022.12.31 දිනට) |
| වගුව 1.7 | බලශක්ති අංශයේ වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායම |
| වගුව 1.8 | 2023 වර්ෂයේ ප්‍රාග්ධන අයවැයේ මූල්‍ය ප්‍රගතිය |
| වගුව 10.1 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන තොරතුරු (2020.01.01 සිට 2023.08.31 දක්වා) |
| වගුව 10.2 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ඉන්ධන අලෙවිය (2021 සිට2023.08.31 දිනට) |
| වගුව 10.3 | විදුලිබල අංශයට ඉන්ධන අලෙවි කිරීම (2016 - 2023 2023.08.31 දක්වා) |
| වගුව 11.1 | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ඉන්ධන ගබඩා ධාරිතාවය (2023.09.30 දිනට) |
| වගුව 11.2 | 2023 වසර තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය |
| වගුව 11.3 | 2023 වසර තුළ ලංකා ඉන්දියන් තෙල් සමාගම වෙත ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය |
| වගුව 11.4 | 2023 වසර තුළ සිනොපෙක් සමාගම වෙත ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය |

# ප්‍රස්තාර / සිතියම් / සටහන්

ප්‍රස්ථාර 1.1 සවිස්තරාත්මක විදුලි උත්පාදන මිශ්‍රණය (2023 ජනවාරි සිට අගෝස්තු අවසානය දක්වා)

ප්‍රස්ථාර 1.2 ස්ථාපිත විදුලි උත්පාදන ධාරිතාව (%) - 2023

ප්‍රස්ථාර 1.3 පුනර්ජනනීය විදුලිබල උත්පාදනය

ප්‍රස්ථාර 1.4 ඉන්ධන මිල සූත්‍රය අනුව ඛනිජ තෙල් නිෂ්පාදන විකුණුම් මිල (2021 ජූනි සිට 2023 සැප්තැම්බර් 01 දක්වා)

ප්‍රස්ථාර 10.1 පසුගිය වසර තුන තුළ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය (2021.01.01 සිට 2023.08.31 දක්වා)

ප්‍රස්ථාර 10.2 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පිරිපහදුවේ නිෂ්පාදන සංයුතිය (2023 ජනවාරි සිට අගෝස්තු 31 දක්වා)

ප්‍රස්ථාර 10.3 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පෙට්‍රල්, ඩීසල් හා ගුවන්යානා ඉන්ධන අලෙවි ප්‍රමාණය (2020 සිට 2023.08.31 දක්වා)

ප්‍රස්ථාර 10.4 2023 වර්ෂයේ ගුවන් යානා ඉන්ධන අලෙවිය

ප්‍රස්ථාර 11.1 2023 වසර තුළ ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය

සටහන් 10.1 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන අලෙවි මිශ්‍රණය

# හැඳින්වීම

විදුලිබල හා බලශක්ති විෂය පථයට අදාළ ප්‍රතිපත්ති, වැසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම මෙන්ම ජනතාවට ලබාදෙන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම ප්‍රධාන අරමුණකොට ගනිමින් අතිගරු ජනාධිපතිතුමාට පැවරී ඇති බලතල අනුව, වර්ෂ 2022 ජූලි මස 22 දිනැති හා අංක 2289/43 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය පිහිටුවන ලදී.

ඒ අනුව විදුලිබල අංශය යටතේ ආයතන අටක් ද (8) එනම්, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, පරමාණුක බලශක්ති මණ්ඩලය, පරමාණුක බලශක්ති නියාමන සභාව, එල්.ටී.එල්. හෝල්ඩින්ග්ස් සමාගම, ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම හා ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම අධීක්ෂණයට ලක්කරන අතර බලශක්ති අංශය යටතේ ආයතන තුනක් ද (3) එනම්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හා ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය යන ආයතන අධීක්ෂණයට ලක් වේ.

පසුගිය කාල පරිච්ඡේදය තුළ ඇතිවූ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සමස්ත ලෝකයටම ඇතිවූ අහිතකර බලපෑම අප රටට ද සෘජු ලෙස දැනුණි. එහිදී සමාජ, ආර්ථික හා දේශපාලනික වශයෙන් අභියෝගයන්ට මුහුණ දීමට සිදු වූ අතර විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය ද දැඩි අර්බුදකාරී තත්ත්වයට පත් වී තිබුණි. එහෙත් ක්‍රමක්‍රමයෙන් එම ගැටළු හා පසුබෑම් නිරාකරණය කර ගැනීමටත්, එම අභියෝග රැසක් ජය ගැනීමටත් 2023 වසරේදී හැකියාව ලැබුණි. ඒ සඳහා විශේෂ උපාය මාර්ග හඳුනාගනිමින් මනා අධීක්ෂණයකින් යුක්තව එම ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීමට අමාත්‍යාංශය කටයුතු කරන ලදී.

මෙම අමාත්‍යාංශයේ විදුලිබල අංශයට අදාළව 2023 වර්ෂය තුළදී සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහතින් ඉදිරිපත් කර ඇත.

2030 වර්ෂය වන විට පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් විදුලිය නිපදවීම 70% ක ප්‍රමාණයකින් සපුරාලීම ද 2050 වන විට කාබන් උදාසීනභාවය (Net Zero) ලබා ගැනීමේ ප්‍රතිපත්තිය ද ශ්‍රී ලංකා රජය මඟින් මේවන විටත් ප්‍රකාශයට පත් කර ඇත. තවද, ඉදිරියේදී ගල් අඟුරු බලාගාර ඉදි නොකිරීමට ද රජය තීරණය කර ඇත. දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුති කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද “ජාතිකව තීරණය කරන ලද දායකත්වයන්” (NDCs) යටතේ කොන්දේසි විරහිතව 5% ක් සහ 20% ක් කොන්දේසි සහිතව කාබන් විමෝචනය අඩු කිරීමට ශ්‍රී ලංකාව කැපවී ඇත. "දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්තිය සඳහා සැම දෙනාටම ප්‍රවේශය සහතික කිරීම" යන තිරසර සංවර්ධන ඉලක්ක (SDG) අංක 7 යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ඇති කර ගෙන ඇති එකඟතාව මත එම ඉලක්ක සපුරා ගැනීමේ වගකීම ද අමාත්‍යාංශය සතුය.

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වන සූර්ය බලය, සුළං බලය හා අනෙකුත් අඩු වියදම් බලශක්ති ප්‍රභවයන් ඉලක්ක කර ගනිමින් විදුලි උත්පාදනයන් ඇති කර ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කර පෞද්ගලික ආයෝජකයින් ගෙන්වා ගැනීම සඳහා මූලික පියවරයන් ගෙන ඇත.

දේශගුණික විපර්යාස අවම කිරීමේ සියලු උත්සාහයන් අතර බලශක්ති අංශයේ කාබන්හරණය මෙම අමාත්‍යාංශයේ වඩාත් අවධානයට ලක්වූ ඉලක්ක අතුරෙන් එකකි. ගෝලීය හරිතාගාර වායු විමෝචනය සඳහා ප්‍රමුඛ දායකයා පොසිල ඉන්ධන වන බැවින් අනාගතයේදී පිවිතුරු බලශක්තිය (Clean Energy) ප්‍රවර්ධනය කිරීම සඳහා බලශක්ති අංශය දුඹුරු පැහැයේ සිට හරිත පැහැය දක්වා මාරු විය යුතුය. දේශගුණික විපර්යාසයන්හි බලපෑම අවම කිරීම සඳහා පොසිල පදනම් වූ බලශක්තියේ සිට කාබන් උදාසීනභාවය දක්වා සංක්‍රමණය වීමට අවශ්‍ය වන “පුනර්ජනනීය බලශක්තිය” ප්‍රවර්ධනය කිරීමට සහ “බලශක්ති කාර්යක්ෂමතා ක්‍රමවේද” ක්‍රියාත්මක කිරීමට සාමූහික උත්සාහයන් අවශ්‍ය වේ.

මෙම ප්‍රතිපත්ති රාමුව යටතේ, දළ වශයෙන් මෙගාවොට් 4,991 ක සම්පූර්ණ ස්ථාපිත ධාරිතාවක් ඇති විදුලි බලාගාරවලින් විදුලි පාරිභෝගිකයන් 7,500,000 කට වැඩි පිරිසකට දළ වශයෙන් ගි.වො.පැ. 16,500 ක වාර්ෂික විදුලි ඉල්ලුමක් සපුරාලීමට සිදු වේ.

එමෙන්ම, මෙම අමාත්‍යාංශයේ බලශක්ති අංශයට අදාළව 2023 වර්ෂය තුළදී සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහතින් ඉදිරිපත් කර ඇත.

ඛනිජ තෙල් බෙදා හැරීම පුළුල් කිරීමට රජය ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණය අනුව වෙනත් තරඟකාරී පාර්ශවකරුවන්ට වෙළඳපොළට පිවිසීමේ අවස්ථාව ලබා දී ඇත. ඒ අනුව ඛනිජ තෙල් ආනයනය කර රට තුළ බෙදා හැරීම සඳහා චීනයේ සිනොපෙක් සමාගමට දැනටමත් බලපත්‍රයක් ලබා දී ඇති අතර එවැනි තවත් සමාගම් දෙකකට දේශීය වෙළඳපොළට පිවිසීමට අවස්ථාව ලබා දී ඇත. එමඟින් අදාළ ක්ෂේත්‍රයන් සුපරීක්ෂණයට ඇති හැකියාව මඟින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අවශ්‍ය මූලික ක්‍රියාකාරකම් හඳුනාගනිමින් එම තත්ත්වය ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය මූලික වැඩකටයුතු සකස් කර ඇත. ඒ හරහා වෙළඳපොළ තුළ තරඟකාරීත්වයක් ඇති කිරීමට හා එම වාසිය පාරිභෝගිකයාට ලබා දීමට කටයුතු කර ඇත.

පසුභාග ඉන්ධන කර්මාන්තය නියාමනය කිරීම සඳහා මේවන විට නීතිරීති හා රෙගුලාසි පද්ධතියක් සකස් කරමින් පවතින අතර එම ක්ෂේත්‍ර සුපරීක්ෂණය හා අධීක්ෂණ කටයුතු නිරන්තරව සිදු කිරීම මඟින් ඉන්ධන වල ගුණාත්මකභාවය හා විශ්වාසනීයත්වය තහවුරු කිරීමට මෙන්ම රටතුළ ඉන්ධන සුරක්ෂිතතාවය තහවුරු කර ඉන්ධන බෙදාහැරීම ක්‍රමවත් සහ කාර්යක්ෂම බවට පත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

ත්‍රිකුණාමලය තෙල් ටැංකි පද්ධතිය නැවත සක්‍රීය කොට ජාතික ආර්ථිකයට එක් කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් ක්‍රියාවට නංවා ඇත. ඒ අනුව, තෙල් ටැංකි සංකීර්ණයේ ටැංකි 12 ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ද ටැංකි 10 ක් ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගම විසින් ද සංවර්ධනය කිරීමට කටයුතු කරමින් පවතී.

උතුරු පළාත තුළ හරිත හයිඩ්‍රජන් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ මූලික කටයුතු සිදු කරන අතර ඒ සම්බන්ධ ශක්‍යතා අධ්‍යයනයක් සහ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම, පෙරහාග ඛනිජ තෙල් කර්මාන්තයට අදාල රෙගුලාසි සකස් කර ක්‍රියාවට නැංවීම යන කාර්යයන් ද සිදු කරමින් පවතී. පැවති ඉන්ධන අර්බුදය මධ්‍යයේ ආරම්භ කරනු ලැබූ කෘෂිකාර්මික කටයුතු සඳහා ඉන්ධන (ඩීසල්) ලබා දීමේ කටයුතු ද ධීවර කර්මාන්තය සඳහා ඉන්ධන ලබා දීමේ කටයුතු ද වසරේ මුල්භාගය තුළ සාර්ථකව ක්‍රියාවට නංවන ලදී.

බලශක්ති අර්බුදය මඟින් සමස්ත ලෝකයම අභියෝගයට ලක්කර ඇති අවධියක ඊට සෘජුව මුහුණ දෙමින් ශ්‍රී ලාංකික ජනතාව වෙතට විදුලිය හා බලශක්තිය අඛණ්ඩව සපයාදීමේ ක්‍රියාවලියේ දී මෙම අමාත්‍යාංශය විසින් ලබා ගන්නා ලද ජයග්‍රහණයන් සහ 2023 වසරේ සැප්තැම්බර් මාසය දක්වා ප්‍රගතිය මෙතැන් සිට ඉදිරිපත් කරනු ලැබේ.

# පළමුවන පරිච්ඡේදය

# විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

## 1.1 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

### දැක්ම

"ශ්‍රී ලංකාව ආසියාවේ බලශක්ති කේන්ද්‍රය බවට පත් කිරීම"

### විදුලිබල අංශය - මෙහෙවර

"ජාතික ආර්ථික සෞභාග්‍ය උදෙසා ඇවැසි ගුණාත්මක, විශ්වසනීය, තිරසර හා මිල දැරිය හැකි විදුලිබල සැපයුමක් සහතික කිරීම"

### බලශක්ති අංශය - මෙහෙවර

"ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි, අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කරමින් ඉන්ධන ආනයනය කළමනාකරණය හා දේශීයව නව බලශක්ති ප්‍රභවයන් බලශක්ති මිශ්‍රණයට එකතු කිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව බලශක්ති විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය මඟින් පරිසර හිතකාමී තිරසර බලශක්ති සැපයුමක් තහවුරු කිරීම"

### අරමුණු

- වසර 2030 වනවිට මෙරට විදුලි ජනනයෙන් 70% ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් සපයා ගැනීම
- පුනර්ජනනීය බලශක්තියේ උපරිම සංවර්ධනය සමඟින් 2025 වන විට රටේ විදුලි ජනන ධාරිතාව දැනට පවතින මෙගා වොට් 4,991 සිට මෙගා වොට් 7,629 දක්වා වැඩි කිරීම
- සම්ප්‍රේෂණ ජාලය වැඩිදියුණු කිරීම;
  - ◊ 2025 වන විට කිලෝ වොට් 220 ජාලය කිලෝ මීටර 799 සිට කිලෝ මීටර 1,300 දක්වා
  - ◊ 2025 වන විට කිලෝ වොට් 132 ජාලය කිලෝ මීටර 2,361 සිට කිලෝ මීටර 3,000 දක්වා
- ගුණාත්මක සේවාවක් සැපයීමට සහ සමස්ත ගෘහස්ථ විදුලි ඉල්ලුම සපුරා ගැනීමට හැකිවන පරිදි බෙදාහැරීමේ ජාලය වැඩිදියුණු කිරීම
- 2025 වනවිට පද්ධතියේ තාක්ෂණික හා වාණිජමය පාඩු 9% සිට 8% දක්වා අඩු කිරීම
- දේශීයව විදුලි උපකරණ නිෂ්පාදනය දිරිමත් කිරීම මඟින් රටේ විදුලිබල පද්ධතිය සුහුරු ජාලය (Smart Grid) බවට පරිවර්තනය කිරීම
- ඉන්ධන සැපයුම් දාමයෙහි ගුණාත්මක බව හා විශ්වසනීයත්වය තහවුරු කිරීම
- කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන භාවිතාව ප්‍රවර්ධනය කිරීම
- ආරක්ෂිත හා වඩාත් කාර්යක්ෂමව ඉන්ධන ගබඩා පහසුකම් තහවුරු කිරීම හා රට පුරා ඉන්ධන බෙදාහැරීම තහවුරු කිරීම
- වසර 2030 වනවිට දේශීය ඛනිජ තෙල් සහ ස්වභාවික වායු නිෂ්පාදනය ප්‍රශස්ත කිරීම මඟින් ශ්‍රී ලංකාවේ බලශක්ති ස්වයංපෝෂිත භාවයේ හවුල්කරුවකු වීම
- විදුලි පරිභෝජනයේ කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා නවීන ප්‍රමිතිගත විදුලි උපකරණ භාවිතය හා හරිත ගොඩනැගිලි සංකල්පය ක්‍රියාත්මක කිරීම
- වසර 2050 දී කාබන් විමෝචනය ශූන්‍ය කළ රටක් බවට ශ්‍රී ලංකාව පත්කිරීම සඳහා ප්‍රමුඛ දායකයකු බවට පත්වීම

### 1.2 අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය පහත සදහන් අංශ වලින් සමන්විත වේ.

- ආයතන හා පරිපාලන අංශය
- සංවර්ධන අංශය
- ප්‍රතිපත්ති තාක්ෂණික හා පර්යේෂණ අංශය
- විදුලි උත්පාදන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් අංශය
- සැලසුම් අංශය
- ප්‍රසම්පාදන අංශය
- මූල්‍ය අංශය
- අභ්‍යන්තර විගණන අංශය

### 1.3 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

- ලංකා විදුලිබල මණ්ඩලය
- සී/ස. ලංකා විදුලි පුද්ගලික සමාගම
- සී/ස. එල්ටීඑල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
- සී/ස. ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම
- සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
- ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම
- ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය
- ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගම

## 1.4 අමාත්‍යාංශය මුහුණ දුන් අභියෝග සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ එහි ප්‍රතිඵල

### විදුලිබල අංශය:

| අභියෝග | ගනු ලැබූ ක්‍රියාමාර්ග | ප්‍රතිඵල |
|---|---|---|
| • ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය අස්ථාවර භාවය සහ අලාභ ලැබීම | • ආයතනික ප්‍රතිසංස්කරණය හඳුන්වා දීමට කටයුතු කිරීම<br>• නව විදුලිබල පනත හඳුන්වා දීම<br>• විදුලිබල අංශ ප්‍රතිසංස්කරණය කාර්යාලය පිහිටු වීම<br>• විදුලි බිල සංශෝධනය | • වෙළඳපොළ තරඟකාරීත්වය ඇති වීම<br>• සේවා නැඹුරුව වැඩි වීම |
| • විදුලි නිෂ්පාදනය සඳහා නිසි වේලාවට ගල් අඟුරු සහ ඉන්ධන සැපයීමට අපොහොසත් වීම | • බැංකු පද්ධතිය හරහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කිරීම.<br>• ප්‍රසම්ප්‍රාදන ක්‍රියා මාර්ග කාර්යක්ෂම කිරීම | • කප්පාදුවකින් තොරව විදුලිය ලබා දීම |
| • අපේක්ෂිත ජල විදුලි උත්පාදන ඉලක්ක සපුරාලිය නොහැකි වීම | • කුඩා හා මධ්‍යම පරිමානයේ ජලවිදුලි බලාගාර ඇතිකිරීම<br>• සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය විදුලි උත්පාදන ව්‍යාපෘති දිරිමත් කිරීම<br>• පෞද්ගලික අංශයේ ආයෝජන වැඩි කිරීමට දිරි ගැන්වීම | • විදුලි උත්පාදන මිශ්‍රණයේ පුනර්ජනනීය විදුලි උත්පාදන ධාරිතාවය වැඩි වීම |
| • දිගු කාලීන ජනන සැලැස්ම, සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් කාර්යක්ෂම කිරීම ආදී සැලසුම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම | • විදේශ ණය ආධාර හා සෘජු විදේශ ආයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම<br>• අන්තර් දේශසීමා සම්ප්‍රේෂණ සම්බන්ධතා මගින් කලාපීය බලශක්ති වෙළඳ පොළට පිවිසීම<br>• න්‍යෂ්ටික බලය වැනි විකල්ප බලශක්ති පිළිබඳ අධ්‍යයනය කිරීම | • අනාගත විදුලි ඉල්ලුමට සරිලන සැපයුමක් ලැබීම |
| • අකාර්යක්ෂම ක්‍රමවේද නිසා ඇරිය යුතු අනවශ්‍ය වියදම් | • මාර්ගගත ක්‍රමවේද සහ කෙටි පණිවිඩ මගින් විදුලි බිල්පත් ලබා දීම<br>• සුහුරු මනු හඳුන්වා දීම | • පාරිභෝගික සංතෘප්තිය හා පහසුව<br>• ආදායම වැඩිවීම |

## බලශක්ති අංශය:

| අභියෝග | ගනු ලැබූ ක්‍රියාමාර්ග | ප්‍රතිඵල |
|---|---|---|
| • ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය අස්ථාවර බව, ණය බර ඉහළ යාම සහ අලාභ ලැබීම<br>• ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ද්‍රවශීලතා අර්බුදයකට මුහුණ දීම | • ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිල යාන්ත්‍රණයක් හඳුන්වා දීම<br>• ඉන්ධන මිල සූත්‍රයට අනුව ඉන්ධන මිල කාලීනව සංශෝධනය කිරීම<br>• ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ විදේශ විනිමයෙන් නාමකරණය කරන ලද ණය මහා භාණ්ඩාගාරය වෙත මාරු කිරීම | • ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉන්ධන අලවියෙන් ලාභ ලබන තත්ත්වයට පත්වීම<br>• ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ද්‍රවශීලතාවය ඉහළ යාම<br>• ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය ප්‍රමාණය පහළ යාම තුළින් සංස්ථාවේ ණය බර ලිහිල්වීම |
| • ඉන්ධන ආනයනය සඳහා විදේශ<br>• විනිමය සපයා ගැනීම දුෂ්කර වීම හා ණයවර ලිපි විවෘත කිරීමට නොහැකි වීම<br>• ඉන්ධන සැපයුම්කරුවන් වෙත නියමිත පරිදි ගෙවීම් කිරීමට අපොහොසත් වීම | • ඉන්ධන ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් සම්පාදනය කිරීම<br>• ඉන්ධන ආනයනය සඳහා අරමුදල් ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ ලබා ගැනීම<br>• ඉන්ධන සැපයුම්කරුවන් වෙත ගෙවීම් කිරීම සඳහා නව ගෙවීම් ක්‍රම හඳුන්වා දීම | • ඉන්ධන සැපයුම් ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රමවත් අයුරින් සිදුවීම<br>• නැව් තොග වරායට පිවිසි විගස ගොඩබෑමට හැකිවීමෙන් නැව් පමා කුලී ගාස්තු ඇති නොවීම<br>• භාවිතා කරනු ලබන ඛනිජ තෙල් ප්‍රමාණය අනුව ගෙවීම් කළ යුතු බැවින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ඇති කරන මූල්‍ය පීඩනය අවම වීම<br>• ප්‍රමාණවත් ආරක්ෂිත ඉන්ධන තොග දේශීය ගබඩා තුළ පැවතීම |
| • රට තුළ ඉන්ධන තොග අවසන් වීමෙන් හා දේශීය ඉල්ලුම සපුරාලීමට අපොහොසත් වීමෙන් දේශීය ඉන්ධන අර්බුදයකට මුහුණ පෑම | • ජාතික ඉන්ධන අවසර පත්‍ර ක්‍රමය හඳුන්වා දීම මඟින් සෑම වාහනයකටම සතිපතා ඉන්ධන කෝටාවක් සහතික කිරීම<br>• සංචාරක ඉන්ධන පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමය හඳුන්වා දීම<br>• කෘෂිකාර්මික හා ධීවර කටයුතු සඳහා නම් කරන ලද ඉන්ධන පිරවුම්හල් මඟින් ඉන්ධන ලබා දීම<br>• මගී ප්‍රවාහන බස් රථ සඳහා ජාතික ඉන්ධන බලපත්‍රය පදනම් කර ගනිමින් ඉන්ධන ලබා දීම මඟින් පූර්ණ ඉන්ධන අවශ්‍යතාවය සපුරාලීම. | CPSTL සමාගම සතුව පැවති සීමිත ඉන්ධන තොග ක්‍රමානුකූලව බෙදාහැරීමට හැකිවීම<br>අත්‍යාවශ්‍ය සේවා සඳහා හිඟකින් තොරව ඉන්ධන ලබා දීමට හැකිවීම<br>ඉන්ධන ඉල්ලුම කළමනාකරණය කිරීම තුළින් ඉන්ධන සැපයුම පාලනය කිරීමට හැකිවීම |
| • ඛනිජ තෙල් ක්ෂේත්‍රයට නව ආයෝජකයන් ප්‍රවිෂ්ඨ වීමට මැලිකමක් දැක්වීම | • ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, බෙදාහැරීම සහ විකිණීම සඳහා ශක්‍යතාවයෙන් යුතු නව ව්‍යාපාර ආකෘතීන් ස්ථාපිත කිරීම<br>• ආයෝජකයන්ට දේශීය වෙළඳපොළට පිවිසීමට හැකි වන | • ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, බෙදාහැරීම සහ විකිණීම සඳහා ආයෝජකයන් දේශීය වෙළඳපොළට පිවිසීම |

## 1.5 2023 වර්ෂය තුළ විදුලිබල අංශයේ කාර්යසාධනය

### 1.5.1 හැඳින්වීම

මුළු ලෝකයම බලශක්ති සංක්‍රාන්තියක පවතී. ලෝකය සමග එක්ව, අපගේ විදුලි ජනනය හා සම්බන්ධ ක්‍රමවේද සකස් කර ගැනීමට අප සැවොම සූදානම් විය යුතුය. විදුලිබල මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ අදාළ ආයතන/සමාගම් පිහිටුවීම සඳහා අත්‍යාවශ්‍ය විදුලිබල අංශයේ ආයතනික ප්‍රතිසංස්කරණ සමඟ නව විදුලි පනත හඳුන්වාදීමට අමාත්‍යාංශය කටයුතු කර ඇත. පවතින උපයෝගිතා සැලකිල්ලට ගනිමින් විදුලිබල කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමට අමාත්‍යාංශය මූලිකත්වය ගෙන ඇති අතර එමඟින් රටේ විදුලිබල ක්ෂේත්‍රය වඩාත් තරගකාරීවීමට සහ සේවා නැඹුරුවක් ඇති කිරීමට පහසුකම් සැලසේ. විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ කාර්යාලය දැනටමත් පිහිටුවා ඇති අතර ක්‍රියාකාරී කණ්ඩායම් 10 ක් පත් කර ඇත. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජයිකා ආයතනය හා ජාත්‍යාන්තර සංවර්ධනය සඳහා වූ එ.ජ. නියෝජිත ආයතනය වැනි අරමුදල් සපයන ආයතන විදුලිබල මණ්ඩලයේ දැනට සිටින කාර්ය මණ්ඩලය ස්ථාන ගත කිරීම සඳහා මානව සම්පත් සැලැස්ම ද, වත්කම, වගකීම් සහ මානව සම්පත් ගොනු කිරීමේ සැලැස්ම ද සකස් කිරීම සඳහා පහසුකම් සහ විශේෂඥ දැනුම සැපයීමට සහය වේ.

2022 වසරේදී බලපැවැත්වූ ජල විදුලි බලාගාර ආශ්‍රිත ජල ධාරිතාවය අඩුවීම හා මූල්‍ය අර්බුදය හේතුවෙන් නිසි වේලාවට ඉන්ධන හා ගල් අඟුරු සැපයීමට අපොහොසත් වීම නිසා විදුලිය කප්පාදු කිරීමට සිදුවිය. ලෝක වෙළඳපොළේ ඛනිජ තෙල් හා ගල් අඟුරු මිල ඉහලයාම, ටෙන්ඩර සඳහා සැපයුම්කරුවන් ඉදිරිපත් නොවීම, රුපියලේ අගය අවප්‍රමානය වීම හා ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය හිඟය ආදී කරුණු ගණනාවක සෘණාත්මක බලපෑම මීට හේතු විය. එහෙත් 2023 වර්ෂය තුළදී අනුගමනය කරන ලද ක්‍රමවේද මඟින් නොරොච්චෝල ගල් අඟුරු බලාගාරය සඳහා අඛණ්ඩව ගල් අඟුරු සැපයීමට අවශ්‍ය මුදල් හා ණය පහසුකම් සපයාගන්නා ලද අතර අනෙකුත් බලාගාර හා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලද දායකත්වයෙන් කප්පාදුවකින් තොරව විදුලිය ලබාදීමට හැකිවිය.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරණු ලබන පිරිවැය ගැලපීම මඟින් විදුලි ගාස්තු සංශෝධනය කරන ලද අතර වසරකට දෙවරක් විදුලි ගාස්තු සංශෝධනය සඳහා ඉඩ ලැබුණි. ණය බර අඩුකර ගනිමින් ඛනිජ තෙල් සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නිසි වේලාවට ගෙවීම් සිදුකිරීමට හැකිවූ අතර විදුලි උත්පාදනය, සම්ප්‍රේශනය හා බෙදා හැරීම සංවර්ධනය සඳහා වන ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ, කුඩා පරිමාණ ජල, සුළං, භූමිය මත සවි කරන ලද සූර්ය, පාවෙන සූර්ය, ජෛව ස්කන්ධ (දව සහ කෘෂි අපද්‍රව්‍ය) සහ කාර්මික අපද්‍රව්‍ය බලාගාර මඟින් ජනනය කරනු ලබන, ලංකා විදුලිබල මණ්ඩලයට විදුලිය ලබාදෙන සංවර්ධකයින්ට ගෙවන මිලට නව විචල්‍යයන් සහිත ක්‍රමයක් 2023.06.26 දින සිට හඳුන්වා දී ඇත. 2023.06.26 සිට බලපැවැත්වෙන පරිදි ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ සූර්ය පැනල මඟින් ජනනය කරන විදුලිය සඳහා ගෙවන මිල, නව විචල්‍ය අනුපාත ක්‍රමය යටතේ රු.46.46 - 48.89 පරාසය පරිදි සංශෝධනය කර ඇත.

අද වන විට බලශක්ති සුරක්ෂිතතාව ජාතික ආර්ථිකයේ අනිවාර්ය අංගයක් බවට පත්ව ඇත. කෙසේ වෙතත්, වර්ෂාපතනය මත වෙනස්වන හා ඉල්ලුමෙන් 30% ක් පමණ වූ ඉන්ධන තෙල් මඟින් විදුලි උත්පාදනය සඳහා වන පිරිවැය, තෙල් මිල වැඩිවීමත් සමග විශාල බරක් වී ඇති අතර එය පසුගිය කාලයේ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් වඩාත් උග්‍ර විය. තවද, පද්ධතියට ස්වභාවික දව වායු (LNG) බලාගාර එකතු කිරීම 2024 දී සිදු කිරීමට නියමිතය. එහෙයින්, පිරිවැය ඵලදායී විදුලි නිෂ්පාදනය සමග ඉල්ලුම් පරතරය සපුරාලීම දැවැන්ත අභියෝගයක් බවට පත්ව ඇත. මෙම සන්දර්භය තුළ යෝජිත අන්තර් දේශ සීමා සම්ප්‍රේෂණ සම්බන්ධතාව මඟින් කලාපීය බලශක්ති වෙළෙඳපොළට පිවිසීමෙන් ඉල්ලුමේ පරතරය පියවා ගැනීමට හැකිවනු ඇතැයි රජයේ අදහසයි.

අනාගත න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ජාත්‍යන්තර න්‍යෂ්ටික බලශක්ති නීතිමය තත්ත්වය, ප්‍රමිති සහ මාර්ගෝපදේශ යනාදිය

හා ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික නීතිමය තත්ත්වයන් අතර පරතරය විශ්ලේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාව ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAEA) නීති කටයුතු පිළිබඳ කාර්යාලයෙන් (OLA) සහාය ඉල්ලා ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) විසින් ව්‍යාපෘති අනුමැතිය සඳහා මාර්ගගත පද්ධතියක් සංවර්ධනය කිරීම අවසන්කර ඇති අතර පූර්ව පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී. එසේම, මාර්ගගත ක්‍රමයට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සූර්ය බලශක්ති සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම අවසන් කර ඇති අතර අත්හදා බැලීම් සහ පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) මඟින් විදුලි බිල්පත් සඳහා E - බිල්පත් පද්ධතිය සහ E - යෙදුම් පද්ධතිය නිමවා ඇත. ඉලක්කගත පාරිභෝගිකයින් 50,000 න් 20,082 ක් පමණ පිරිසක් විද්‍යුත් බිල්පත් සඳහා ලියාපදිංචි වී ඇත. මුළු පාරිභෝගික පදනමෙන් 98%ක් කෙටි පණිවිඩ (SMS) බිල්පත් සඳහා ලියාපදිංචි වී ඇති අතර මෙම සියලු පාරිභෝගිකයින්ට සපයා ඇති සබැඳිය (link) සමඟ විද්‍යුත් බිල්පතක් ලෙස මාසික බිල්පත ලබා ගැනීමේ අවස්ථාව ඇත. ඉතිරි පාරිභෝගිකයින්ට ලංකා විදුලි පුද්ගලික සමාගමේ වෙබ් අඩවිය හරහා ඔවුන්ගේ විද්‍යුත් බිල්පත බාගත කළ හැකි අතර මුද්‍රිත බිල්පත් ලබා දීම සිදු නොකෙරේ.

ශ්‍රී ලංකාවට සුහුරු මනු (ස්මාර්ට් මීටර්) හඳුන්වාදීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම කටයුතු කර ඇත. ලංකා විදුලි පුද්ගලික සමාගම මඟින් මනු 22,000 ක් සවි කර ඇත. විදුලිබල මණ්ඩලය විසින් ස්මාර්ට් මීටර් 50,000 ක් සවි කිරීම සඳහා කොන්ත්‍රාතුවක් ප්‍රදානය කරන ලද අතර, දෙහිවල ප්‍රදේශයේ SCADA පද්ධතිය ඉදිකිරීම සඳහා ද කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලදී. ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් විශ්වාසනීය සැපයුම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලි නියමු ව්‍යාපෘතිය 50% කින් හා WSO2 IoT සහ API වේදිකා භාවිතයෙන් SCADA වේදිකා සංවර්ධනය 100% ක් සම්පූර්ණ කර ඇත.

## 1.5.2 විදුලිබල ක්ෂේත්‍රයේ සම්පිණ්ඩනයක්

සමස්ත විදුලි පාරිභෝගික සංඛ්‍යාව 2023 - 7,596,894
(ලං.වි.ම - 7,000,635 + ලං.වි.පු.ස - 596,259)

| | | පාරිභෝගික සංඛ්‍යාව |
|---|---|---|
| ◊ ගෘහස්ථ | - | 6,509,953 |
| ◊ ආගමික ස්ථාන | - | 46,207 |
| ◊ කර්මාන්ත | - | 72,892 |
| ◊ පොදු අවශ්‍යතා | - | 948,370 |
| ◊ හෝටල් | - | 657 |
| ◊ රාජ්‍ය ආයතන | - | 9,727 |
| ◊ කෘෂි කාර්මික කටයුතු | - | 3,296 |
| ◊ විදී ආලෝකකරණය | - | 5,792 |

- 2023 ජනවාරි සිට අගෝස්තු දක්වා විදුලි ඉල්ලුම - 11%
  (පසුගිය වර්ෂයේ සමාලෝචිත කාල සීමාවට සාපේක්ෂව)
- 2023 වසරේ දළ විදුලි ජනනය
  - මෙගාවොට් පැය 10,341
  (අගෝස්තු මස අවසානය දක්වා)
- විදුලිබල උත්පාදනය

| | |
|---|---|
| ◊ ජල විදුලි (වි.බ.ම.) | 22% |
| ◊ කුඩා ජල විදුලි (පෞ.නි.) | 6% |
| ◊ තාප (වි.බ.ම.) | 16% |
| ◊ තාප (පෞ. නි.) | 10% |
| ◊ ගල් අගුරු (වි.බ.ම.) | 35% |
| ◊ සුළං (වි.බ.ම.) | 3% |
| ◊ සුළං (පෞ.නි.) | 2% |
| ◊ පියැසි මත සූර්ය පැනල | 4% |
| ◊ භූමියමත සූර්ය පැනල | 1% |
| ◊ සම්ප්‍රදායික නොවන වෙනත් | 1% |

### ප්‍රස්ථාර 1.1 - සවිස්තරාත්මක විදුලි ජනන මිශ්‍රණය (2023 ජනවාරි සිට අගෝස්තු අවසානය දක්වා)




මුලාශ්‍රය – 2023 ප්‍රගති වාර්තාවේ ලං.වි.ම ප්‍රකාශනය

- ස්ථාපිත විදුලි ධාරිතාවය - මෙගාවොට් 4991 - (2023 අගෝස්තු අවසානය දක්වා)

### වගුව 1.1 උත්පාදන මුලාශ්‍රය අනුව ස්ථාපිත විදුලි ධාරිතාවය

| | බලශක්ති මුලාශ්‍රය | | ධාරිතාවය (මෙ.වො) | බලාගාර සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | තාප | ඉන්ධන තෙල් (ල.වි.ම) | 654 | 9 |
| 2 | | ඉන්ධන තෙල් (IPP) | 270 | 1 |
| 3 | | ගල් අඟුරු | 900 | 1 |
| 4 | පුනර්ජනනීය බලශක්ති | ප්‍රධාන ජල විදුලි | 1,538 | 19 |
| 5 | | කුඩා ජල විදුලි | 434 | 211 |
| 6 | | සුළං | 265 | 18 |
| 7 | | භූමියමත ස්ථාපිත සූර්ය පැනල | 140 | 86 |
| 8 | | පියසි මත සූර්ය පැනල | 742 | - |
| 9 | | වෙනත් | 48 | 14 |
| | මුළු ධාරිතාවය | | **4,991** | **359** |

මුලාශ්‍රය - ලං.වි.ම Statistical Digest 2022 ප්‍රකාශනය / 2023 ප්‍රගති වාර්තාවේ ලං.වි.ම ප්‍රකාශනය

**ප්‍රස්ථාර 1.2 – ස්ථාපිත විදුලි නිෂ්පාදන ධාරිතාව (%) – 2023**




මූලාශ්‍රය - ලං.වි.ම Statistical Digest 2022 ප්‍රකාශනය / 2023 ප්‍රගති වාර්තාවේ ලං.වි.ම ප්‍රකාශනය

- **පුනර්ජනනීය බලශක්ති ධාරිතා සංවර්ධන ඉලක්ක**

වර්ෂ 2030 වන විට සමස්ථ විදුලි අවශ්‍යතාවයෙන් (මෙගාවොට් 12,547ක්) පුනර්ජනනීය ප්‍රභව වලින් ලබා ගැනීම සඳහා මෙගාවොට් 8,783ක ධාරිතාවයක් වර්ධනය කර ගත යුතු අතර එම වාර්ෂික ඉලක්කය පහත පරිදි වේ.

**ප්‍රස්ථාර 1.3 – පුනර්ජනනීය විදුලිබල උත්පාදනය**




මූලාශ්‍රය - 2023 ප්‍රගති වාර්තාවේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ප්‍රකාශනය

### 1.5.3 විදුලිබල අංශයේ ප්‍රගතිය - 2023 (ජනවාරි - සැප්තැම්බර්)

පසුගිය වසර පහළොව තුළ රටේ විදුලි ඉල්ලුම වාර්ෂිකව 4.2% ක සාමාන්‍ය වේගයකින් වර්ධනය වී ඇති අතර, උපරිම ඉල්ලුම වාර්ෂිකව 2.7% ක වේගයකින් වර්ධනය වී ඇත. 2022 වර්ෂයේ ශුද්ධ ජනනය ගිගාවොට් පැය 15,942ක් ලෙස වාර්තා විය. 2021 හා සැසඳූ විට එය 4.6%ක අඩුවීමකි. මේ අතර, 2022 වසරේ උපරිම ඉල්ලුම මෙගාවොට් 2,708ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 3.3%ක අඩුවීමකි. 2023 වසරේ අවසන් මාස අට සඳහා වාර්තා වූ ශුද්ධ උත්පාදනය සහ උපරිම ඉල්ලුම පිළිවෙලින් ගිගාවොට් පැය 10,341ක් සහ මෙගාවොට් 2,415ක් වූ අතර, මෙය පෙර වසරට සාපේක්ෂව 5%ක සහ 11% ක අඩුවීමක් විය.

#### (අ) විදුලි උත්පාදනය පුළුල් කිරීම්

2023 අගෝස්තු 31 වන විට, ප්‍රධාන ජල විදුලි උත්පාදනය මුළු ප්‍රමාණයෙන් 22%ක් හා ගල් අඟුරු බලශක්ති උත්පාදනය 35%ක් නියෝජනය කරමින් මුළු බලශක්ති උත්පාදනය ගිගාවොට් පැය 10,341ක් දක්වා ළඟා වී තිබුණි. සමස්ත බලශක්ති මිශ්‍රණයට තාප තෙල් 26%කින් දායක වී ඇති අතර අනෙකුත් පුනර්ජනනීය ප්‍රභවයන් 18% කින් සමන්විත වේ. 2022 එම කාලසීමාව සඳහා ප්‍රධාන ජල විදුලි උත්පාදනයේ කොටස 29%ක් ලෙස තරමක් වැඩි වී තිබුණි.

වර්ධනය වන විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා, අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රතිපත්ති සහ ලංකා විදුලිබල මණ්ඩලයේ දිගුකාලීන ජනන ව්‍යාප්ති සැලැස්මට අනුව විදුලි ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් විදුලි ජනන ව්‍යාපෘති විවිධ ක්‍රියාත්මක කිරීමේ අදියරවල පවතී.

#### I. පුනර්ජනනීය බලශක්ති උත්පාදනය

##### i. ප්‍රධාන ජල විදුලි

- **උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය - මෙගාවොට් 120**

හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්කවල හෙක්ටයාර 5,000 කට ආසන්න භූමි ප්‍රමාණයකට වාරිමාර්ග පහසුකම් සැලසීම සඳහා ජලය හරවා යවනු ලබන උමා ඔය ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියකි. ජල විදුලි උත්පාදනය මේ යටතේ ඇති එක් අංගයකි.

ඒ යටතේ ඉදිවන විදුලි බලාගාරයේ සහ සම්ප්‍රේෂණ මාර්ගයේ ඉදිකිරීම් බොහෝ දුරට අවසන් වී ඇති අතර ජනනය සඳහා වන පූර්ව පරීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතී. මෙම බලාගාරය මෙම වසර අවසානයේ දී ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කරනු ලබන අතර, වාර්ෂිකව ගිගා වොට් පැය 290 ක විදුලිය ජනනය කරනු ඇත. ඩයරබා වේල්ලේ වැඩ අවසන්කර ජලාශය පිරවීම අවසන් කර ඇත. උමං මාර්ගය බොහෝ දුරට අවසන් කර ඇති අතර බලාගාරයට ජලය මුදා හැරීම සඳහා තෙවන පාර්ශවීය පරීක්ෂණයක් පැවැත්වේ. සමස්ත භෞතික ප්‍රගතිය 99% ක් වේ. ව්‍යාපෘතියේ සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 530 කි.



ඩයරබා වේල්ල

- **මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය - මෙගාවොට් 31**

මොරගොල්ල යනු මහවැලි ගංගා ද්‍රෝණියේ ඉදිකරන ලද අවසන් ජල විදුලි ව්‍යාපෘතියයි. මෙම ව්‍යාපෘතිය මහනුවර දිස්ත්‍රික්කයේ උළපනේ ප්‍රදේශයේ පිහිටා ඇත. ව්‍යාපෘතියේ අපේක්ෂිත වාර්ෂික බලශක්ති උත්පාදනය ගිගා වොට් පැය 100 කි.

වේල්ල ඉදිකිරීම, උමං කැණීම, බලාගාරය ඉදිකිරීම සහ බලාගාර පිරිසැකසීම සිදුකරමින් පවතී. සමස්ත ප්‍රගතිය 59% කි. 2024 දෙසැම්බර් වන විට ව්‍යාපෘතිය අවසන් කර විදුලිය උත්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 114 කි.



විදුලි බලාගාරයේ සර්පිලාකාර ආවරණය ස්ථාපනය

ii. කුඩා ජල විදුලි

- **සීතාවක ජල විදුලි බලාගාරය**

සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම විසින් ඉදිකෙරෙන මෙගාවොට් 7 බැගින් වූ කුඩා ජල විදුලි බලාගාර දෙකක් ස්ථාපිත කිරීමට නියමිතය. අපේක්ෂිත වාර්ෂික බලශක්ති උත්පාදනය ගිගාවොට් පැය 40 ක් වන අතර 2024 දී බලගැන්වීමට අපේක්ෂා කෙරේ.

## II. අනෙකුත් පුනර්ජනනීය බලශක්ති

2023 වර්ෂය තුළ භූමිය මත සවිකළ සූර්ය (මෙගාවොට් 7), සුළං (මෙගාවොට් 15), කුඩා ජල විදුලි (මෙගාවොට් 5.4) සහ කෘෂි අපද්‍රව්‍ය ජෛව ස්කන්ධ (මෙගාවොට් 4) ආදී ක්‍රමවේද හරහා මෙගාවොට් 31.4 ක් පද්ධතියට එක් කරන ලදී. මෙගාවොට් 82.03 ක ධාරිතාවයකින් යුත් සූර්ය පියසි 3,943 ක් සවි කර ඇත. පහත සඳහන් ප්‍රධාන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල මූලික කටයුතු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ ලංකා විදුලිබල මණ්ඩලය සමඟ එක්ව සිදු කරනු ලබයි.

i. සූර්යබල ව්‍යාපෘති

- **මෙගාවොට් 100 සියඹලාණ්ඩුව සූර්ය බල උද්‍යානය**

සියඹලාණ්ඩුව ප්‍රදේශයේ මෙගාවොට් 100 ක සූර්ය බල උද්‍යානයක් සහ ඒ ආශ්‍රිත සම්ප්‍රේෂණ මාර්ගයක් පිහිටුවීමේ අරමුණින් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය කෘෂිකර්මාන්තයට හෝ වෙනත් ආර්ථික සංවර්ධන කටයුතුවලට නුසුදුසු මුඩු බිම් සූර්ය බලශක්තිය නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇත. සංවර්ධකයින් තිදෙනෙකු ඒකාබද්ධ කර විශේෂ කාර්ය ඒකකයක් (SPV) පිහිටුවීම අවසන් කර ඇති අතර ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට මූලික පියවර ගෙන ඇත. මෙම සූර්ය බල උද්‍යානය 2025 දී බලගැන්වීමට අපේක්ෂා කෙරේ.

- **මෙගාවොට් 150 හම්බන්තොට සූර්ය බල ව්‍යාපෘතිය**

ඉදිකිරීම, අයිතිය දැරීම හා ක්‍රියාත්මක කිරිමේ පදනම මත (BOO) මෙගාවොට් 150 ක විදුලි උත්පාදනයක් ලබාගැනීමේ අරමුණින් මෙගාවොට් 5-10 Ac ධාරිතාවන්ගෙන් යුත් කුඩා ව්‍යාපෘති ඉදිකිරීමේ ටෙන්ඩරය යටතේ, සංවර්ධකයින් 19 දෙනෙකුගෙන් සමන්විත ඒකාබද්ධ සමාගමක් පිහිටුවන ලදී. උපපොළ සහ සම්ප්‍රේෂණ මාර්ග සංවර්ධනය ද මෙම ව්‍යාපෘතියට ඇතුළත් වේ. ආයෝජකයින්ට අභිලාෂ ප්‍රකාශ (EOI) කැඳවා බලශක්ති බලපත්‍ර ලබා දී තිබේ. සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු තෝරාගෙන ඇත. රැස් කිරීමේ උපපොළ ඉදිකිරීම සහ ජාල ධාරිතාව වැඩි කිරීම සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට නියමිතය. සම්ප්‍රේෂණ මාර්ගය සඳහා ඉඩම් ලබා ගැනීම සිදු වෙමින් පවතී.

- **මෙගාවොට් 700 පූනකරි වැව සූර්ය බල ව්‍යාපෘතිය**

United Solar Energy SL (Pvt) Company විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව ඇගයීමට ලක් කර කිලිනොච්චිය, පූනකරි වැවේ බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් සහිත සමස්ත ධාරිතාව මෙගාවොට් 700 ක සූර්ය බල විදුලි උත්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවසර ලබා දී ඇත. 100%ක සෘජු විදේශ ආයෝජනයක් ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 1727 ක සම්පූර්ණ ආයෝජනයකින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිතය. යෝජිත ව්‍යාපෘතියේ කොටසක් ලෙස මුහුදු ජලය ඇතුළුවීම වැළැක්වීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 13.5 ක වියදමින් පූනකරි වැව වටා අමුණු තුනක් ඉදිකිරීමට ව්‍යාපෘති යෝජක සමාගම යෝජනා කර තිබුණි.

උතුරු පළාත් සභාව, උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව මෙම විදුලි බලාගාරය පිහිටුවීම සඳහා වැවේ නොගැඹුරු ප්‍රදේශයෙන් අක්කර 1080ක් වසර 35ක බදු ගිවිසුමක් මත සමාගමට ලබාදීමට දැනටමත් එකඟ වී ඇත.

- **මෙගාවොට් 135 භූමිය මත ස්ථාපිත සාම්පූර් සූර්යබල ව්‍යාපෘතිය -**

මෙම ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක කෙරේ. (අදියර I- මෙ.වො.50 සහ අදියර II- මෙ.වො.85) IEE අධ්‍යයනය සහ සාම්පූර් සිට කප්පල්තුරෙයි දක්වා සම්ප්‍රේෂණ මාර්ගය සඳහා අනුමැතිය ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ AIIB මූල්‍යකරණය යටතේ ඉන්දියාවේ ජාතික තාප විදුලි සංස්ථාව (NTPC) සහ ලංකා විදුලි බල මණ්ඩලය (CEB) හි හවුල් ව්‍යාපාරයක් වන සීමාසහිත ත්‍රිකුණාමල බලශක්ති සමාගම (TPCL) විසිනි. මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො.මි. 170 කි.

- **මෙගාවොට් 100 ඔඩ්ඩමාවඩි සූර්ය බල ව්‍යාපෘතිය -**

සම්ප්‍රේෂණ මාර්ගයක් සමඟ මෙගාවොට් 100 ක සූර්ය බල විදුලි උත්පාදන ව්‍යාපෘතියක් ස්ථාපිත කෙරේ. යෝජනා සඳහා ඉල්ලීමක් (RFP) නිකුත් කර ඇති අතර කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සිදු වෙමින් පවතී.

**ii. සුළං බල ව්‍යාපෘති**

- **මෙගාවොට් 250 මන්නාරම් සුළං බල ව්‍යාපෘතිය**

යෝජිත ව්‍යාපෘතිය, "තම්බපවනි සුළං බල උද්‍යානයේ" 2 වන අදියර ලෙස නම්කර ඇති අතර වාර්ෂිකව ගිගාවොට් පැය 400 ක විදුලි ජනනයක් අපේක්ෂා කෙරේ. මෙගාවොට් 250ක සුළං බල විදුලි උත්පාදන ධාරිතාවක් ලබාගැනීම සඳහා Adani Green Energy (Pvt) Limited වෙත තාවකාලික අනුමැතිය ලබා දී ඇත. ශක්‍යතා අධ්‍යයනය අවසන් කර ඇති අතර පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) මධ්‍යම පරිසර අධිකාරිය විමර්ෂණය කරමින් පවතී. ඉඩම් ලබාගැනීම සිදු කරමින් පවතින අතර මෙම ව්‍යාපෘතිය 2025 දී බලගැන්වීමට නියමිතය.

මෙම ව්‍යාපෘතිය මන්නාරම් කලාපය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ආයෝජන ආකර්ෂණය කර ගැනීමට මෙන්ම වැඩි දියුණු කරන ලද විදුලි සැපයුම සහ වැඩි දියුණු කරන ලද මංමාවත් මගින් ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සහය වනු ඇත. ඊට අමතරව, රැකියා අවස්ථා නිර්මාණය කර ප්‍රදේශ වාසීන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමද අරමුණු කරයි.

- **මෙගාවොට් 234 පූනරීන් සුළං බල ව්‍යාපෘතිය (අදියර I සහ II)**

පූනරීන් අර්ධද්වීපයේ මෙගාවොට් 234 ක ධාරිතාවයකින් යුත් සුළං බල උද්‍යානයක් ඉදිකිරීමට යෝජනා වී ඇත. සුළං බල උද්‍යානය අදියර දෙකකින් එනම් අදියර I - මෙගාවොට් 100 සහ අදියර II - මෙගාවොට් 134 ලෙස ක්‍රියාත්මක කිරීමට Adani Green Energy (Pvt) Limited වෙත තාවකාලික අනුමැතිය ලබා දී ඇත. පූර්ව ශක්‍යතා අධ්‍යයනය අවසන් කර තිබේ. අදියර I, 2024 දී බලගැන්වීම සිදුකරනු ඇති අතර අදියර II, 2026 දී අවසන් කිරීමට සැලසුම්කර ඇත. ඉඩම් ලබා ගැනීම සිදු වෙමින් පවතී.

මෙම ව්‍යාපෘතියට සහ උතුරු පළාතේ අනෙකුත් විදුලි ජනන ව්‍යාපෘතිවල ජනනය කරනු ලබන විදුලිය රැස්කර හබරණ දක්වා ගෙනයාම සඳහා කිලෝවෝල්ට් 400 ක නව සම්ප්‍රේෂණ මාර්ගයක් ඉදිකිරීම ද මේ යටතේ සැලසුම් කර තිබෙන අතර යෝජනා සඳහා ඉල්ලීමක් (RFP) නිකුත් කරනු ඇත. මෙම ව්‍යාපෘතිය 2025 දී අවසන් කිරීමට නියමිතය.

- **මෙගාවොට් 210 වේරවිල් සුළං බල ව්‍යාපෘතිය**

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වේරවිල් ප්‍රදේශයේ මෙගාවොට් 210ක සුළං බල ව්‍යාපෘතියක් පිහිටුවීමට සැලසුම් කර ඇත. ස්ථාන තෝරා ගැනීම සහ ශක්‍යතා අධ්‍යයනය 2023 දී අවසන් කරන ලදී. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) ශ්‍රී ලංකා බලශක්ති වැඩ-සටහනේ සහාය ඇතිව පක්ෂී අධ්‍යයනය සිදු කෙරේ. උපදේශන සමාගමක් තෝරා ගැනීමෙන් පසු පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) සිදු කරනු ඇත.

- **උතුරේ දූපත් තුනක් සඳහා දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම**

මෙම ව්‍යාපෘතිය මගින් උතුරේ ඩෙල්ෆ්, අනලතිව් සහ නයනතිව් දූපත් තුන සඳහා සූර්ය, සුළං, ඩීසල් උත්පාදන සහ ලිතියම්-යකඩ බැටරි ගබඩා කිරීම සහිත දෙමුහුන් බලාගාර ඉදිකිරීම මගින් දූපත් තුනට විදුලිය සැපයීම අරමුණු කරයි. සැලසුම් කිරීම, සැපයීම සහ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම සිදු කෙරෙන අතර ව්‍යාපෘතිය 2024 දී අවසන් කරනු ඇත.

### III. තාප බලශක්ති උත්පාදනය

#### i. ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG)

- **කෙරවලපිටියේ පිහිටි මෙගාවොට් 300 LNG ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාර පහසුකම**

යෝජිත "සොබාදනවි" බලාගාරයේ මෙම මෙගාවොට් 300, LNG ඒකාබද්ධ චක්‍රීය බලාගාරයේ ඉදිකිරීම් කටයුතු මෑතකාලීන ආර්ථික අර්බුදයේ බලපෑම හේතුවෙන් ප්‍රමාද වී ඇත. ගෑස් ටර්බයිනය 2023 නොවැම්බරයේදී බලගැන්වීමට සූදානම් කර ඇත. වාෂ්ප ටර්බයිනය සකස් කිරීම සිදු වෙමින් පවතී. ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය 60%ක් පමණ වේ.

#### (ආ) විදුලිබල සම්ප්‍රේෂණය හා බෙදාහැරීම් සංවර්ධනය

- ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකස් කරන ලද "2018 - 2027 සඳහා මධ්‍ය වෝල්ටීයතා සංවර්ධන සැලැස්ම" යටතේ කෙරවලපිටිය ග්‍රිඩ් උපපොළේ සිට නුගපේ ගැන්ට්‍රිය දක්වා කිලෝවෝල්ට් 33 ද්විත්ව පරිපථ සීබ්‍රා කුළුණු මත විදුලි රැහැන් ඉදිකිරීමට කටයුතු යොදා ඇත. නුගපේ, බෝපිටිය සහ උස්වැටකෙයියාව ප්‍රදේශයේ පවතින මෙන්ම ඉදිරියේදී බිහිවන නව කර්මාන්ත සඳහා මෙගාවොට් 30කට වැඩි විදුලි ඉල්ලුමක් මෙමගින් සැපයීමට අපේක්ෂා කෙරේ.

- ලංකා විදුලිබල මණ්ඩලයේ දිගුකාලීන සම්ප්‍රේෂණ සැලැස්ම සකස් කර ඇති අතර අවශ්‍යව පවතින ජාල සංවර්ධන ව්‍යාපෘති හඳුනාගෙන තිබේ. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද පහත සම්ප්‍රේෂණ හා ජාල උපපොළ ව්‍යාපෘති 7 ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහ චීනයේ Tebian Electric Apparatus Company (TBEA සමාගම) අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

  i. අනුරාධපුර සිට හබරණ දක්වා කිලෝවෝල්ට් 220 නව සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය - කිලෝමීටර් 45
  ii. මාතර සිට හම්බන්තොට දක්වා සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය - කිලෝමීටර් 77
  iii. හෝමාගම කිලෝවෝල්ට් 132/33 ජාල උපපොළ ඉදිකිරීම.
  iv. මීගමුව කිලෝවෝල්ට් 132/33 ජාල උපපොළ ඉදිකිරීම
  v. මහනුවර නගර කිලොවෝල්ට් 132/11 ජාල උපපොළ ඉදිකිරීම.
  vi. වාරියපොළ කිලෝවෝල්ට් 132/33 ජාල උපපොළ හා 220/132 හුවමාරු පොළ (switch gear station) ඉදිකිරීම
  vii. කෙරවලපිටිය - කොළඹ (වරාය නගරය) කිලෝවෝල්ට් 220 - දෙවන භූගත රැහැන් (කේබල්) පද්ධතිය - කිලෝමීටර් 15

- ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ විදුලි අවශ්‍යතාවය සපුරාලීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පැවැති ආසියානු සංවර්ධන බැංකු ණය අංකඃ 3483 /3484-SRI දරණ හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩි දියුණුකිරීමේ ආයෝජන වැඩසටහන - අදියර 2 යටතේ පොල්පිටිය සිට හම්බන්තොට දක්වා කිලෝවෝල්ට් 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු අවසන් කර ජාතික පද්ධතියට එක් කරන ලදි.

#### (ඇ) විදුලිබල ක්ෂේත්‍රය සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ

- විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනික ප්‍රතිසංස්කරණ සිදුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුකමිටුවක් පත් කරන ලද අතර එම කමිටු වාර්තාව එළිදක්වා ඇත. වාර්තාව පිළියෙල කිරීමේදී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විදුලිබල විෂයභාරව

කලින් කටයුතු කල අමාත්‍යවරුන්, නියාමන ආයතන සහ මහජන උපයෝගිතා කොමිසන් සභාව, ලංකා විදුලිබල මණ්ඩලය හා ලංකා විදුලි පුද්ගලික සමාගම සහ උපයෝගිතා ආයතනවල කලමණාකාරීත්වය, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සහ වෘත්තීය සමිති වල අදහස් කමිටුව විසින් ලබාගෙන ඇත.

- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් අනුමැතියට අනුව විදුලිබල අංශයේ ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා දේශීය හා ජාත්‍යන්තර විශේෂඥයින්ගෙන් සම-න්විත විදුලිබල ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයක් (PSRS) පිහිටුවන ලදි.
- යෝජිත නව විදුලි පනතේ පනත් කෙටුම්පත ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කිරීමට පෙර අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා දැනටමත් යොමුකොට තිබේ.

**(ඇ) විදුලි ගාස්තු සංශෝධනය 2023**

- විදුලිබල ක්ෂේත්‍රයේ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් යෝජනා කර ඇති පරිදි පිරිවැය පරාවර්තක විදුලි ගාස්තු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම අරමුණු කරගත් විදුලි ගාස්තු සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය.
- ඒ අනුව, පිරිවැය පියවා ගැනීමට ගාස්තු සැකසීමේ ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දුන් බැවින් එතෙක් පැවති සමස්ත විදුලි ගාස්තුව 2023.02.15 දින සිට 35% කින් වැඩි කරන ලදී.
- එසේම, 2023.07.01 දින සිට එතෙක් පැවති විදුලි ගාස්තුව 14.2%කින් අඩු කරන ලද අතර, වාර්ෂිකව දෙවතාවක් (සෑම වසරකම ජනවාරි 01 සහ ජූලි 01) විදුලි ගාස්තු සංශෝධනය කිරීමට 2023.01.09 දිනැතිව ලබාදෙන ලද අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට අනුව මහජනතාවට සහනයක් සලසන ලදී.
- ජූලි මාසයේ සිට රට තුළ දැඩි නියඟයක් ආරම්භ වීම නිසා බලාගාර ආශ්‍රිත ජලාශ වල ජල මට්ටම දැඩි ලෙස බලපෑමට ලක්වීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2023 වසර සඳහා අපේක්ෂා කරන ලද ගිගාවොට් පැය 4,500 ක ජල උත්පාදනය ගිගාවොට් පැය 3,750ක් දක්වා බරපතල ලෙස අඩු විය. තවද, කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා සමනලවැව ජලාශයෙන් ජලය කඩිනමින් මුදා හැරීමට තීරණය කිරීමෙන් ආපදා තත්ත්වයන් යටතේ හදිසි පරිපූරක තාප විදුලිය ලබාගැනීමට සිදුවීම හේතුවෙන් 2023.10.20 දින සිට ඉහත අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව එදිනට පැවති විදුලි ගාස්තුව 18% කින් වැඩි කිරීමට සිදුවිය.

**(ඉ) ජාත්‍යන්තර සහයෝගිතා**

- අවශ්‍ය විටදී දීර්ඝ කරගැනීම සඳහා ආයතන දෙක සමඟ තාක්ෂණය හුවමාරුව පිළිබඳ අවබෝධතා ගිවිසුමක් (MoU) නීතිපති දෙපාර්තමේන්තුවේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසු ලංකා විදුලිබල මණ්ඩලය සහ ජපන් විදුලි බල තොරතුරු මධ්‍යස්ථානය (JEPIC) අතර අත්සන් කර ඇත.
- විදේශ අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයේ (SAARC) බලශක්ති මධ්‍යස්ථානයේ සාමාජිකත්වය ලබා ගැනීමට අදාළ ක්‍රියාකාරකම් සිදු කර ඇත.
- විදේශ අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව (BIMSTEC) සමඟ පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.
  - ❖ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව සංවිධානයේ පරිපාලන මණ්ඩලයේ පළමු රැස්වීමට සහ විදුලි ජාල අන්තර් සම්බන්ධතාවයේ දෙවන රැස්වීමට සහභාගීවීම සහ අදාල ක්‍රියාකාරකම්

❖ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව සංවිධානයේ ප්‍රතිපත්ති ලේඛනයේ විදුලිය බෙදා හැරීම, විකිණීම සහ හුවමාරු කිරීම සහ මිලකරණය පිළිබඳ සමාලෝචන ඉදිරිපත් කිරීම

- දකුණු ආසියා කලාපීය බලශක්ති හවුල්කාරිත්වය (SAREP)

SAREP වැඩසටහනේ කොටසක් ලෙස, දේශ සීමා හරහා සිදුකෙරෙන විදුලිබල අලෙවිය (Cross Border Power Trade) පිළිබඳ ශ්‍රී ලංකාවේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී. SAREP කාර්ය සාධක බලකා-1 හි ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යමින් "දේශසීමා හරහා සිදුකෙරෙන විදුලිබල අලෙවිය සඳහා වන ප්‍රතිපත්ති, නෛතික සහ නියාමන රාමු සම්බන්ධීකරණය" පිළිබඳ 11 වන රැස්වීම 2023 ඔක්තෝබර් 9 වන දින පවත්වන ලද අතර ඉන් අනතුරුව තෙදින වැඩමුළුවක් පැවැත්විණි. TF-1 හි ප්‍රධාන පරමාර්ථය වන්නේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහ ව්‍යාප්ත කිරීමට තිරසාර වෙළඳපලක් සඳහා සක්‍රීය පද්ධතිමය කොන්දේසි නිර්මානය කිරීම සඳහා හිතකර ප්‍රතිපත්ති, නෛතික සහ නියාමන ක්‍රමවේද හරහා පිරිවැය සහ අවදානම් සාධාරණ ලෙස හානිපූරණය සඳහා ප්‍රතිපත්ති, නෛතික සහ නියාමන ගැටළු අවම කිරීමයි. බංගලාදේශය, නේපාලය, භූතානය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව යන රටවල නියෝජිතයෝ කාර්ය සාධක බළකා රැස්වීමට සහ වැඩමුළුවට සහභාගි වී සිටියහ.

### 1.5.4 2024 වසර සඳහා සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්

**(අ) විදුලි උත්පාදනය**

- මෙගාවොට් 50 මන්නාරම සුළං බල ව්‍යාපෘතිය- ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකු මූල්‍යකරණය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය මගින් මන්නාරම සුළං බල ව්‍යාපෘති පුළුල් කිරීම සඳහා මෙගාවොට් 50ක ධාරිතාවකින් වැඩි කිරීමට සැලසුම් කර ඇත. මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 70 කි.

- ඉන්දියානු ණය ආධාර වැඩසටහන (ඇමෙරිකානු ඩොලර් මිලියන 100) යටතේ රජයේ ගොඩනැගිලි සඳහා මෙගාවොට් 80 ක ප්‍රභාවිද්‍යුත් ශක්තිජනන (PV) සූර්ය පියැසි, ආගමික ස්ථාන සඳහා මෙගාවොට් 50 ප්‍රභාවිද්‍යුත් ශක්තිජනන (PV) සූර්ය පියැසි පද්ධති සහ මෙගාවොට් 50 ක පාවෙන සූර්ය බලාගාර ස්ථාපනය කිරීම.

- බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් ඉන්දියානු ආධාර (ඇමෙරිකානු ඩොලර් මිලියන 10ක ආධාර) යටතේ ආගමික ස්ථානවල (පිරිවෙන් 825ක) සූර්ය පැනල සවි කිරීම.

- තෝරා ගත් ආගමික ස්ථාන වල විදුලි බිල්පත් ප්‍රතිපූර්ණය සඳහා බැටරි ගබඩා පහසුකම සහිත කිලෝවොට් 500 ක භූමිය මත සවිකළ සූර්ය බල ව්‍යාපෘතිය -
ශ්‍රී ලංකා බලශක්ති අරමුදලේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 100 කි.

- පුත්තලම ප්‍රදේශයේ පවතින සුළං බල ව්‍යාපෘතිවල සම්පත් ප්‍රශස්තකරණ විකල්ප පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය -
බලශක්තිය උපරිම ආර්ථික උපයෝජනය සඳහා දායක කර ගැනීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ඇත. රුපියල් මිලියන 250 ක ඇස්තමේන්තුගත පිරිවැය ආධාර මුදල් සැපයුමක් ලෙස ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

- මන්නාරම, බෝලවත්ත, කප්පල්තුරේ, මාදම්පේ සහ ත්‍රිකුණාමලයේ ධාරිතා එකතුව මෙගාවොට් 60 ක කුඩා පරිමාණ සුළං බලාගාර පිහිටුවීමට සැලසුම් කර ඇත.

**(ආ) සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම**

- සාම්පූර් සූර්ය බලාගාරයට සම්බන්ධ පළමු අදියර සම්ප්‍රේෂණ පද්ධතිය -
  ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකු මූල්‍යකරණය යටතේ සීමාසහිත ත්‍රිකුණාමල බලශක්ති සමාගම (TPCL) විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත. මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 40 කි.

- ආසියානු යටිතල පහසුකම් සංවර්ධන බැංකු මූල්‍යකරණය යටතේ කෙරවලපිටියේ සිට කොළඹ වරාය දක්වා වූ දෙවන කිලෝවෝල්ට් 220 භූගත රැහැන (කේබලය) එලීම. මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 50 කි.

- මාතර - හම්බන්තොට කිලෝවෝල්ට් 132, කිලෝමීටර් 85 ක සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම -
  මාතර - හම්බන්තොට කිලෝවෝල්ට් 132, සීබ්‍රා ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය මගින් දක්ෂිණ ජාලයේ සම්ප්‍රේෂණ මාර්ගයේ අධිභාර ඇතිවීම නිවැරදි කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු (ADB) මූල්‍යකරණය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ඇත. මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 4,255.4 කි.

- හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉල්ලුම වැඩි අවස්ථා සඳහා බලශක්ති ගබඩා පද්ධතියක් (Peak Reduction Energy Storage System (ESS) සැපයීම -
  මෙම ව්‍යාපෘතිය කොරියානු තාක්ෂණ දියුණුව සඳහා වූ ආයතනයේ (KIAT) ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතයි. මේ යටතේ මෙගාවොට් 5/ මෙගාවොට් පැය 10.7 බලශක්ති ගබඩා පද්ධති ස්ථාපනය කිරීම සිදු කරයි.

- දිවුලපිටිය ප්‍රාදේශීය සභාව තුළ කාර්යක්ෂම වීදි ආලෝක පද්ධතියක් පිහිටුවීම - මෙම නියමු ව්‍යාපෘතිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ශ්‍රී ලංකා බලශක්ති අරමුදල යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරෙන අතර ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 25.5 ක් වේ.

**(ඇ) වෙනත් ව්‍යාපෘති**

- ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) යටතේ වන තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති -

  - උසස් විනාශකාරී නොවන පරීක්ෂණ ක්‍රමයේ (advanced Non- Destructive Testing Method) යෙදවුම වැඩි කිරීම
  - න්‍යෂ්ටික බලශක්ති වැඩසටහනක් සඳහා ජාතික වශයෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
  - පොසිට්‍රෝන විමෝචන ටොමොග්‍රැෆි විකිරණශීලී ඖෂධ නිෂ්පාදනය (Positron Emission Tomography Radiopharmaceuti-cals) සඳහා වෛද්‍ය සයික්ලොට්‍රෝන පහසුකම (Medical Cyclotron Facility) - අදියර II ස්ථාපිත කිරීම
  - ගුණාත්මක පිළිකා රෝග විනිශ්චය සහ ප්‍රතිකාර කිරීම් පූර්ව අවශ්‍යතා වලට සහය වීම
  - ඉහත ව්‍යාපෘති හතර ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් ක්‍රියාත්මක කර තිබේ

## 1.6 2023 වර්ෂය තුළ බලශක්ති අංශයේ කාර්යසාධනය

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ බලශක්ති අංශය මගින් රට තුළ ඛනිජ තෙල් කර්මාන්තයේ කාර්යක්ෂමතාව සහ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සිදු කරනු ලැබේ. ජාතික ආර්ථිකයේ සියලුම අංශවල ක්‍රියාකාරිත්වය ඛනිජ තෙල් සැපයුම මත රදා පවතින බැවින් අඛණ්ඩ ඉන්ධන සැපයුමක් තහවුරු කිරීම සඳහා සැම විටම අමාත්‍යාංශය කටයුතු කරනු ලැබේ. ඒ අනුව පසුගිය වසර තුළ ඉන්ධන සඳහා වන දේශීය ඉල්ලුම සපුරාලීමේ දී පැවති දුෂ්කරතා මගහරවා ගනිමින් 2023 වසර තුළ දේශීය ඛනිජ තෙල් ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රතිපත්ති හා වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදී. ඒ අතර පහත සඳහන් පියවර විශේෂයෙන් හඳුනා ගත හැකිය.

- දේශීය වෙළඳපොළ තුළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, බෙදාහැරීම සහ විකිණීම සඳහා ශක්‍යතාවෙන් යුතු ව්‍යාපාර ආකෘතියක් ස්ථාපිත කරමින්, නව ඉන්ධන සැපයුම්කරුවන්ට අවස්ථාව ලබා දීම.
- 2022 වසර අග භාගයේ සිට බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමේ දී විකල්ප ගෙවීම් ක්‍රම (ගබඩා මොඩියුල සංකල්පය (Storage Module Concept)) හඳුන්වා දීම.
- පිරිවැය පිළිබිඹු කෙරෙන ඉන්ධන මිල සූත්‍රයකට අනුව දේශීය ඛනිජ තෙල් මිල ගණන් කාලීනව සංශෝධනය කිරීම
- 2022 වසරේ අගෝස්තු මාසයේ 01 වන දින සිට ක්‍රියාත්මක වූ "ජාතික ඉන්ධන අවසරපත්‍ර ක්‍රමය" (QR Code) යටතේ සීමිත ඉන්ධන තොග, ක්‍රමානුකූලව දීප ව්‍යාප්තව බෙදා හැරීම.
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීම පිණිස, ඇ.එ.ජ.ඩො. බිලියන 2.5 ක් වූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි විදේශ විනිමය ණය තොගය රාජ්‍ය ණය වගකීම් යටතට පැවරීම.
- පෙර භාග සහ පසු භාග ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය සඳහා නව රෙගුලාසි හඳුන්වාදීම.
- ඛනිජ තෙල් වෙළඳපොළට පිවිසීමට නව ප්‍රවේශකයන්හට අවස්ථාව ලබාදීම මගින් වාර්ෂික ආදායම ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- හම්බන්තොට ආශ්‍රිතව අපනයන අභිමුඛ ඛනිජ තෙල් පිරිපහදුවක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා එක්ව පහසුකම් සැලසීම.

### 1.6.1 දිගුකාලීන ගිවිසුම් මත පදනම්ව ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, විකිණීම සහ බෙදාහැරීම සඳහා තරඟකාරී ආයතන වෙත බලපත්‍ර ලබා දීම

2022 වසරේ සිට රටේ ඇති වූ ආර්ථික අර්බුදය හමුවේ ඉන්ධන ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය සපයා ගැනීමේ දුෂ්කරතාවයට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) මුහුණ දෙන ලදී. ඒ හේතුවෙන්, වෙළඳපොළට අඛණ්ඩව ඉන්ධන සැපයීමට මෙම ආයතන දෙක අපොහොසත් වූ බැවින් රට තුළ ඉන්ධන හිගයක් නිර්මාණය විය. රට තුළ පැවති මෙම ගැටළුකාරී අවස්ථාවේ දී අනවසර ඉන්ධන තොග රැස්කර තබා ගැනීම වැනි ඉන්ධන අවභාවිතයන් සිදු වීම තුළින් මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර විය. මේ හේතුවෙන් ඇතැම් පාරිභෝගිකයන් අසාධාරණයට ලක් විය. මෙයට පිළියමක් ලෙස මෙරට විදේශ විනිමය සංචිත ප්‍රයෝජනයට නොගෙන ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමට සහ විකිණීමට අවස්ථාව සලසා දීම සඳහා විදේශීය සමාගම් වෙතින් 2022.07.25 දින අභිලාෂ කැඳවන ලදී. ඒ අනුව ප්‍රකාශ කරන ලද අභිලාෂ අතරින් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කර විකිණීමට සමාගම් තුනක් තෝරා ගන්නා ලද අතර එම සමාගම් තුන අතරින් පහත සඳහන් සමාගම් දෙක සමඟ ගිවිසුම් ගත වන ලදි.

- සී/ස සිනොපෙක් ෆුවල් ඔයිල් ලංකා (පුද්ගලික) සමාගම (M/s Sinopec Fuel Oil Lanka (Private) Limited)
- සී/ස ආර්. එම් පාර්ක් සමාගම (M/s R.M. Parks. Inc.)

ඉහත සමාගම් දෙක අතරින් සී/ස සිනොපෙක් ෆුවල් ඔයිල් ලංකා (පුද්ගලික) සමාගම මෙරට සිය වාණිජ මෙහෙයුම් කටයුතු 2023 සැප්තැම්බර් මස ආරම්භ කරන ලද අතර ඉන්ධන පිරවුම්හල් 150 ක් මගින් දිවයින පුරා ඉන්ධන බෙදාහැරීමට අපේක්ෂිතය. 2023.09.24 දින වන විට සී/ස සිනොපෙක් ෆුවල් ඔයිල් ලංකා (පුද්ගලික) සමාගමේ ඉන්ධන ආනයන තොරතුරු වගු අංක 1.2 මගින් දක්වා ඇත. ඒ අනුව ඇමරිකන් ඩොලර් මිලියන 52 ක් පමණ වටිනා ඉන්ධන ආනයනය කර ඇත. තවද සී/ස ආර්. එම් පාර්ක් සමාගම සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහා මෙම අමාත්‍යාංශය සමඟ කටයුතු කරමින් සිටී.

| ඉන්ධන වර්ගය | ආනයන ප්‍රමාණය (මෙ.ටො.) | ආනයන පිරිවැය (ඇ.එ.ජ.ඩො.) |
|---|---|---|
| සුපර් ඩීසල් | 2,295.11 | 3,034,000.15 |
| ඔටෝ ඩීසල් | 20,778.96 | 23,758,074.82 |
| පෙට්‍රල් 92 ඔක්ටේන් | 16,830.01 | 21,885,354.77 |
| පෙට්‍රල් 95 ඔක්ටේන් | 2,657.90 | 3,912,901.49 |
| එකතුව | 42,561.98 | 52,590,331.23 |

මූලාශ්‍රයෙ: සී/ස සිනොපෙක් ෆුවල් ඔයිල් ලංකා (පුද්ගලික) සමාගම

සිපෙට්කෝ (CEYPETCO) ඉන්ධන පිරවුම්හල




ලංකා අයි.ඕ.සී. (Lanka IOC) ඉන්ධන පිරවුම්හල




සී/ස සිනොපෙක් (SINOPEC) ඉන්ධන පිරවුම්හල




සී/ස සිනොපෙක් ෆුවල් ඔයිල් ලංකා (පුද්ගලික) සමාගම සමඟ ගිවිසුම් අත්සන් කිරීමේ අවස්ථාව





සී/ස ආර්. එම්. පාර්ක් සමාගම සමග ගිවිසුම් අත්සන් කිරීමේ අවස්ථාව





### 1.6.2 ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීමට විකල්ප ක්‍රම හඳුන්වා දීම.

රට මුහුණ දුන් ආර්ථික අර්බුදය හමුවේ ඉන්ධන ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය සපයා ගැනීම දුෂ්කර වීමෙන් 2022 වර්ෂයේ දී රට තුළ ඉන්ධන හිඟයක් නිර්මාණය විය. මෙයට පිළියමක් ලෙස රට තුළ පවතින සීමිත විදේශ විනිමය ප්‍රමාණයට ගැලපෙන පරිදි ඉන්ධන ආනයනය කිරීම සඳහා පහත සඳහන් විකල්ප ගෙවීම් ක්‍රම හඳුන්වා දෙන ලදී.

- ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කර ගබඩාගත ටැංකිවලින් නිකුත් කිරීමේදී ගෙවීම් සිදු කිරීමේ ක්‍රමවේදය (Ex-storage Modality).

- මෙම ක්‍රමය මඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ගබඩා පර්යන්තය වෙත ඉන්ධන මුදා හරින අතර, නැවත ගබඩාවෙන් මුදාහරිනු ලබන ප්‍රමාණය සඳහා කොටස් වශයෙන් ගෙවීමට පහසුකම් සැලසීම මඟින් අඛණ්ඩ ඉන්ධන සැපයුම සහතික කිරීමට හැකි වන අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මුදල් ප්‍රවාහයට ඇති කරන පීඩනය ද ලිහිල් කරනු ලැබේ.

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත කිසිදු ආනයන වියදමකින් තොරව ගුවන් යානා (Jet A-1) ඉන්ධන ආනයනය සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අවශ්‍යතාවයට අනුව සැපයුම්කරුවන්ට ගුවන් යානා (Jet A-1) ඉන්ධන ඔවුන්ගේ වියදමින් ආනයනය සඳහා අවසර දී ඇති අතර ඉන්ධන අලෙවිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කරනු ලැබේ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ගුවන් සේවා කාර්යාංශය මඟින් සපයනු ලබන විකුණුම් ප්‍රමාණයට අනුව අදාළ සැපයුම්කරුවන්ට සතිපතා ගෙවීම සිදු කළ යුතු වේ.

- එසේම අවස්ථාවෝචිත පරිදි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පාවෙන ගබඩා (Floating Storing Tank) මඟින් ඉන්ධන මිලදී ගැනීමේ ක්‍රමය හඳුන්වා දුන් අතර මෙමඟින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නිශ්චිත කාල සීමාවක් තුළ ටැංකියෙන් ඉන්ධන ලබා ගැනීමට හැකියාව ලැබී ඇත. ටැංකිවලින් ඉන්ධන ලබා ගන්නා අවස්ථාවේදී ගෙවීම් කරනු ලැබේ.

ඉහත විකල්ප පියවර අනුගමනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස රට තුළ පැවති ඉන්ධන අර්බුදය නිමාවට පත් වූ අතර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විකල්ප ක්‍රම අනුගමනය කරමින් ඇ.එ.ජ.ඩො. බිලියන 1.829 ක් වටිනා ඉන්ධන 2023 සැප්තැම්බර් 20 දින වන විට මෙරටට ආනයනය කරන ලදී. වගු අංක 1.3 මඟින් ඉන්ධන ආනයන තොරතුරු දක්වා ඇත.

වගුව 1.3
විවිධ ගෙවීම් ක්‍රම අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන ආනයන ප්‍රමාණයන්
(2023.01.01 සිට 2023.09.20 දක්වා)

| අනු අංකය | ගෙවීමේ ක්‍රමය | නිෂ්පාදන වර්ගය | ආනයන ප්‍රමාණය (මෙ.ටො.) | ආනයන පිරිවැය (USD) DAP |
|---|---|---|---|---|
| 1 | ගබඩාගත ටැංකිවලින් නිකුත්කිරීමේදී ගෙවීම් ක්‍රමවේදය (Ex-Storage) | සුපර් ඩීසල් | 16,509 | 14,030,852.73 |
| | | ඔටෝ ඩීසල් | 450,573 | 377,410,071.73 |
| | | පෙට්‍රල් 92 ඔක්ටේන් | 517,263 | 458,122,861.89 |
| | | පෙට්‍රල් 95 ඔක්ටේන් | 18,987 | 17,547,217.90 |
| | | ගුවන්යානා ඉන්ධන | 36,028 | 37,512,827.76 |
| | | දැවිතෙල් (180 CST(1.8% M.S.)) | 31,417 | 21,211,634.05 |
| | | බොරතෙල් | 913,839 | 606,128,670.21 |
| | | නැප්තා | 16,462 | 12,535,735.27 |
| 2 | සැපයුම්කරු ආනයනය කර අලෙවියෙන් පසු ගෙවීම් ක්‍රමවේදය (Supplier-Modality) | ගුවන්යානා ඉන්ධන | 73,221 | 64,035,596.59 |
| 3 | කෙටිකාලීන ණය මත (Credit) | ඔටෝ ඩීසල් | 38,400 | 30,687,264.54 |
| | | පෙට්‍රල් 92 ඔක්ටේන් | 35,085 | 34,542,572.43 |
| | | දැවිතෙල් (180 CST(1.8% M.S.)) | 61,464 | 36,028,803.33 |
| | | බොරතෙල් | 91,001 | 60,476,631.30 |
| 4 | පාවෙන ගබඩාගත ටැංකිවලින් මිලදී ගැනීමේ ක්‍රමවේදය (Ex-Tanker) | බොරතෙල් | 94,189 | 59,138,016.08 |
| | එකතුව | | 2,394,437 | 1,829,408,755.81 |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### 1.6.3 ඉන්ධන මිල සූත්‍රය අනුව ඉන්ධන මිල තීරණය කිරීම

ඉන්ධන සඳහා පිරිවැය නිරූපණය වන පාරදෘශ්‍ය ඉන්ධන මිල යාන්ත්‍රණයක් 2022 ජුනි මස සිට හඳුන්වාදීමට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය කටයුතු කරන ලද අතර ඉන්ධන සඳහා වන උපරිම මිල ගැසට් පත්‍රයේ පළ කරනු ලබයි. මෙසේ ප්‍රකාශයට පත් කරනු ලබන උපරිම මිල සීමාවට අනුගතව කටයුතු කිරීමට ඉන්ධන සැපයුම්කරුවන් බැඳී සිටී. 2023 වසර තුළදී ඉන්ධන මිල සූත්‍රය අනුව අවස්ථා 09 කදී ඉන්ධන මිල සංශෝධනය කරන ලද අතර පෙර වසරේ මැද භාගයට සාපේක්ෂව මෙම වසරේ මැද භාගයේදී ඉන්ධන මිලෙහි අඩුවීමක් දක්නට ලැබේ. ඉන්ධන මිල යාන්ත්‍රණය හඳුන්වාදීමට පෙර සහ පසු ඉන්ධන මිලෙහි විචලනය ප්‍රස්තාරය 1.4 මගින් දක්වා ඇති අතර ඉන්ධන මිල යාන්ත්‍රණය හඳුන්වාදීමෙන් අනතුරුව ඩීසල් සහ පෙට්‍රල් අලෙවියෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභය මත ඇති කරන ලද බලපෑම වගු අංක 1.4 මගින් දක්වා ඇත.

ඉන්ධන මිල සූත්‍රය හඳුන්වාදීමත් සමගම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉන්ධන අලෙවියෙන් ලාභ ලබන තත්ත්වයට පත් වූ අතර ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉන්ධන මිල අඩුවීමේ වාසිය පාරිභෝගිකයා වෙත ලබා දෙන ලදී. තවද උපරිම මිලට වඩා අඩු තරගකාරී මිලකට ඉන්ධන ලබා ගැනීමට පාරිභෝගිකයන් හට අවස්ථාව උදාවී ඇත.

### ප්‍රස්තාරය 1.4
### ඉන්ධන මිල සූත්‍රය අනුව දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන විකුණුම් මිල හැසිරීම
### (2021 ජූනි - 2023 ඔක්තෝබර් 01 )




මූලාශ්‍රය: විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

### වගුව 1.4
### පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලාභය කෙරෙහි බලපෑම

| මාසය | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මෙහෙයුම් ලාභය (රු. මි.) | මෙහෙයුම් ලාභය සඳහා පෙට්‍රල් සහ ඩීසල් දායකත්වය (රු. මි.) | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ශුද්ධ ලාභය (රු. මි.) |
|---|---:|---:|---:|
| 2022 ජූනි | 7,425 | 430 | (679) |
| 2022 ජූලි | 9,974 | 5,137 | 6,314 |
| 2022 අගෝස්තු | 9,569 | 7,721 | 1,776 |
| 2022 සැප්තැම්බර් | 16,342 | 12,787 | 5,629 |
| 2022 ඔක්තෝබර් | 10,910 | 8,859 | 1,963 |
| 2022 නොවැම්බර් | 13,872 | 12,418 | 5,310 |
| 2022 දෙසැම්බර් | 4,749 | 6,561 | 3,932 |
| 2023 ජනවාරි | 10,134 | 7,654 | 3,865 |
| 2023 පෙබරවාරි | 12,508 | 10,851 | 9,434 |
| 2023 මාර්තු | 15,666 | 13,059 | 16,381 |
| 2023 අප්‍රේල් | 10,363 | 7,198 | 13,749 |
| 2023 මැයි | 12,039 | 9,902 | 12,901 |
| 2023 ජූනි | 10,351 | 8,826 | 13,191 |
| 2023 ජූලි | 8,402 | 6,684 | 9,959 |
| 2023 අගෝස්තු | 8,030 | 4,729 | 9,166 |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### 1.6.4 ඉන්ධන බෙදාහැරීම සඳහා ජාතික ඉන්ධන අවසර පත්‍ර ක්‍රමය හඳුන්වා දීම

2022 වර්ෂය ආරම්භයේදී උද්ගත වූ ඉන්ධන අර්බුදය කළමනාකරණය කරගැනීමේ එක් උපක්‍රමික මෙවලමක් ලෙස ජාතික ඉන්ධන අවසරපත්‍රය හඳුන්වා දෙන ලදී. ජාතික ඉන්ධන අවසරපත්‍රය මඟින් සියලුම වාහන සඳහා ඉන්ධන සහතිකවීමක් ලබා දීම තුළින් රට තුළ පැවති ඉන්ධන පෝලිම් තත්ත්වය අවසන් කිරීමට හැකි විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම සතු සියලුම ඉන්ධන පිරවුම්හල් ඉන්ධන නිකුත් කිරීම ජාතික ඉන්ධන අවසරපත් ක්‍රමවේදයට අනුකූලව මනා කළමනාකරණයකින් යුතුව සිදු කරන ලදී.

පසුකාලීනව රටේ සාර්ව ආර්ථිකය ක්‍රමයෙන් ස්ථාවර වීම, විදේශීය තරඟකාරී ආයතන දේශීය ඉන්ධන වෙළඳපොළට පිවිසීම වැනි සාධකවල බලපෑමෙන් දේශීය ඉන්ධන ඉල්ලුම ප්‍රමාණවත් පරිදි සැපයීමට හැකියාව ලැබිණි. ඒ අනුව තවදුරටත් ඉන්ධන අවසරපත්‍රය මඟින් ඉන්ධන නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් නොවූ බැවින් 2023 අගෝස්තු මස 31 ක් වන දින සිට ජාතික ඉන්ධන අවසරපත්‍ර ක්‍රමය අවසන් කරන ලදී.

වගුව 1.5
ජාතික ඉන්ධන අවසර පත්‍රය මගින් ඉන්ධන නිකුත් කිරීමේ ප්‍රගතිය (2022.08.01 සිට 2023.08.01 දක්වා)

ලියාපදිංචි මුලු වාහන සංඛ්‍යාව - 6,526,872
ජාතික ඉන්ධන අවසර පත්‍රය සඳහා ලියාපදිංචි වාහන සංඛ්‍යාව - 6,486,038

| සැපයුම්කරු | ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව | ගණුදෙනු සංඛ්‍යාව | පරිභෝජනය කළ ප්‍රමාණය (ලීටර්) |
|---|---|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සං-ස්ථාව | 1,072 | 282,979,999 | 1,810,795,375.07 |
| ලංකා ඉන්දියානු තෙල් සමාගම | 210 | 47,466,635 | 330,264,686.20 |
| **එකතුව** | **1,282** | **333,446,634** | **2,141,060,061.27** |

| ඉන්ධන වර්ගය | ගණුදෙනු සංඛ්‍යාව | පරිභෝජනය කළ ප්‍රමාණය (ලීටර්) |
|---|---|---|
| පෙට්‍රල් | 292,764,932 | 1,265,676,844.81 |
| ඩීසල් | 37,681,702 | 875,383,216.46 |

මූලාශ්‍රය: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA)

### 1.6.5 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ස්ථාවර බව ඇති කිරීම සඳහා සහය දැක්වීම

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලබා ගෙන ඇති ණය ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් සංස්ථාවේ ණය තිරසරභාවය බිඳවැටීමකට ලක් වූ අතර 2022.12.31 දිනට ගෙවිය යුතු ඩොලර් ණය ප්‍රමාණය ඩොලර් මිලියන 3,404.25 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**වගු අංක 1.6**

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2022.12.31 දිනට ගෙවිය යුතු ඩොලර් ණය ප්‍රමාණය**

| අනු අංකය | විස්තරය | ණය ප්‍රමාණය (ඇ.ඩො..මි.) | එකතුව (ඇ.ඩො..මි.) |
|---|---|---|---|
| 01 | **දේශීය වාණිජ බැංකුව වෙත ගෙවිය යුතු ඩොලර් ණය ප්‍රමාණය** | | |
| | මහජන බැංකුව | 1,362.65 | 2,456.25 |
| | ලංකා බැංකුව | 1,093.60 | |
| 02 | **වෙනත් ගෙවිය යුතු ඩොලර් ණය ප්‍රමාණය** | | |
| | ජාතික ඉරාන තෙල් සමාගම | 248.00 | 948.00 |
| | ඉන්දියානු ණය පහසුකම යටතේ මහා භාණ්ඩාගාරය ලබා දුන් ණය | 700.00 | |
| | **එකතුව** | | 3404.2 5 |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාව

ඉහත ණය අතරින් දේශීය වාණිජ බැංකු වෙත ගෙවිය යුතු ඇ.එ.ජ.ඩො. මිලියන 2456.25 ක ණය මුදල් අමාත්‍ය මණ්ඩල අංක 23/0154/604/014 හා 2023.01.30 දිනැති තීරණය මත මහා භාණ්ඩාගාරය වෙත මාරු කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගෙවිය යුතු විදේශ මුදලින් නාමනය කරන ලද නොපියවූ ණය ප්‍රමාණය පහළ යන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය වාරික සහ පොලී ගෙවීම් වියදම් අවම වීමෙන් මාසික මෙහෙයුම් ලාභය හා ශුද්ධ ලාභය අතර වෙනස අඩු වී ශුද්ධ ලාභය ඉහළ යන ලදී. මෙලෙස මහා භාණ්ඩාගාරය වෙත මාරු කරන ලද ණය සේවාකරණය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන වෙනුවෙන් අයකරනු ලබන නිෂ්පාදන බද්ද භාවිතා කිරීමට මහා භාණ්ඩාගාර ලේකම් වෙත අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

### 1.6.6 ඛනිජ තෙල් කර්මාන්තයේ නියාමන රෙගුලාසි සම්පාදනය කිරීම

ඛනිජ තෙල් නියාමනය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතන මගින් සිදු කරනු ලබන අතර ඒ සඳහා අවශ්‍ය රෙගුලාසි සහ නියෝග විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් කලින් කලට ප්‍රකාශයට පත් කරනු ලබයි. ඒ අනුව පහත සඳහන් රෙගුලාසි හා නියෝග විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය තුළ දී ප්‍රකාශයට පත් කරන ලදී.

**(අ) පෙර භාග ඛනිජ තෙල් කර්මාන්තයට අදාළ නියෝග**

- 2023 අංක 1 දරන ඛනිජ තෙල් සම්පත් (ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම්) නියෝග
- ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය විසින් නිර්ණය කරනු ලැබ ඇති සහ සීමාංකනය කරනු ලැබ ඇති, නම් කරන ලද ප්‍රදේශ තුළ ඒකා-බද්ධ අධ්‍යයන සිදු කිරීම සඳහා වන විධිවිධාන විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම නියෝග මගින් ඛනිජ තෙල් ගවේෂණ කටයුතු සඳහා ආයෝජකයන් ආකර්ශනය කර ගැනීමට පහසුවක් සලසනු ඇත.
- 2023 අංක 2 දරන ඛනිජ තෙල් සම්පත් සේවා සපයන්නන් වෙත බලපත්‍ර ලබා දීමේ නියෝග

- ඛනිජ තෙල් ගවේෂණ කටයුතු සඳහා සේවා සැපයීම විධිමත් කිරීමට 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනතේ බලතල ප්‍රකාරව විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් මෙම නියෝග ප්‍රකාශයට පත් කරන ලදී. මෙම නියෝග අනුව සියළුම සේවා සපයනු ලබන ආයතන ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි විය යුතුය.

**(ආ) පසු භාග ඛනිජ තෙල් කර්මාන්තයට අදාළ නියෝග**

- 2023 අංක 1 දරන ඛනිජ තෙල් නිෂ්පාදන බලපත්‍ර ලබාදීමේ නියෝග

ශ්‍රී ලංකාව තුළ ඛනිජ තෙල් ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදාහැරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීමට අදාළ වන්නා වූ කොන්දේසි සහ එවැනි බලපත්‍රලාභියෙකුට අදාළ වන්නා වූ සාමාන්‍ය කොන්දේසි ප්‍රකාශයට පත් කරමින් 2002 අංක 33 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතේ බලතල ප්‍රකාරව විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් නියෝග සාදන ලදී.

### 1.6.7 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය පසු භාග ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය කරමින් ඛනිජ තෙල් කර්මාන්තයේ නිරත කර්මාන්තකරුවන් සඳහා බලපත්‍ර ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව ලිහිසිතෙල්, තාර, නැව් තෙල්, ගුවන්යානා ඉන්ධන ආනයනය සහ ඉන්ධන පිරවුම්හල් ස්ථාපිත කිරීම සඳහා බලපත්‍ර ලබා දෙනු ලැබේ. වාර්ෂිකව නිකුත් කරනු ලබන බලපත්‍ර ප්‍රමාණය ඉහළ නැංවීම මඟින් ආදායම ඉහළ නංවා ගැනීමට කටයුතු කරන ලද අතර 2023 වර්ෂයේ දී අය කරන ලද බලපත්‍ර ගාස්තු අදායම වගු අංක 1.7 මඟින් දක්වා ඇත.

වගු අංක 1.7
**බලශක්ති අංශයේ වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායම**

| අනු අංකය | ආදායම් මූලාශ්‍රය | ගාස්තු වර්ගය | 2022.01.01 සිට 2022.12.31 දක්වා | | 2023.01.01 සිට 2023.08.31 දක්වා | |
|---|---|---|---|---|---|---|
| | | | ලියාපදිංචි ආයතන සංඛ්‍යාව | එකතු කළ ආදායම ( රු). | ලියාපදිංචි ආයතන සංඛ්‍යාව | එකතු කළ ආදායම ( රු). |
| 1 | ලිහිසිතෙල් | වාර්ෂික බලපත්‍ර ගාස්තු | 27 | 135,030,000.00 | 30 | 105,758,975.55 |
| | | විචල්‍යතා ගාස්තු | - | - | | 190,290,357.57 |
| 2 | තාර | වාර්ෂික බලපත්‍ර ගාස්තු | 15 | 16,000,000.00 | 22 | 24,800,000.00 |
| | | විචල්‍යතා ගාස්තු | | 4,27,500.00 | | 7,478,000.00 |
| 3 | නැව් තෙල් | වාර්ෂික බලපත්‍ර ගාස්තු | 16 | 31,258,782.00 | 12 | 20,903,782.00 |
| 4 | ගුවන්යානා ඉන්ධන බලපත්‍ර ගාස්තු | වාර්ෂික බලපත්‍ර ගාස්තු | - | - | 2 | 10,082,494.00 |
| 5 | ඉන්ධන පිරවුම්හල් ස්ථාපිත කිරීමේ බලපත්‍ර ගාස්තු | වාර්ෂික බලපත්‍ර ගාස්තු | - | - | 2 | 612,522,200.00 |
| | **එකතුව** | | | 187,216,282.00 | | 971,835,809.12 |

මූලාශ්‍රය: විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

2022 වර්ෂය තුළ දී උපයා ගන්නා ලද ආදායම රුපියල් 187,216,282.00 ක් වූ අතර 2023 වර්ෂයේ අගෝස්තු 31 දින වන විට රුපියල් 971,835,809.12 ක ආදායමක් උපයා ගෙන ඇත. එය පෙර වසරට සාපේක්ෂව 418% කින් ආදායම වර්ධනය වීමක් පෙන්නුම් කරන අතර ඛනිජ තෙල් වෙළඳපොළ ලිහිල්කරණය මගින් නව සැපයුම්කරුවන් හට වෙළඳපොළට පිවිසීමට අවස්ථාව සැලසීම, ආදායම වර්ධනය වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය.

### 1.6.8 ඛනිජ තෙල් පිරිපහදුවක් සහ ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් හම්බන්තොට ස්ථාපිත කිරීම

හම්බන්තොට ආශ්‍රිතව අපනයන අභිමුඛ ඛනිජ තෙල් පිරිපහදුවක් ස්ථාපිත කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් 2023.02.24 දින සුදුසුකම්ලත් ආයෝජකයන් වෙතින් අභිලාෂ කැඳවන ලදී. ඒ අනුව ආයෝජකයන් හත්දෙනෙකු විසින් සිය අභිලාෂ ප්‍රකාශ කළ අතර ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීමට ලක් කිරීමෙන් පසු විස්තරාත්මක යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආයතන දෙකක් සුදුසුකම් ලබන ලදී. එම ආයතන දෙක වෙත විස්තරාත්මක යෝජනා ඉදිරිපත් කරන ලෙස 2023.06.27 දින දන්වන ලද අතර එක් ආයතනයක් පමණක් සිය විස්තරාත්මක යෝජනාව ඉදිරිපත් කරන ලදී. මේ වන විට ව්‍යාපෘති කමිටුව හා අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ප්‍රමන්ත්‍රණ කමිටුව විසින් විස්තරාත්මක යෝජනාව ඇගයීමට ලක් කරමින් පවතී.

#### ව්‍යාපෘතියේ ප්‍රධාන ලක්ෂණ

- අපේක්ෂිත ධාරිතාවය - දිනකට අවම බොරතෙල් බැරල් 100,000 ක් පිරිපහදු කිරීම
- අපේක්ෂිත ආයෝජනය ඇ.එ.ජ.ඩො. බිලියන 1.5 ත් 2 ත් අතර
- ව්‍යාපෘතිය නිමකිරීමට අපේක්ෂිත කාලය - 2024 – 2027

#### ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල

- මෙය රටේ වේගවත් හා තිරසාර වර්ධනයක් සඳහා අපනයන උත්ප්‍රේරක ආයෝජනයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- ශ්‍රී ලාංකිකයන් සඳහා සැලකිය යුතු මධ්‍යම සහ ඉහළ මට්ටමේ (කාර්මික ශිල්පීන්, උපාධිධාරීන්, ඉංජිනේරුවන්, රසායනඥයින් යනාදී) සෘජු රැකියා සැපයීම සහ උපකාරක සේවාවන්හි තවදුරටත් වක්‍ර රැකියා අවස්ථා නිර්මාණය කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල නිෂ්පාදන සහිත නවීන තාක්ෂණයෙන් යුත් පිරිපහදුවක් ස්ථාපිත කිරීම.
- හම්බන්තොට වරායේ නැව් භාණ්ඩ හුවමාරු කිරීම් ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘතිය උත්ප්‍රේරක ආයෝජනයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන රට තුළ ලබා ගැනීමේ හැකියාව ඉහළ නැංවීමෙන් රටේ බලශක්ති සුරක්ෂිතභාවය ඉහළ නැංවීම.

**හම්බන්තොට ස්ථාපිත කිරීමට යෝජිත ඛනිජ තෙල් පිරිපහදුව සහ ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානය**



### 1.6.9 2024 සඳහා අනාගත සැලසුම් / වැඩසටහන්

- අපනයනය ඉලක්ක කරගත් ඛනිජ තෙල් පිරිපහදුවක් සහ ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් හම්බන්තොට ප්‍රදේශයේ පිහිටුවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- අපනයනය ඉලක්ක කරගත් ඛනිජ තෙල් පිරිපහදුවක් ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පිහිටුවීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ත්‍රිකුණාමලය චීන වරායේ තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- දේශීය ඛනිජ තෙල් කර්මාන්තය සඳහා නියාමන රාමුවක් ස්ථාපිත කිරීම.

## 1.7 විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2023 සැප්තැම්බර් 30 දක්වා මූල්‍ය ප්‍රගතිය

වගුව 1.8 - 2023 වර්ෂයේ ප්‍රාග්ධන අයවැයේ මූල්‍ය ප්‍රගතිය - ශීර්ෂය 119

| වියදම් විස්තරය | මූලධන වියදම් | | |
|---|---|---|---|
| | වෙන් කරන ලද ප්‍රතිපාදනය (රු. මිලියන) | 30.09.2023 දිනට මුළු වියදම (රු.) | % |
| **අමාත්‍ය කාර්යාලය** | | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | |
| ගොඩනැගිලි | 1.50 | 1.50 | 100% |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1.50 | - | 0% |
| වාහන | 8.40 | 3.51 | 42% |
| **මූලධන වත්කම් අත්පත්කර ගැනීම්** | | | |
| ලී බඩු සහ කාර්යාලීය උපකරණ | 0.30 | 0.25 | 84% |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 0.30 | - | 0% |
| **ආයතන හා පරිපාලන සේවා** | | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | - | - | |
| ගොඩනැගිලි | 1.10 | - | 0% |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 0.40 | - | 0% |
| වාහන | 1.00 | - | 0% |
| **මූලධන වත්කම් අත්පත්කර ගැනීම්** | - | - | |
| ලී බඩු සහ කාර්යාලීය උපකරණ | 1.00 | 0.08 | 8% |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1.70 | - | 0% |
| මෘදුකාංග සංවර්ධනය | 0.30 | - | 0% |
| කසල පිරිසැකසුම් හා පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය | 1913.20 | 1,600.00 | 84% |
| | - | - | |
| ශ්‍රී.ලං.වි.ම මඟින් විදේශාධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වියදම් ගිණුම් තැබීම | 36,000.00 | 7,565.1 | 21% |
| රජයේ ගොඩනැගිලි, අඩු ආදායම්ලාභී නිවෙස් සහ ආගමික ස්ථානවල වහළ මත සූර්ය පැනල සවි කිරීමේ ව්‍යාපෘතිය සඳහා | 876.00 | - | 0% |
| **ඛනිජ තෙල් සංවර්ධන රාමුව** | - | - | |
| පර්යේෂණ සහ සංවර්ධන | 0.50 | - | 0% |
| ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය | 75.00 | 3.50 | 5% |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 50.00 | - | 0% |
| ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය | 50.00 | 12.59 | 25% |
| ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව | 7.00 | 4.00 | 57% |
| **එකතුව** | 38,989.20 | 9,190.53 | 24% |

# දෙවන පරිච්ඡේදය

# ලංකා විදුලිබල මණ්ඩලය

## 1. හැඳින්වීම

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) යනු 1969 අංක 31, 1979 අංක 29 හා 1988 අංක 32 දරන පනත්වලින් සංශෝධිත 1969 නොවැම්බර් මස 1 දිනැති 1969 අංක 17 දරන පනත මගින් ස්ථාපිත රජය සතු ව්‍යවසායකි. 2013 අංක 31 දරන පනත මගින් සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ලං.වි.ම. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමන විෂය පථය යටතට ගෙන එන ලදී. විදුලි බලය ජනනය කොට සියලු පාරිභෝගික කාණ්ඩයන් වෙත සම්ප්‍රේෂණය හා බෙදාහැරීම, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත පිරිවැය පිළිබිඹු කරන්නාවූ අවසන් පරිශීලක අයකුමය ප්‍රකාර ආදායම රැස් කිරීම හා එම පනත යටතේ විධිවිධාන සලසා ඇති පරිදි හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර ප්‍රකාර මණ්ඩලයේ සමස්ත ආදායම එහි සියලු කටයුතු සඳහා ප්‍රමාණවත් වන බවට වගබලාගනු පිණිස එහි කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධ බලතල ලං.වි.ම. වෙත පවරා දී ඇත.

**දැක්ම**

විදුලි බලයෙන් සසිරිමත් දිවියක්

**මෙහෙවර**

ගුණාත්මක බව, ජාතියට සේවය සැපයීම, කාර්යක්ෂමතාවය හා එලදායිතාවය, කැපවීම, සුරක්ෂිත බව, වෘත්තීයවේදීත්වය හා තිරසර බව යන අපගේ සාරධර්මවලට අනුගත වෙමින් සමස්ත ශ්‍රී ලංකාවටම කාර්යක්ෂම, සමායෝජිත හා සකසුරුවම් විදුලිය සැපයුමක් සංවර්ධනය කරමින් පවත්වාගෙන යාම හා නඩත්තු කිරීම,

**අභිමතාර්ථ**

එක්සත් ජාතීන් විසින් නිකුත් කර ඇති තිරසර සංවර්ධන අභිමතාර්ථ වෙත නිසි අවධානය යොමු කරමින් 2019-2023 ආයතනික සැලැස්ම සඳහා වූ අභිමතාර්ථ අටක් ලං.වි.ම. විසින් හඳුනාගනු ලබයි. ආයතනයේ දිගු කාලීන දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගනු පිණිස සකස් කරන ලද අභිමතාර්ථ අට පහත පරිදි වේ:

- ලං.වි.ම. මූල්‍යමය වශයෙන් වඩා බලවත් කිරීම
- අඩු පිරිවැය බලශක්ති ජනනය නංවාලීම
- මුළු රටටම විදුලි බලය දැරිය හැකි මිලකට ලබාදීම
- පාරිභෝගික හවතුන් වෙත උසස් ගුණාත්මක බවකින් යුත් විදුලිය සැපයුමක් හා සේවාවන් ලබාදීම
- බාහිර පරදුකරුවන් සමගින් වඩා ශක්තිමත් සබඳතාවයක් පවත්වාගෙන යාම
- වර්ධිත සේවා නියුක්තික දායකත්වය
- නවීන තාක්ෂණය සමගින් මෙහෙයුම් විශිෂ්ටත්වය
- හරිත බලශක්ති ඒකාබද්ධකරණය ප්‍රශස්ත මට්ටමකට ගෙනඒම

### (අ) පාරිසරික තිරසරබව

මතු පරම්පරාවන් උදෙසා අපගේ පරිසරය ආරක්ෂා කරගනිමින් ශ්‍රී ලංකාවේ නවෝත්පාදනීය ව්‍යවසාය බවට පත් වීමට අපි කැපවී සිටිමු. ලං.වි.ම.හි මෙහෙයුම් කටයුතු තුළදී ජන ප්‍රජාවන්ගේ විශ්වාසය හා පැහැදීම ගොඩ නගමින් අදාළ පාරිසරික ව්‍යවස්ථාවන් හා නියාමන ප්‍රමිතීන් හා පූර්ණව අනුගතවන බවට වගබලාගනු පිණිස ලං.වි.ම. පුරා වඩාත් යහපත් පාරිසරික කළමනාකරණ පරිචයන් අනුගමනය කරනු ලබයි. දිගු කාලීනව ජන ප්‍රජාවන් වෙත ප්‍රශස්ත ප්‍රතිලාභ ලබාදෙනු ලබන බවට වගබලාගනු පිණිස අපගේ සංවර්ධන ව්‍යාපෘතීන්හි සියලු අදියරයන්හිදී ප්‍රජාව හා සෙසු පාර්ශවකරුවන් අන්තර්ගත සහභාගිත්ව ප්‍රවේශයක් මගින් අපි අපගේ ව්‍යාපාර කටයුතු සිදු කරමු.

(ආ) කාර්ය සාධන උද්දීපනයන් 2023 (අගෝස්තු දක්වා)


















### (ඇ) විදුලිය සැපයුම පිළිබඳ සමාලෝචනය

උපරිම ඉල්ලුම වාර්ෂිකව 2.7%ක අනුපාතයකින් වර්ධනය වන පසුබිමක පසුගිය වසර පහළව ඇතුළත රටේ විදුලිය ඉල්ලුම වාර්ෂිකව 4.2%ක පමණ සාමාන්‍ය අනුපාතයකින් වර්ධනය වෙමින් පැවතිණි. වසර 2022 තුළ ශුද්ධ ජනනය ගි.වො.පැ. 15,942ක් ලෙස වාර්තාවූ අතර 2021 වසරෙහි අගය හා සාපේක්ෂව එය 4.6%ක පහත වැටීමක් ලෙස වාර්තා විය. මේ අතර 2022 වසර තුළ උපරිම ඉල්ලුම මෙ.වො. 2,708 ලෙස වාර්තා වූ අතර, පසුගිය වසර හා සාපේක්ෂව 3.3%ක පහත වැටීමක් ඒ තුළ වාර්තා කරන ලදී. 2023 අවසන් මාස 8 තුළ වාර්තාගත ශුද්ධ ජනනය හා උපරිම ඉල්ලුම ගි.වො.පැ. 10,341 හා මෙ.වො. 2,415ක් වූ අතර, මෙය පසුගිය වසර හා සාපේක්ෂව 5% හා 11%ක පහත වැටීමක් විය.

ලං.වි.ම. හා ස්වාධීන විදුලිය නිෂ්පාදකයන් යන දෙපිරිසම සතුව පවත්නා තාප විදුලි බලාගාරයන් වෙතින් ජනිත විදුලිය ප්‍රමාණයට අනුව ලං.වි.ම.හි වාර්ෂික ජනන වියදම සැලකිය යුතු ලෙස විචලනය වේ. 2023 පළමු මාස අටක කාල පරිච්ඡේදය තුළ වාර්තාගත ජනන මුහුව පහත දක්වා ඇත.




ගල් අඟුරු හා ද්‍රව ඉන්ධන වශයෙන් එන දෙවර්ගයේම ඉන්ධන සැපයුම් ලබාගැනීම විදුලි බලාගාර ක්‍රියාකාරිත්වය කෙරෙහි සෘජු බලපෑමක් සිදුකරන අතර ලං.වි.ම. මූල්‍ය කළමනාකරණයෙහිද අතිශය වැදගත් වේ. අනෙක් අතින්, ජලවිදුලි බලාගාරයන්හි ක්‍රියාකාරිත්වය වර්ෂාපතනයේ සිදුවන විචලනයන් හා අත්‍යන්තයෙන්ම බද්ධව පවත්නකි. ස්ථාවර, අඛන්ඩ විදුලිය නිෂ්පාදනයක් උදෙසා ප්‍රශස්ත ජලාශ මට්ටම් පවත්වා ගෙනයාම මත ජල විදුලියේ පිරිවැය ඵලදායකත්වය රඳා පවත්නා බැවින්, ජල සම්පාදනයේ ඇතිවන විචලනයන් ලං.වි.ම.හි ආදායම සමග සෘජුවම සම්බන්ධ වේ. 2022 ජනවාරි මස සිට 2023 අගෝස්තු මාසය දක්වා ජල විදුලිය සඳහා ජලය සැපයෙන ජලාශයන්හි ජල මට්ටම්හි සිදුවූ විචලනය පහත දක්වා ඇත.




සිය සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාලය සංවර්ධනය කොට පවත්වාගෙන යාම, ලං.වි.ම.හි වර්තමාන විදුලිය ජාලය ඉල්ලුමේ සිදුවන වර්ධනයනට යෝග්‍ය පරිදි මෙන්ම විශ්වසනීය විදුලිය සැපයුමක් සහතික කිරීමට හැකිවන පරිදි පුළුල් කිරීම සඳහාද ලං.වි.ම. වෙත සැලකිය යුතු ආයෝජනයක් අවශ්‍ය කෙරේ.

ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම පිණිස මෙන්ම ග්‍රාමීය ප්‍රදේශයන්හි ආර්ථික සංවර්ධනය උදෙසාද ග්‍රාමීය විදුලියන යෝජනාක්‍රම හඳුන්වා දී ඇත. එවන් ව්‍යාපෘති වාණිජමය වශයෙන් පවත්වාගෙන යා නොහැකිවන ඕනෑම අවස්ථාවක ආයෝජන හෝ මෙහෙයුම් සහාය හරහා ලං.වි.ම. වෙත ශ්‍රී ලංකා රජය විසින් අවශ්‍ය වන්දි ලබාදිය යුතුවේ.

සමස්ත ශ්‍රී ලංකාව පුරා විදුලියන සම්පාදන කාර්යය උදෙසා වූ සිය අපේක්ෂිත මෙහෙයුම සපුරාලීමේ ඉම දක්වා ලං.වි.ම. ආසන්න වෙමින් පවත්නා තත්ත්වයක, ආයතනය විසින් එහි උත්සාහයන් පාරිභෝගික තෘප්තිය ගොඩනගනු උදෙසා සිය සේවයේ ගුණාත්මකභාවය නංවාලීම කෙරෙහි යොමුකර ඇත. තවද, තිරසර බලශක්ති විසඳුම් කරා සිය දායකත්වය ලබාදෙමින්, හැකි විටදී හරිත තාක්ෂණයන් ප්‍රවර්ධනය කරමින් වත්මන් රජයේ ප්‍රතිපත්ති හා ලෝක පාරිසරික ප්‍රවණතාවයන්ද සමගින් ලං.වි.ම. සක්‍රීය ලෙස ඒකාබද්ධ වී ඇත. ඒ හා අනුගත වෙමින්, මෙවන විට පාරිභෝගිකයන් හට සිය පරිශ්‍රයන් තුළදීම වහළය මත විදුලිය ජනනය කොට බලශක්තිය පරිභෝජනය කරන අතරම, අපනයනයද කරමින් "නෙට් මීටරින්", "නෙට් අකවුන්ට්න්", "නෙට් ප්ලස්" හා "නෙට් ප්ලස් ප්ලස්" නමැති යෝජනාක්‍රම සතරක් යටතේ එම ජනනය ලං.වි.ම. පද්ධතිය හා සම්බන්ධ කිරීමටද අවකාශ සලසා ඇත. තවද, වහළය මත සවිකරන සූර්ය පැනල යෙදවුම් සැකසුම් ක්‍රමය නමින් යුත් නව මොඩියුලයක්ද (CEBAssist) මොඩියුලය වෙත එක්කර ඇති අතර, එමගින් සූර්ය පැනල ඒකාබද්ධකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය සහතික කරනු වස් බෙදාහැරීමේ කාර්ය මණ්ඩලයට සූර්ය පැනල නිෂ්කාශන ඉල්ලීම්, සම්බන්ධතා අයැදුම්පත්,

අභ්‍යන්තර සේවා ධාරාවන්, ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු ආදියට යොමුවීමට අවකාශ සලසනු ලබයි.

මෙයට අමතරව, ලං.වි.ම. විසින් සේවයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම කෙරෙහිද අවධානය යොමු කරවමින් සිටී. එබැවින්, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (CSCs) සඳහා වූ තරු ශ්‍රේණිගතකරණ වැඩසටහන පාරිභෝගික සේවාවන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කරනු පිණිස නොකඩවා පවත්වාගෙන යන ලදී. ඒ අනුව, බෙදාහැරීමේ අංශයන් වෙත තරු ශ්‍රේණිගතකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යය පවරා දී ඇති අතර, අවසන් කාර්යය වනුයේ හත්වන තරු මට්ටමේදී ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ ක්‍රම සහතිකය ලබාගැනීමයි.

## 1.1 විදුලිය ඉල්ලුම

2023 පළමු මාස අට ඇතුළත අයකුම ගැලපුම් හේතුකොට විදුලිය ඉල්ලුමේ 4%ක පහත වැටීමක් දක්නට ලැබිණි. පෙර වසරේ අගය වූ මෙ.වො. 2,708.1 හා සාපේක්ෂව මෙම කාල පරිච්ඡේදය ඇතුළත නිරීක්ෂිත උපරිම ඉල්ලුම මෙ.වො. 2,414.8 මට්ටමේ විය. මෙම මාස අටක කාල පරිච්ඡේදය පුරා ගි.වො.පැ. 10,341ක සමස්ත විදුලිය ප්‍රමාණයක් ජනනය කරන ලද අතර ඉන් ගි.වො.පැ. 9,469ක් සාර්ථකව අලෙවි කරන ලදී.

## 1.2 2024 වසර සඳහා විදුලිය ඉල්ලුම් පුරෝකථනය

2024 වසර සඳහා ලං.වි.ම. දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2023-2042 මත පදනම් වූ විදුලිය ඉල්ලුම් පුරෝකථනය පහත පරිදි වේ.

| වර්ෂය | ඉල්ලුම | | ජනනය | | උච්ච |
|---|---|---|---|---|---|
| | ගි.වො.පැ. | වර්ධන අනුපාතය (%) | ගි.වො.පැ. | වර්ධන අනුපාතය (%) | මෙ.වො. |
| 2024 | 17.705 | 5.8 | 19.222 | 5.7 | 3.149 |

## 1.3 විදුලිය ජනනය

ලංකා විදුලිබල මණ්ඩලයේ ජනන අංශය ලං.වි.ම. සතු තාප හා ජලවිදුලි බලාගාර පවත්වාගෙන යාම හා නඩත්තුව සඳහා වගකිව යුතුවේ. ජනන වත්කම් (බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි බලාගාරයද සමගින්) මෙ.වො. 1413ක ස්ථාපිත ධාරිතාවයක් සහිත ජලවිදුලි බලාගාර 18කින් සමන්විත වන අතර එතුළ මෙ.වො. 900 ගල්අඟුරු බලාගාරයක්ද, මෙ.වො. 811ක ස්ථාපිත ධාරිතාවයක් සහිත තාප විදුලි බලාගාර හතක් (07) ද, (කැළණිතිස්ස සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය 2 - මෙ.වො. 157 විදුලි බලාගාරයද සහිත) මෙ.වො. 761ක විශාල තෙල් බලගත විදුලි බලාගාර අටක් (08) ද, මෙ.වො. 50ක් ජනනය කරන මෙ.වො. 1 තෙල් බලගත විදුලි බලාගාර සංඛ්‍යාවක්ද, මන්නාරමේ මෙ.වො. 104 සුළං විදුලි බලාගාරයද අන්තර්ගත වේ.

ලං.වි.ම. විසින් යාපනය අර්ධද්වීපය වටා පිහිටි දූපත්වලද විදුලි බලාගාර කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, 2023 අගෝස්තු මස 31වන දිනය වනවිට ලං.වි.ම. සතු විදුලි බලාගාරයන්හි සමස්ත ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 3,228ක් විය.

2023 අගෝස්තු මස 31වන දිනය වනවිට ලං.වි.ම. හා ස්වාධීන විදුලිය නිෂ්පාදනායතනයන්ගේ ජනන විස්තර පහත දක්වා ඇත.

| විස්තරය | | ජනනය (ගි.වො.පැ.) |
|---|---|---|
| ලං.වි.ම. | ජල | 2,287 |
| | තාප - ගල් අඟුරු | 3,574 |
| | තාප - තෙල් | 1,677 |
| | සුළං | 268 |
| ස්.වි.නි. | ස.නො.පු.බ. (කුඩා ජලවිදුලි) | 636 |
| | තාප | 990 |
| | සුළං | 240 |
| | සූර්ය (ජාල සම්බන්ධිත) | 135 |
| | සූර්ය (වහළය මත) | 433 |
| | ඩෙන්ඩ්‍රෝ, ජෛවස්කන්ධ හා නාගරික | 101 |
| **එකතුව** | | **10,341** |

2023 අගෝස්තු මස 31වන දිනය වන විට, සමස්ත බලශක්තිය ජනනය ගි.වො.පැ. 10,341ක මට්ටමකට එළැඹි අතර, එතුළ ප්‍රධාන ජලවිදුලි ජනනයේ දායකත්වය 22%ක්ද, ගල් අඟුරු විදුලිය ජනනය 35% ක්ද විය. සමස්ත ජනන මුහුවෙන් තාප තෙල් දායකත්වය 26%ක් වූ අතර, සෙසු පුනර්ජනනීය මූලාශ්‍රයන්හි දායකත්වය 18%ක් විය. මෙයට සාපේක්ෂව, 2022 වසරේ මෙම කාල පරිච්ඡේදයේදී ප්‍රධාන ජලවිදුලි ජනන දායකත්වය 29%ක් ලෙස මෙයට වඩා සුළු වශයෙන් ඉහළ අගයක පැවතිණි.

## 2. ආයතනයේ මූල්‍ය තත්ත්වය

### 2.1 මුහුණ පෑ මූල්‍ය අභියෝග

නිසි පරිදි පිරිවැය පිළිබිඹු කරන්නාවූ අය ක්‍රමයක් ක්‍රියාත්මක නොකිරීම හා බද්ධව රටතුළ පවත්නා සාර්ව ආර්ථික තත්ත්වයන්ද ලං.වි.ම. මූල්‍ය කාර්ය සාධනයට සැලකිය යුතු නිශේධනීය බලපෑමක් සිදුකර ඇත. දැඩි අභියෝගයනට මුහුණ දෙමින් වුව, 2022.08.10, 2023.02.15 හා වඩාත් මෑත කාලීනව 2023.07.01 දිනද සිට ක්‍රියාත්මකවන පරිදි අවස්ථා තුනකදී එහි ගාස්තු ගැලපීම් සිදුකර ගැනීමට ලං.වි.ම.ට හැකිවිය. කෙසේ වුවද, 2023.07.01 දින සිදුකළ අවසන් අයක්‍රම ගැලපීමෙන් පසු පවා 2023 මූල්‍ය වර්ෂය සඳහා ලං.වි.ම. විසින් ශ්‍රී ලං.රු. බිලියන 18.7ක අලාභයක් ඇතිවනු ඇතැයි අපේක්ෂා කරයි.

ලං.වි.ම. මුහුණ පා ඇති ප්‍රධාන මූල්‍ය අභියෝග පහත පරිදි සාරාංශගත කළ හැක.

- 2023.07.01 දින සිට ක්‍රියාත්මක කරන ලද අවසන් පරිශීලක ගාස්තු අඩු කිරීම තුළ 2023 වසර සඳහා මූල්‍ය අලාභයක් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- මෙම වසර තුළ ඇතිවූ වියළි කාලගුණික තත්ත්වය හේතුකොට විදුලිය ජනනය සඳහා සිදුකරන ගෙවීම් ප්‍රමාණය ඉහළ යාම.
- ශ්‍රී ලං.රු. බිලියන 56ක මහජන බැංකු මූල්‍ය පහසුකමට අදාළව පැවති බාධාවන්.
- මහජන බැංකුවෙන් කෙටි කාලීන ගල් අඟුරු ණය පහසුකම් ලබාගත නොහැකිවීම.
- රටට අදාළව සිදුකරන ලද ණය ශ්‍රේණිගතකරණයේ පහළ වැටීම මගින් විදුලිය ජනන යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට මුදල් සැපයීම විෂයයෙහි බලපෑම් ඇතිකර ඇත.
- විදේශ විනිමය හිඟතාවයන් හේතුකොට ගල් අඟුරු සපයා ගැනීමට අදාළ අවදානමක් පවතී.
- උද්ධමනය හා ලෝක අර්බුදය හේතුකොට දැනට සිදු කෙරෙමින් පවත්නා ව්‍යාපෘතීන්ද මෙහෙවරෙහි යෙදවීමට අදාළ ප්‍රමාදයන් අත් විඳිමින් පවතී.
- මහජන බැංකුවේ ණය ගෙවීමට අදාළව පවත්නා දුර්වලතාවය මගින් විදේශීය මිලදී ගැනීම් සිදු කිරීම අභියෝගාත්මක කාර්යයක් බවට පත්කොට ඇත.
- ලං.වි.ම. තුළ නොකඩවා පැවති ද්‍රවශීලතා අර්බුදයක් හේතුකොට ණය බැඳීම් ආශ්‍රිත ප්‍රමාද දෝෂයන් ඇතිවී ඇත.
- නොකඩවා ඉහළ නගින ගල් අඟුරු මිල ගණන් හා සෙසු වෙළඳ භාණ්ඩ මිල වර්ධනයන්ද විසින් පවත්නා මූල්‍ය පීඩනයන් තවදුරටත් තීව්‍ර කරමින් පවතී.

### 2.2 යෝජිත මූල්‍ය ක්‍රමෝපායන්

උක්ත අභියෝගයන් ජයගනු පිණිස, 2.2. කොටස තුළ දක්වා ඇති වත්මන් මූල්‍ය අර්බුදය නවතාලනු උදෙසා තවදුරටත් ප්‍රමාද කිරීමකින් තොරව පහත සඳහන් ක්‍රමෝපාය ක්‍රියාත්මක කළ යුතු බවට යෝජනා කෙරේ.

- පාරිභෝගිකයන් වෙතින් අයවිය යුතු මුදල් පියවාගනු පිණිස දැඩි ක්‍රියමාර්ග ක්‍රියාත්මක කරමින් එහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
- විදුලිය ගාස්තු 2023 තීරණ ලේඛනය තුළ දී ඇති අනුමත අවසරලත් ආදායම පදනම් කරගනිමින් එක් එක් අංශය සඳහා අරමුදල් දෛනිකව වෙන් කිරීම. ඉන් අනතුරුව සැබෑ මුදල් ගෙවීම් මත පදනම්ව එක් එක් අංශය සඳහා මුදල් වෙන් කිරීම කලින් කලට ප්‍රති තක්සේරු කළ යුතුය.
- බැංකුවේ ස්ථාපිත කළ යුතුවන ඉතිරි ණයවර ලිපි නැවත සමාලෝචනය කොට හදිසි ඒවා පවත්නේ නම් ප්‍රමුඛතා පදනමින් ඒවා ස්ථාපනයට අදාළ කටයුතු සිදුකිරීම.
- අතිරේක සාමාන්‍යාධිකාරිවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව අත්‍යවශ්‍ය හදිසි මූලධන වියදම් සඳහා පමණක් විශේෂයෙන් සැලකිල්ල යොමු කරමින් මූලධන වියදම් අයවැය උපයෝජනය සම්බන්ධයෙන් සීමාවන් බලගැන්වීම.
- සියලු ප්‍රසම්පාදන (භාණ්ඩ හා සේවා) සහ කොන්ත්‍රාත් ගෙවීම් සඳහා උපරිම ණය කාල සීමාවන් ලබාගැනීම.
- මුදල් හා ගෙවීම් සංචිතකරණය දැඩිසේ ප්‍රමුඛතාගත කිරීම.
- කල් පිරීමේ කාල සීමාව දිගු කිරීම හරහා ණය කළඹ ප්‍රතිව්‍යුහගතකරණය.
- ගෙවීම් සිදුකළ හැකි ප්‍රධාන සැපයුම්කරුවන් ව්‍යුහගත කාලීන ණය වෙත මාරු කිරීම.
- ඒකරාශිකළ අරමුදල් මගින් දෛනිකව මුදල් වෙන් කිරීම මගින් ගල් අඟුරු සඳහා ගෙවිය යුතු මුදල් සංවිධානය කිරීම.
- ප්‍රසම්පාදන කටයුතු අඛණ්ඩ විදුලිය සැපයුමක් සහතික කිරීමට සෘජුව අදාළ වන්නාවූ අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවනට පමණක් සීමා විය යුතුය.
- අයවැය වර්ධන අයවැයකරණය වෙනුවට ශුන්‍ය අයවැයකරණයක් මත පදනම් වූ අවසරලත් ආදායම් සඳහා සීමාවිය යුතුය.
- දැනට පවත්නා ඌණ උපයෝජිත සම්පත් හරහා අතිරේක ආදායම් මූලාශ්‍ර පිළිබඳ සොයාබැලීම.
- දැනට පවත්නා (ගල් අඟුරු, ඉන්ධන, අමතර කොටස්, බෙදාහැරීමේ ද්‍රව්‍ය ආදියෙහි) භාණ්ඩ

තොග මට්ටම් සමාලෝචනය කොට ප්‍රශස්ත තොග මට්ටම් පවත්වාගෙන යාම. අතිරේක සාමාන්‍යාධිකාරිවරයාගේ අධීක්ෂණය සහිතව තොග රඳවා ගැනීමේ කාල සීමාව මාස තුනක් දක්වා පහතට ගෙන ඒම. මෙයට අමතරව, යල්පිනු, එකතැන අක්‍රියව පවත්නා හා සෙසු අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කඩිනමින් වැඩ පිළිවෙල සැකසීම.

- මහජන බැංකුව මත පවත්නා රඳා පැවැත්ම අවම කරමින් විවිධ බැංකු හරහා ලං.වි.ම. විදේශ විනිමය (FOREX) අවශ්‍යතා සපුරා ගැනීමේ හැකියාව සොයාබැලීම.
- ලං.වි.ම. මත පවත්නා බර සැහැල්ලු කරවනු පිණිස පිරිවැය ඵලදායී පුනර්ජනනීය බලශක්ති ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යය කඩිනම් කිරීම.
- ජාතියට අවශ්‍ය අඛණ්ඩ විදුලිය සැපයුම සහතික කරනු පිණිස යෝජිත විදුලිය යටිතල පහසුකම් අවශ්‍යතාවයන් මත ආයෝජනය වේගවත් කළ යුතුය. කෙසේ වුවද, ලං.වි.ම. ණය බර හේතුකොට සම්ප්‍රදායික මූල්‍යකරණ මූලාශ්‍රයන් ආකර්ශනීය නොවිය හැක. එබැවින්, රාජ්‍ය-පුද්ගලික අංශ හවුල්කාරිත්වයන්, හරිත ව්‍යාපෘති සඳහා හරිත බැඳුම්කරයන් සහ කණ්ඩායම් මූල්‍යකරණය බඳු සම්ප්‍රදායික නොවන මූල්‍යකරණ මූලාශ්‍රයන් අනුගමනය කිරීමට අපේක්ෂා කෙරේ.

## 3. සංවර්ධන ව්‍යාපෘති හා කටයුතුවලට අදාළ ප්‍රගතිය

ජනන හා සම්ප්‍රේෂණ ව්‍යාප්ති යන දෙඅංශයම සඳහා සංවර්ධන ව්‍යාපෘති /අධ්‍යයනයන් සිදු කෙරෙන අතර, 2023 සැප්තැම්බර් මස 31වන දිනට ව්‍යාපෘතිවලට අදාළ ප්‍රගතිය/ තත්ත්වය පහත දක්වා ඇත.

### 3.1 ජල විදුලි සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | ධාරිතාවය | පිරිවැය (ශ්‍රී ලං.රු. මිලියන) | 2023.09.30 දිනට භෞතික ප්‍රගතිය | නිම කිරීමට අපේක්ෂිත දිනය |
|---|---|---|---|---|
| උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය | මෙ.වො. 120 | 105,700 | 99% | 2023 නොවැම්බර් |
| මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය | මෙ.වො. 30.5 | 19,288 | 59% | 2024 දෙසැම්බර් |

### 3.2 ද්‍රව ස්වභාවික වායු සංවර්ධන ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | ධාරිතාවය | 2023.09.30 දිනට භෞතික ප්‍රගතිය | නිම කිරීමට අපේක්ෂිත දිනය |
|---|---|---|---|
| පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය හා නැවතුම් පද්ධතිය | - | 43% | 2026 ඔක්තෝබර් |
| වායු (ද්‍ර.ස්.වා.) | - | මේ දක්වා ආරම්භ කොට නොමැත | 2026 මාර්තු |
| කෙරවළපිටියේ පළමු මෙ.වො. 300 ද්‍ර.ස්.වා. සංයුක්ත චක්‍රීය විදුලි බලාගාර පහසුකම ගොඩනැගීම | මෙ.වො. 300 | 57% | 2024 දෙසැම්බර් |
| කෙරවළපිටියේ දෙවන මෙ.වො. 300 ද්‍ර.ස්.වා. සංයුක්ත චක්‍රීය විදුලි බලාගාර පහසුකම ගොඩනැගීම | මෙ.වො. 300 | | 2025 දෙසැම්බර් |
| ද්‍ර.ස්.වා. 2 ව්‍යාපෘතිය සඳහා අක්කර 10ක ඉඩම ලබාගැනීම | | 95% | 2023 මාර්තු |

### 3.3 ජනන සංවර්ධන අධ්‍යයනයන්

2023 වසර තුළ පොම්පගත ගබඩාකරණ ජලවිදුලි ව්‍යාපෘතිය සඳහා පූර්ව - ශක්‍යතා හා සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීමේදී සැලකිය යුතු ප්‍රගතීන් අත්පත් කරගන්නා ලදී. 2023 ජූනි මාසයේදී වික්ටෝරියා -වැවතැන්න වැඩබිම සඳහා පූර්ව-ශක්‍යතා අධ්‍යයනයේ අදියර 1 ආරම්භ වී මේවන විට කටයුතු සිදුවෙමින් පවත්නේය යන කරුණද සටහන් කළ යුතුව පවතී.

# 4. 2024 වසර සඳහා වූ සංවර්ධන වැඩසටහන්

## 4.1. සම්ප්‍රේෂණ සංවර්ධනයන්

3.5 කොටස තුළ දක්වන ලද සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතීනට අමතරව, පද්ධතියේ විශ්වසනීයත්වය නංවාලනු පිණිස 2024 වසර සඳහා වෙන්කරන ලද අතිරේක සම්ප්‍රේෂණ ප්‍රවර්ධන කටයුතු පවතී. මෙම ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය පිළිබඳ විස්තර පහත සටහන තුළ දක්වා ඇත.

| ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|
| උතුරු රාශිකරණය - වව්නියා - හබරණ කි.වෝ. 400 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | මූලික කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර, මේ දක්වාද අරමුදල් ලබාදී නොමැත. |
| හබරණ - කිරිඳිවැල කි.වෝ. 400 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | අවශ්‍ය අනුමැතිය ලබාගත යුතුව පවතී. |
| උතුරු රාශිකරණය - පූනරින් කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | මූලික කටයුතු ව්‍යාපෘති අංශය විසින් සිදුකරනු ලබයි. ව්‍යාපෘති සංවර්ධක විසින් මූල්‍ය සම්පාදනය සිදුකළ යුතුව පවතී. |
| කප්පල්තුරේ - සාම්පූර් කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | මූලික කටයුතු ව්‍යාපෘති අංශය විසින් සිදුකරනු ලබයි. අරමුදල් ලබාගනු පිණිස ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) සමගින් සිදුකරන සාකච්ඡා අවසන් අදියරේ පවතී. |
| නව හබරණ - කප්පල්තුරේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | AFD ණය යෝජනාක්‍රමය - 2021 මගින් අරමුදල් සම්පාදනය කළ යුතුව පවත්නා නමුදු ණය මුදල සඳහා අත්සන් තැබිය යුතුව පවතී. |
| කෙරවළපිටිය - වරාය 2වන කි.වෝ. 220 භූගත කේබලය | මිල ලංසු විවෘත කළ යුතුව පවතී. අරමුදල් ලබාගනු පිණිස ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) සමගින් සිදුකරන සාකච්ඡා අවසන් අදියරේ පවතී. |
| මාතර - හම්බන්තොට කි.වෝ. 132 කි.මී. 85 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | ආසියානු සංවර්ධන බැංකුව අරමුදල්කරණය සඳහා ගිවිසුම්ගතව ඇති නමුදු ණය ගිවිසුම අත්සන් කළ යුතුව පවතී. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. |
| බියගම කලාපය කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| මීරිගම කි.වෝ. 220/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| කලවාන කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| තිස්සමහාරාම කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| බද්දේගම කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| හෝමාගම කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| පැලියගොඩ කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| මීගමුව කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| මහනුවර නගර කි.වෝ. 132/11 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| යක්කල කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| වාරියපොල කි.වෝ. 132/33 කොටුමා උපපොළ හා කි.වෝ. 220/132 ස්විච්චිකරණ ස්ථානය ඉදිකිරීම | |
| ඒකල කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |

| | |
|---|---|
| ආනියාකන්ද හා චුන්නාකම් කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය | මණ්ඩලයේ අරමුදල් අවශ්‍ය වේ. |
| වික්ටෝරියා - රන්ටැඹේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | මූලික කටයුතු සිදුවෙමින් පවතී. ලං.වි.ම. අරමුදල් ලබාගැනීමට සැලසුම් කර ඇත. |
| සමනලවැව - ඇඹිලිපිටිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 2021 AFD ණය යෝජනාක්‍රමය මගින් අරමුදල්කරණය කළ යුතුව පවතී. එනමුදු ණය අත්සන් කළ යුතුව පවතී. මූලික කටයුතු සිදුවෙමින් පවතී. |
| බදුල්ල - ලක්ෂපාන කි.වෝ. 132, කි.මී. 74.5 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම | |
| නව ලක්ෂපාන - බලන්ගොඩ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම | |
| වව්නියා කොටුමා උපපොළ කි.වෝ. 220 සංවර්ධනය | |
| වැලිමඩ කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |
| කීරියංකල්ලිය කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම | |

**4.2. ජනන සංවර්ධනයන්**

3.1, 3.2 හා 3.3 කොටස් තුළ දක්වන ලද ජනන සංවර්ධන කාර්යයනට අමතරව, 2024 වසර සඳහා සැලසුම් කරන ලද අතුරු ජනන වැඩිදියුණු කිරීම්ද පවතී. මෙම ප්‍රවර්ධනයන් මගින් වර්ධනය වන ඉල්ලුම ආමන්ත්‍රණය, බලශක්ති ආරක්ෂාව ඉහළ නැංවීම හා පද්ධතියේ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම යන කරුණු ආමන්ත්‍රණය කිරීමට අපේක්ෂා කරනු ලබයි. පහත දැක්වෙන සටහන මගින් මෙම ව්‍යාපෘතිවල වත්මන් තත්ත්වය පිළිබඳ අවබෝධයක් ලබාදෙනු ලබයි.

| ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|
| 2024 වසර අවසානයේ මෙහෙවරෙහි යෙදවීමට නියමිත මෙ.වො. 50 / මෙ.වො.පැ. 50 බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා අරමුදල් ලබාගැනීමට නියමිතය. |
| සම්පත් පුරෝකථන පද්ධතියද සහිතව පුනර්ජනනීය බලශක්ති ද්වාරය ස්ථාපනයට අදාළ කටයුතු ආරම්භ කිරීම | අරමුදල් ලබාගැනීමට නියමිතය. |
| දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2023-2042 ප්‍රකාර 2026 වනවිට මෙහෙවරෙහි යෙදවීමට අපේක්ෂිත කෙරවලපිටියේ මෙ.වො. 200 ඒකාබද්ධ පරිපථ එන්ජින් විදුලි බලාගාරයට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම. | ප්‍රසම්පාදන කමිටුව හා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන සාකච්ඡා කමිටුව පත්කළ යුතුව පවතී. |
| දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2023-2042 ප්‍රකාර 2027 වනවිට මෙහෙවරෙහි යෙදවීමට අපේක්ෂිත මෙ.වො. 100 වායු ටර්බයින විදුලි බලාගාරයට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම. | ප්‍රසම්පාදන ක්‍රමවේදය තීරණය කළ යුතුව පවතී. |
| දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2023-2042 ප්‍රකාර 2025 හා 2026 වසර ඇතුළත මෙහෙවරෙහි යෙදවීමට අපේක්ෂිත බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධති (BESS) ව්‍යාපෘති | වැඩබිම හඳුනා ගැනීම හා මුදල් ලබාගැනීම සිදුකළ යුතුව පවතී. |

**4. 3 ජනන සංවර්ධන අධ්‍යයනයන්**

පෙර අදියර තුළ නිර්ණය කරන ලද ප්‍රශස්ත වැඩබිම සඳහා, සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනය විශේෂ කොටගෙන, පොම්පගත ගබඩාකරණ ජලවිදුලි ව්‍යාපෘතිය සඳහා වූ පූර්ව-ශක්‍යතා හා සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයන්හි 2 අදියර 2024 වසර තුළ ආරම්භ කෙරෙනු ඇත.

**4.4 බෙදාහැරීමේ සංවර්ධනයන්**

2024 වසර සඳහා බෙදාහැරීමේ අංශ සතරට අදාළ වැඩසටහන් පහත දක්වා ඇත:

*බෙදාහැරීමේ අංශය 1*

| 2024 සඳහා වූ වැඩසටහන් හා ව්‍යාපෘති | ඒකකය | 2024 සඳහා ඉලක්කය |
|---|---|---|
| මැ.වෝ. කුලුණු මාර්ග* | කි.මී. | 11 |
| මැ.වෝ. කණු මාර්ග (ලින්ක්ස්, රැකූන්, එල්ම් හා භූගත) | කි.මී. | 105 |
| මැ.වෝ. කණු මාර්ග (ABC) | කි.මී. | 20 |
| අ.වෝ. මාර්ග (ABC) | කි.මී. | 74 |
| සම්පූර්ණ කළ යුතුව ඇති මැ.වෝ. ප්‍රති-සන්නායක හා පරිවර්තන කටයුතු (කුලුණු) | කි.මී. | 4 |
| සම්පූර්ණ කළ යුතුව ඇති මැ.වෝ. ප්‍රති-සන්නායක හා පරිවර්තන කටයුතු (කණු) | කි.මී. | 65 |
| සම්පූර්ණ කළ යුතුව ඇති මැ.වෝ. පරිවර්තන කටයුතු (fly - ABC දක්වා) | කි.මී. | 310 |
| ඉදිකළ යුතුව ඇති බෙදාහැරීමේ උපපොළ (බෙදාහැරීමේ/සීනු/රේඩියල්/ නැවත බෙදාහැරීමේ) | සංඛ්‍යා | 215 |
| ඉදිකළ යුතුව පවත්නා ප්‍රාථමික උපපොළ | සංඛ්‍යා | 2 |
| විශාලනය කළ යුතුව පවත්නා ප්‍රාථමික උපපොළ | සංඛ්‍යා | 4 |
| ඉදිකළ යුතුව පවත්නා අටලු අංගන* | සංඛ්‍යා | 5 |
| විශාලනය / වෙනස් කළ යුතුව පවත්නා අටලු අංගන | සංඛ්‍යා | 2 |
| ස්ථාපනය කළ යුතුව පවත්නා ස්වයං ප්‍රති වැසුම්කරණයන් (නව අටලු අංගන හැර) | සංඛ්‍යා | 22 |
| ස්ථාපනය කළ යුතුව පවත්නා පැටවුම් කැඩුම් ස්විච | සංඛ්‍යා | 45 |

*සටහන:* * විදුලිය සැපයුමේ විශ්වසනීයත්වය ප්‍රවර්ධනය උදෙසා සහායදීමේ ව්‍යාපෘතිය තවදුරටත් බෙදාහැරීමේ අංශය 1 හි විෂය පථයට යටත්ව නොපවත්නා බැවින් එයට අදාළ විෂය පථය 2024 ඉලක්කයන් වෙතින් ඉවත් කරන ලදී.

*බෙදාහැරීමේ අංශය 2*

| 2024 සඳහා වූ වැඩසටහන් හා ව්‍යාපෘති | ඒකකය | 2024 සඳහා ඉලක්කය |
|---|---|---|
| මැ.වෝ. කුලුණු මාර්ග | කි.මී. | 66 |
| මැ.වෝ. කණු මාර්ග | කි.මී. | 88 |
| මැ.වෝ. භූගත මාර්ග | කි.මී. | 1 |
| මැ.වෝ. කුලුණු මාර්ග පරිවර්තනය | කි.මී. | 10 |
| මැ.වෝ. කණු මාර්ග ප්‍රති සන්නායකගතකරණය හා පරිවර්තනය | කි.මී. | 154 |
| නව අටලු අංගන | සංඛ්‍යා | 19 |
| අටලු අංගන නවීකරණයන් | සංඛ්‍යා | 11 |
| නව ප්‍රාථමික උපපොළ | සංඛ්‍යා | 1 |
| ප්‍රාථමික උපපොළ විශාලනයන් | සංඛ්‍යා | 2 |
| සීනු උපපොළ නවීකරණයන් | සංඛ්‍යා | 2 |

*බෙදාහැරීමේ අංශය 3*

| 2024 සඳහා වූ වැඩසටහන් හා ව්‍යාපෘති | ඒකකය | 2024 සඳහා ඉලක්කය |
|---|---|---|
| මැ.වෝ. කුලුණු මාර්ග | කි.මී. | 100 |
| මැ.වෝ. කණු මාර්ග (ලින්ක්ස්, රැකූන්, එල්ම් හා භූගත) | කි.මී. | 229 |
| මැ.වෝ. කණු මාර්ග (ABC) | කි.මී. | 13 |
| අ.වෝ. මාර්ග (ABC) | කි.මී. | 141 |
| සම්පූර්ණ කළ යුතුව ඇති මැ.වෝ. ප්‍රති-සන්නායක හා පරිවර්තන කටයුතු (කුලුණු) | කි.මී. | 0 |
| සම්පූර්ණ කළ යුතුව ඇති මැ.වෝ. ප්‍රති-සන්නායක හා පරිවර්තන කටයුතු (කණු) | කි.මී. | 105 |
| සම්පූර්ණ කළ යුතුව ඇති අ.වෝ. පරිවර්තන කටයුතු (fly - ABC දක්වා)* | කි.මී. | 1820 |
| ඉදිකළ යුතුව ඇති බෙදාහැරීමේ උපපොළ (බෙදාහැරීමේ/සීනු/රේඩියල්/ නැවත බෙදාහැරීමේ) | සංඛ්‍යා | 110 |

| | | |
|---|---|---|
| ඉදිකළ යුතුව පවත්නා ප්‍රාථමික උපපොළ * සටහන 2 | සංඛ්‍යා | 1 |
| විශාලනය කළ යුතුව පවත්නා ප්‍රාථමික උපපොළ | සංඛ්‍යා | 0 |
| ඉදිකළ යුතුව පවත්නා අටලු අංගන | සංඛ්‍යා | 11 |
| විශාලනය / වෙනස් කළ යුතුව පවත්නා අටලු අංගන | සංඛ්‍යා | 1 |
| ස්ථාපනය කළ යුතුව පවත්නා ස්වයං ප්‍රති වැසුම්කරණයන් (නව අටලු අංගන හැර) | සංඛ්‍යා | 33 |
| ස්ථාපනය කළ යුතුව පවත්නා පැටවුම් කැඩුම් ස්විච | සංඛ්‍යා | 97 |

*සටහන:* අංක DCC-C-4583 දරන DCC සටහන් පත්‍රයට අනුව පූර්ණ ඇලුමිණියම් සන්නායකය තෙකලා ගුවන් බන්ධිත කේබලයනට (ABC) පරිවර්තනය පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයාගේ නිර්දේශය මත අදාළ සහකාර සාමාන්‍යාධිකාරිවරයාගේ අනුමැතිය සහිතව විශේෂ අවස්ථාවනට සීමා කොට තිබිණි. එබැවින් දක්වා ඇති ප්‍රමාණය පූර්ණ වශයෙන් උපයෝගී කර නොගනු ඇත.*

*බෙදාහැරීමේ අංශය 4*

| 2024 සඳහා වූ වැඩසටහන් හා ව්‍යාපෘති | ඒකකය | 2024 සඳහා ඉලක්කය |
|---|---|---|
| මැ.වෝ. කුලුණු මාර්ග- කි.වෝ. 33 ලින්ක්ස් ද්.ප. ** | කි.මී. | 81 |
| මැ.වෝ. කණු මාර්ග (ලින්ක්ස්, රැකුන්, එල්ම් හා භූගත) | කි.මී. | 64 |
| ගුවන් බන්ධිත කේබල මාර්ග (කි.වෝ. 33 / කි.වෝ. 11) | කි.මී. | 6 |
| පරිවර්තනය (කි.වෝ. 11 සිට කි.වෝ. 33 සිට කි.වෝ. 11 වීසල් සිට රැකුන් දක්වා / රැකුන් සිට ලින්ක්ස් දක්වා | කි.මී. | 81 |
| අටලු අංගන (කණු/ 2 තනි බස්බාර්/ 2 ද්විත්ව බස්බාර්) ** | සංඛ්‍යා | 6 |
| ප්‍රාථමික උපපොළ (PSSs)** | සංඛ්‍යා | 4 |
| ප්‍රාථමික උපපොළ විශාලනය හා / හෝ විතැන් කිරීම | සංඛ්‍යා | 2 |
| භාර කැඩුම් ස්විච ස්ථාපනය (අපේක්ෂිත තොග සැපයුම් හැර) | සංඛ්‍යා | 75 |
| ස්වයං ප්‍රතිවැසුම්කරණ ස්ථාපනය (නව අටලු අංගන හා අපේක්ෂිත තොග සැපයුම් වෙනුවෙන් හැර) | සංඛ්‍යා | 10 |

*සටහන:** කි.වෝ. 33 ලින්ක්ස් ද්විත්ව පරිපථ මාර්ගයන්හි කි.මී. 50ක් හා 1 තනි බස්බාර් 03ක් විදුලිය සැපයුම්හි විශ්වසනීයත්වය උදෙසා සහාය දීමේ ව්‍යාපෘතිය (SESRIP) යටතේ ඉදි කිරීමට නියමිත අතර ප්‍රාථමික උපපොළ 02ක් MVNEIP යටතේ ඉදිකිරීමට නියමිතය.*

# තෙවන පරිච්ඡේදය

## සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම

LECO

### 1. හැඳින්වීම

සීමාසහිත ලංකා විදුලිබල (පුද්ගලික) සමාගම (ලෙකෝ) 1982 අංක 17 දරණ හා 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ මීගමුවේ සිට ගාල්ල දක්වා වූ ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ ප්‍රධාන ආර්ථික කලාපය තුළ බලයලත් ප්‍රදේශයට විදුලිබලය බෙදා හැරීමේ මූලික අරමුණු ඇතිව 1983 වර්ෂයේදී සංස්ථාපිත කරන ලදී. පසුව 2009 අංක 20 දරන විදුලිබල පනත මගින් ලෙකෝ වෙත බෙදා හැරීමේ බලපත්‍රයක් නිකුත් කරමින් මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමනය යටතට ගෙන එන ලදී. ලෙකෝ ආයතනය 600,000 ක් වූ පාරිභෝගික ප්‍රමාණයකට සේවා සපයනු ලැබේ.

### 2. මුහුණ දුන් අභියෝග සහ එවැනි අභියෝග වලට මුහුණ දීම සඳහා ගෙන ඇති උපාය මාර්ගයන්

- **කොවිඩ් වසංගත කාලපරිච්ඡේදයේ සිට එකතුවී ඇති හිග මුදල් එකතු කිරීම**

ප්‍රධාන අභියෝගය වූයේ 2020 වර්ෂයේ සිට පාරිභෝගිකයන් විසින් නොගෙවූ හිග මුදල් එකතු කර ගැනීමයි. සමාගම පූර්ව කොවිඩ් කාල සීමාව දක්වා වූ හිග මුදල් ලබා ගැනීම සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිත කරමින් හිග මුදල් එකතු කිරිමේ දැඩි ව්‍යායාමයක් ක්‍රියාත්මක කරන ලදී. හිග මුදල් එකතු කිරීමේදී පාරිභෝගික ඇමතුම් කාර්යය හඳුන්වාදීම, මුදල් අයකර ගැනීම සඳහා අමතර කණ්ඩායම් සම්බන්ධ කර ගැනීම, දුරස්ථ විසන්ධි කිරීම (සුහුරු මණු සහිත පාරිභෝගිකයින්) හඳුන්වාදීම මෙම ජයග්‍රහණය සඳහා ඉමහත් දායකත්වයක් ලබා දුන්නේය.

- **ආනයන සීමා කිරීම් හේතුවෙන් භාණ්ඩ හිගය**

2021 සිට භාණ්ඩ ආනයන සීමා කිරීම සහ පවතින විදේශ විනිමය අර්බුදය හේතුවෙන් සමාගමේ සැපයුම්කරුවන්ට දැඩි බලපෑම් එල්ල වී ඇති අතර සැපයුම බොහෝමයක් අඩාල වී තිබේ. අසාමාන්‍ය මිල උච්චාවචනයන් හේතුවෙන් ඇතැම් සැපයුම්කරුවන් භාණ්ඩ හා සේවා සැපයීම නවතා ඇති අතර පවතින ප්‍රසම්පාදන රාමුව තුළ ඊට මුහුණදීම අභියෝගයක් වී ඇත. මෙය මගහරවා ගැනීම සඳහා, සැපයුම්කරුවන්ට ලබාදී ඇති යම් නම්‍යශීලීභාවයන් සහ අසාමාන්‍ය අමුද්‍රව්‍ය උච්චාවචනයන් හේතුවෙන් ඇති වන බලපෑම් මැඩපැවැත්වීම සඳහා ඇතැම් අයිතම සඳහා වෙනස් වන මිල සූත්‍ර හඳුන්වා දෙන ලදී.

- **මුද්‍රණය සඳහා වන පිරිවැය වැනි දේශීය පිරිවැය ඉහළ නැංවීම.**

මුද්‍රණ ද්‍රව්‍යවල මිල 6 ගුණයකින් පමණ වැඩි වී ඇති අතර එහි සැපයුම් දාමය යම් යම් අවදානම් වලට නිරාවරණය වන බව සමාගමට පෙනී ගියේය. SMS බිල්පත් හඳුන්වාදීම මගින් පාරිභෝගිකයන් වෙත මුද්‍රණය කරන ලද බිල්පත් නිකුතුව නතර කිරීමට LECO තීරණය කළ අතර එය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ක්‍රියාව සැලකිය යුතු විදේශ මුදල් ඉතිරි කිරීමට සහ පාරිසරික තිරසාරත්වයට තවදුරටත් දායක වේ.

- **පාරිභෝගිකයින් විසින් අඛන්ඩ විදුලි සැපයුම් අපේක්ෂාවන්**

මාර්ගගත ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන වැඩකරන සහ ඉගෙනුම් වේදිකා ජනප්‍රිය වීමත් සමග අඛණ්ඩ විදුලි සැපයුම පිළිබඳ පාරිභෝගික අපේක්ෂාවන් අතිශයින් ඉහළ මට්ටමක පවතී. මෙම ඉල්ලුම සපුරාලීම සඳහා, LECO විසින් කෙටි කාලීන සැලසුම්ගත නඩත්තු කටයුතු හඳුන්වා දුන් අතර එහිදී පැය 8 ක විදුලි කප්පාදුවක් වෙනුවට ජාල නඩත්තුව සඳහා පැය 2-4 ක පමණ කාලයක් විදුලිය විසන්ධි කරනු ලැබේ.

- **විදුලි පිරිවැය වැඩි වීම**

විදුලිය පිරිවැය ඉතා මිල අධික වී ඇති අතර පළාත් පාලන ආයතන විසින් වීදි ලාම්පු පාලනය (දිවා කාලයේ විදි ලාම්පු දැල්වීම) දුර්වල වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස විදුලිය සේවා සපයන්නන් සඳහා මහජන විරෝධයක් එල්ලවේ. මෙය මගහරවා ගැනීම සඳහා, සෑම ලෙකෝ උපපොළකම විදි ලාම්පු පාලක පැනල සවිකිරීම ආරම්භ කොට ඇති අතර එමගින් නිසිපරිදි වීදි ලාම්පු පද්ධතිය මෙහෙයවීම සහ බලශක්ති භාවිතය අධීක්ෂණය සඳහා පහසුකම් සපයයි.

### 3. 2023 වර්ෂයෙහි සංවර්ධන ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

සමාගමේ ජයග්‍රහණය අපගේ කාර්යයසාධනය සහ පාර්ශවකරුවන් සඳහා ඉහළ සේවාවක් ලබා දීමට ඇති කැපවීම ප්‍රදර්ශනය කරයි.

### 3.1 මෙහෙයුම්

- බෙදා හැරීම් ජාලය තුළ ව්‍යාපෘතිය හා පුනරුත්ථාපන කටයුතු පාරිභෝගිකයින්ගේ විදුලි ඉල්ලුම සහ සැපයුම් අඛණ්ඩභාවය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය මත ක්‍රියාත්මක කිරීම.
- බෙදා හැරීම් ශක්ති හානිය 4% කට වඩා අඩු කිරීම සඳහා විදුලි සැපයුම් පද්ධතියේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- විදුලි බිඳවැටීම් අවම කිරීම හා බිඳවැටීම් ප්‍රතිස්ථාපන කාලය අඩු කිරීමෙහි අඛණ්ඩ වර්ධනය
- නව සම්බන්ධතා සඳහා මෙන්ම පාරිභෝගිකයින් ඉල්ලුම් කරන ලද සේවාවන් සඳහා වන සැකසුම් කාලය අඩු කිරීම.
- අධීක්ෂණ සහ පාලන අරමුණු සඳහා පද්ධතියෙන් 50% කට ආසන්න ප්‍රමාණයක් ආවරණය වන පරිදි 1400 පමණ LECO උපපොල වල විදි ලාම්පු පාලක පැනල සවි කොට නිම කිරීම.

### 3.2 සංවර්ධන ක්‍රියාවලීන්

- LECO විසින් SMART මීටර් 60,000ක් සවිකිරීම මගින්, SMART මීටර පාරිභෝගිකයින් ප්‍රමාණය පාරිභෝගික පදනමෙන් 10% බවට පරිවර්තනය කර ඇත. අඛණ්ඩව සැපයුම් වැඩි දියුණු කිරීම සඳහා බෙදාහැරීමේ පද්ධතියේ තවදුරටත් ස්වයංක්‍රිය විදුලි ස්විචයන් ස්ථාපනය කෙරේ. මෙයට දුරස්ථ බැර කඩන ස්විච 120ක් සහ ස්වයංක්‍රිය නැවත ක්‍රියාත්මක ස්විච 67ක් ඇතුළත් වේ.
- E Billing පාරිභෝගික පදනම ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතින අතර මේ වන විට පාරිභෝගිකයින් 18,500ක් පමණ ලියාපදිංචි වී ඇත.
- LECO කඩදාසි රහිත කාර්යාල සංකල්පයේ කොටසක් ලෙස, සමාගම කඩදාසි බිල්පත් නිකුත් කිරීම නවතා SMS බිල්පත් හඳුන්වා දෙන ලදී. 2023 ජූලි මාසයේදී, LECO පාරිභෝගික පදනමෙන් 1/3ක් (200,000කට ආසන්න) SMS බිල්පත් වෙත පරිවර්තනය කර ඇත. LECO 100% SMS බිල්පත් නිකුතුව 2023 සැප්තැම්බර් 1 සිට ආරම්භ කළේය.
- ශාඛාවේ සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන වල සියලුම අභ්‍යන්තර ක්‍රියාවලීන්ගේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රති-ඉංජිනේරුකරණය හරහා නැවත නිරීක්ෂණය කර ඇත. සියලුම ශාඛා සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන වල නවීකරණය කරන ලද කාර්ය ප්‍රවාහ (Modified work flow) ක්‍රියාත්මක කර ඇත.
- ජාල පාලනය ස්වයංක්‍රීය කිරීම සඳහා අභ්‍යන්තරව දියුණු කරන ලද උසස් බෙදාහැරීම කළමණාකරණ පද්ධතිය හඳුන්වා දෙනු ලැබේ.
- LECO Self Payment Kiosk ජාලය 50% ආවරණයක් ලබා ගනිමින් ස්ථාන 15ක් දක්වා ව්‍යාප්ත කර ඇත.

## 4. 2024 වර්ෂය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති

- **කාර්ය සාධන කළමණාකරණය**

  LECO හි කාර්යක්ෂමතා මට්ටම ඉහළ නැංවීම සඳහා කාර්ය සාධන කළමණාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කර තවදුරටත් සංවර්ධනය කෙරේ.

- **ක්‍රියාවලි පිරිවැය**

  පුද්ගලික ක්‍රියාවලියේ මට්ටම දක්වා පිරිවැය විනිවිදභාවය සහතික කිරීම සඳහා ක්‍රියාවලි පිරිවැය ක්‍රමවේදයක් සමාගම පුරා ක්‍රියාත්මක කෙරේ. පවතින සියලුම වියදම් මධ්‍යස්ථාන ක්‍රියාවලි අවස්ථා මත පදනම්ව වියදම් කරනු ලැබේ.

- **SMART ජාල සංවර්ධන වැඩසටහන**

  ජාලය සහ සේවා මට්ටමේ දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා SMART ජාල උපාංග සමාගම තුළ ජනප්‍රිය කරනු ඇත. සියලුම වාහන වල සහ මෙහෙයුම් කණ්ඩායම්වල ස්ථාපනය කර ඇති ස්ථාන සංවේදක සමග GIS වේදිකාව තවදුරටත් ශක්තිමත් වනු ඇත. දරුණු කාලගුණික තත්වයන් සඳහා සැලසුම් කිරීමේදී දේශගුණික තත්වයන් කියවීම සඳහා උපාය මාර්ගික ස්ථාන වල දේශගුණ සංවේදක ස්ථාපනය කෙරේ. මේ යටතේ රුපියල් මිලියන 500ක වියදමින් SMART මීටර් 100,000ක් සහ රුපියල් මිලියන 350ක් වියදමින් SMART ස්විච 90ක් සහ SMART සුළං හා වැසි සංවේදක 150ක් රුපියල් මිලියන 35ක වියදමින් සවි කිරීමේ ඉලක්කය සපුරා ගැනීමට සැලසුම් කර ඇත.

- **වැඩිදියුණු කළ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන**

  පාරිභෝගික සේවා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම වෙනුවෙන් මෘදුකාංග සහ ඉංජිනේරු විසඳුම් සංවර්ධනය සඳහා පර්යේෂණ සංවර්ධන කටයුතු වැඩිදියුණු කරනු ඇත. බාහිර පර්යේෂකයන්ගේ සහ සංවර්ධකයින්ගේ සේවාවන් මෘදුකාංග සහ ඉංජිනේරු විසඳුම් සංවර්ධනය සඳහා ලබා ගැනීම ආරම්භ කිරීමට සමාගමට හැකි වන පරිදි පර්යේෂණ සහ සංවර්ධන වේදිකාවක් සාදනු ඇත.

- **ADB මූල්‍ය ප්‍රතිපාදන යටතේ අඛණ්ඩ සැපයුම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති**

  විදුලිබල පද්ධතියේ අඛණ්ඩ සැපයුම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ. ඒ අතරින් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට අපේක්ෂිත ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක ණය මුදලක් යටතේ සිදුකිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘතිය විශේෂ වන අතර එය වසර හතරක් ඇතුළත නිම කිරීමට සැලසුම් කර ඇත. LECO හි බෙදාහැරීමේ වෝල්ටියතාවක් ලෙස කිලෝවෝල්ට් 33 හඳුන්වා දීමටත්, අඛන්ඩ සැපයුම වැඩි දියුණු කිරීම සඳහා LECO ජාල සැපයුම ශක්තිමත් කිරීමට සෘජු කිලෝවෝල්ට් 132/33 ජාල උපපොළවල් හඳුන්වා දීමටත් අපේක්ෂා කෙරේ.

- **යටිතල පහසුකම් සංවර්ධනය**

  LECO ප්‍රධාන කාර්යාලයේ ඉදිකිරීම් ව්‍යාපෘති කටයුතු සිදු වෙමින් පවතින අතර එය 2024 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර ඇත.

- **ක්ෂුද්‍ර ජාල සහ ඒකාබද්ධ සැලසුම් හරහා පුනර්ජනනීය බලශක්ති අවශෝෂණය ශක්තිමත් කිරීම**

  LECO විශ්වාස කරන්නේ පුනර්ජනනීය බලශක්ති පිටුබලය සහිත මයික්‍රොග්‍රිඩ් අනාගත විදුලිය බෙදා හැරීමේ ක්‍රමවේදය බවයි. ADB හි තාක්ෂණික සහාය සහ මොරටුව විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක කළ ක්ෂුද්‍ර ග්‍රිඩ් පද්ධතියෙන් ලබාගත් අත්දැකීම් පදනම් කොට ගෙන එක් උපපොළක් සඳහා ක්ෂුද්‍ර ග්‍රිඩ් පද්ධතියක් 2024 වසරේ නිර්මාණය කොට ඉදිරි වසර වලදී අනෙක් උපපොළ සඳහා ද එය ප්‍රතිනිර්මාණය කිරීමට සැලසුම් කර ඇත. මෙම ක්‍රමය බෙදාහැරීමේ ජාලයේ පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශයට ඇති බාධාවලට විසඳුමක් වන අතර එමගින් අඛන්ඩ සැපයුම් වැඩි දියුණු කරන අතරම 70% පුනර්ජනනීය බලශක්ති ඉලක්කය සපුරා ගැනීමේ ප්‍රතිපත්තියට පහසුකම් සපයයි.

- **බලශක්ති ප්‍රතිපත්ති පදනම් කරගත් ව්‍යාපෘති**

  ජාතික බලශක්ති ප්‍රතිපත්ති බෙදාහැරීම් වලට අනුකූලව විදුලි වාහන සඳහා LECO ප්‍රදේශයේ වේගවත් ආරෝපණ මධ්‍යස්ථාන 3ක් හඳුන්වා දීමට සැලසුම් කර ඇත.

  කඩදාසි රහිත කාර්යාල සංකල්පය හඳුන්වා දීමට ගන්නා උත්සාහයන් 2024 දී කාර්යාල කාර්යයන් ස්වයංක්‍රීය කිරීම මගින් තවදුරටත් ශක්තිමත් වනු ඇත.

  කාර්යක්ෂම විදි ලාම්පු කළමණාකරණය සම්පූර්ණයෙන් පාලනය කර ගැනීම සඳහා 2024 දී තවත් විදි ලාම්පු පාලන පැනල 1300ක් ස්ථාපනය කෙරේ.

  USAID සහ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික සහාය ඇතිව ඉල්ලුම් ප්‍රතිචාර (Demand Response) නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමටද සැලසුම් කර ඇත.

# හතරවන පරිච්ඡේදය

# ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

## 1. හැඳින්වීම

2007 අංක 35 දරන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) ශ්‍රී ලංකාවේ සුනිත්‍ය බලශක්ති පරිවර්තනය පිටුපස ඇති ශක්තිමත් බලවේගයයි. SLSEA ජාතියේ සුලභ ව ඇති බලශක්ති සම්පත් - සූර්ය, සුළං, ජලය සහ ජෛව යන බලශක්ති ප්‍රයෝජනයට ගැනීමේ මෙහෙවරක් සමඟින් එහි පාරිසරික වගකීම සහ බලශක්ති ස්වාධීනත්වය ප්‍රවර්ධනය කරමින් බලශක්ති භූ දර්ශනයේ විප්ලවීය වෙනසක් කිරීමට උත්සාහ කරයි. ආරම්භයේ සිටම, ශ්‍රී ලංකාව සඳහා දීප්තිමත්, පිරිසිදු සහ වඩා තිරසාර අනාගතයක් සඳහා මංපෙත් විවර කරමින්, සුනිත්‍ය බලශක්ති සංවර්ධනය සඳහා වූ කැපවීම තුළ SLSEA නොසැලී සිටියි.

**අපගේ දැක්ම**

"තිරසාර හා බලශක්ති සුරක්ෂිත ශ්‍රී ලංකාවක්"

**අපගේ මෙහෙවර**

පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති කළමනාකරණය සහ බලශක්ති තිරසාරත්වය කරා යන ගමන සඳහා නායකත්වය ලබා දීමෙන් සුනිත්‍ය බලශක්ති වටිනාකම් දාමයන් ස්ථාපිත කිරීම, පහසුකම් සැලසීම, නියාමනය කිරීම සහ දැනුම කළමනාකරණය හරහා, රටේ බලශක්ති සංක්‍රාන්තිය සඳහා මග පෑදීම, ජාතික ආර්ථිකයට හා ගෝලීය පරිසරයට ඇති බලපෑම අවම කිරීම

**අරමුණු**

- බලශක්ති සුරක්ෂිතතාව සහ සමාජ-ආර්ථික ජයග්‍රහණ සඳහා පුනර්ජනනීය ද්‍රව්‍ය හඳුනා ගැනීම, ඇගයීම සහ භාවිතා කිරීම.
- සියලුම අංශ හරහා බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම.
- බලශක්ති බෙදා හැරීමේ ආරක්ෂාව, විශ්වසනීයත්වය සහ පිරිවැය-ඵලදායීතාවය වැඩි දියුණු කිරීම.
- සුනිත්‍ය බලශක්ති අරමුණු සහ ජාතික බලශක්ති සුරක්ෂිතතාව සඳහා ප්‍රමාණවත් අරමුදල් සැපයීම සහතික කිරීම.

## 2. මුහුණ දෙන ප්‍රධාන අභියෝග සහ ඒවා ජය ගැනීමට උපාය මාර්ග

වගුව 01 - SLSEA වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අභියෝග

| අංශය | අභියෝග | ජය ගැනීමට උපාය මාර්ග |
|---|---|---|
| රෙගුලාසි ස්ථාපිත කිරීම | නියාමන සංවර්ධනය තීරණාත්මක වන අතර ලාභදායී ද වේ. එය සම්පත්-අධික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලට වඩා ප්‍රමුඛත්වය ගත යුතුය. ගොඩනැගිලි කේත සහ මිණුම් සලකුණු රෙගුලාසි බලශක්ති පරිභෝජනය අඩු කිරීමට කාර්යක්ෂම ක්‍රම වේ. නමුත් පාර්ශවකරුවන්ගේ අවධානය අඩුවීම හේතුවෙන් ඒවා බොහෝ විට ප්‍රමාදයන්ට මුහුණ දෙයි. | මිණුම් දණ්ඩ නියාමනය වැනි රෙගුලාසි ගැසට් කිරීම සඳහා දැනුවත් කිරීම සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අවධානය සක්‍රීයව අපේක්ෂා කිරීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් මැදිහත් වීම අවශ්‍ය වීම. |
| | විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වායු සමීකරණ පරීක්ෂණාගාරයක් නිර්මාණය කිරීම වැනි විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය. අභියෝගවලට අවබෝධතා ගිවිසුම (MOU) අත්සන් කිරීම වැනි දීර්ඝ ක්‍රියා පටිපාටි ඇතුළත් වේ. එසේම, වාර්ෂික අරමුදල් නොමැතිකම නව ව්‍යාපෘති සහ උපකරණ ලේබල් කිරීම සඳහා උපකරණ අත්පත් කර ගැනීම ප්‍රමාද විය හැකිය. | නම්‍යශීලී බව වැඩි දියුණු කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම සහ කැලැන්ඩර වර්ෂයක් තුළ ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන සහතික කිරීම.<br>ISIC යටතේ වැදගත් උපකරණ වර්ගීකරණය කිරීමට ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.<br>අමාත්‍යාංශ මට්ටමේ මැදිහත්වීම සහ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරීම. |

| | | |
|---|---|---|
| | ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ තීරණාත්මක ගැටලුවක් වන්නේ දත්ත හිඟකමයි. මෙය විසඳීම සඳහා, ISIC වර්ගීකරණය යටතේ ආනයනික විදුලි උපකරණ වර්ග කර කළ යුතුය. මෙම වර්ගීකරණය උපකරණ ලේබල් කිරීමේ පද්ධතියකින් බලශක්ති ඉතිරිකිරීම් මැනීමට උපකාරී වේ.<br><br>ISIC වර්ගීකරණයට අනුකූල වීම කාර්යක්ෂම දත්ත රැස් කිරීම, ආයතන හරහා අනුපිටපත් උත්සාහයන් වළක්වා ගැනීම සහ කර්මාන්තශාලා මට්ටමින් නිෂ්පාදනය විධිමත් කිරීම මගින් කාලය සහ සම්පත් ඉතිරි කිරීම සඳහා ඉතා වැදගත් වේ. | බලශක්ති, මූල්‍ය සහ සමාජීය අංශ ආවරණය කරමින් කාර්මික, ගෘහස්ථ සහ වාණිජ දත්ත රැස් කිරීම සඳහා ආයතන ජනලේඛන දෙපාර්තමේන්තුව සමඟ ප්‍රායෝගික ප්‍ර ශ්නාවලියක් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. |
| පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය | ඉඩම් අත්පත් කර ගැනීම ප්‍රමාද වන අතර ඒ අනුව ව්‍යාපෘති පිරිවැය ද වැඩි වේ.<br><br>විවිධ පාර්ශවකරුවන්ගෙන් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අනුමත කිරීම් බොහෝ විට මන්දගාමී වේ.<br><br>ජාතික RE ව්‍යාපෘතිවල ප්‍රමාදය<br><br>RE ව්‍යාපෘති සංවර්ධනය කිරීමේදී නොගැලපෙන ප්‍රතිපත්ති ආයෝජකයින් අධෛර්යමත් කරයි.<br><br>පවතින විදුලිබල ජාලයට විශේෂයෙන් සූර්ය/සුළං සඳහා RE මූලාශ්‍ර ඒකාබද්ධ කිරීම සංකීර්ණ විය හැකිය.<br><br>පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති සංරක්ෂණය පිළිබඳව සාමාන්‍ය ජනතාව තුළ දැනුවත්භාවය සහ අවබෝධය නොමැතිකම ප්‍රගතියට බාධාවක් විය හැකිය. | පුනර්ජනනීය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සමාලෝචනය කිරීම.<br><br>ඉහළ මට්ටමේ ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුවක් පිහිටුවීම.<br><br>අධීක්ෂණ ගැටළු සහ බාධක සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කිරීම.<br><br>නීතිමය හිඩැස් හඳුනා ගැනීම සහ සංශෝධනය කිරීම සහ මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම.<br><br>පුනර්ජනනීය බලශක්ති සඳහා වන ජාලක උත්ශ්‍රේණි ගත කිරීම.<br><br>පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති සංරක්ෂණය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම. |
| මූල්‍ය මැදිහත්වීම | සීමිත අරමුදල් සහ ආර්ථික අර්බුදය ජාතික වශයෙන් 70% පුනර්ජනනීය බලශක්ති ඉලක්කය සහ බලශක්ති කළමනාකරණ මුලපිරීම් සාක්ෂාත් කර ගැනීම සඳහා විශාල අභියෝගයක් වේ. | සෙස් සහ රාජකීය බදු ස්වාධීනව SLSEA වෙත අරමුදල් සපයීම.<br><br>පුනර්ජනනීය බලශක්ති සඳහා ණය සහ දිරිගැන්වීම් සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.<br><br>NDCs සහ SDGs සඳහා හවුල්කරුවන්ගෙන් මූල්‍ය ආධාර ලබාගැනීම. |
| සම්පත් | පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කළමනාකරණ වැඩස-ටහන් ක්‍රියාත්මක කිරීමේදී ඇති ප්‍රධාන ගැටළු අතර මානව සම්පත් හිඟකම සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් ඇතුළත් වේ. | SEA වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් බලශක්ති අමාත්‍යාංශ සමඟ සහයෝගී ප්‍රයත්නයන් ආරම්භ කිරීම.<br><br>සූර්ය, සුළං, වහල මත සූර්ය පද්ධති සවිරීම සහ තවත් දේ ඇතුළු විවිධ සම්පත් වර්ගවලට විවිධාංගීකරණය කිරීමෙන් පුනර්ජනනීය බලශක්ති අංශය පුළුල් කිරීමට සහ සේවක සංඛ්‍යාව වැඩිදියුණු කිරීමට අපට අවශ්‍ය වීම. |

## 3. 2023 දී ප්‍රධාන ජයග්‍රහණ

### (අ) පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය

2023 දී, SLSEA පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා වූ සිය කැපවීම අඛණ්ඩව සිදු කරන ලද අතර, රටේ ස්ථාපිත ධාරිතාවයෙන් සැලකිය යුතු 33.3% ක කොටසක් නියෝජනය කරමින් නව පුනර්ජනනීය බලශක්ති මෙගාවොට් 1,619.4 ක සමුච්චිත ධාරිතාවක් ස්ථාපනය කිරීමට පහසුකම් සපයයි. මෙය නියත වශයෙන්ම පසුගිය වසරේ වාර්තා කළ පුනර්ජනනීය බලශක්ති උත්පාදන කොටසේ විදුලියෙන් 18.6% දක්වා වාර්තා කළ අගයට වඩා ඉහළ ජයග්‍රහණයක් වනු ඇත. පුනර්ජනනීය බලශක්ති අංශයේ වර්ධනය රූප සටහන 01 හි දැක්වේ.




රූප සටහන 01: NCRE සමුච්චිත ධාරිතාව එකතු කිරීම

2023දී, මෙ.වො 30.4ක් ධාරිතාවකින් යුත් පුනර්ජනනීය ව්‍යාපෘති විවෘත කරන ලදී. SPPA ගිවිසුම් ව්‍යාපෘති 12ක් සඳහා අත්සන් කරන ලදී. මෙ.වො 3ක බලශක්ති බලපත්‍රයක් නිකුත් කරන ලදී. 01 වගුවේ විස්තරාත්මකව දක්වා ඇති පරිදි මෙ.වො 17.3ක් ව්‍යාපෘතිවල සඳහා තාවකාලික අනුමැතිය ලබා දෙන ලදී.

වගුව 02: අගෝස්තු අග වන විට නල මාර්ග ව්‍යාපෘති පිළිබඳ විස්තර

| පුනර්ජනනීය බලශක්ති ප්‍රභවය | තාවකාලික අනුමැතිය නිකුත් කරන ලද ව්‍යාපෘති | | බලශක්ති බලපත්‍ර නිකුත් කළ ව්‍යාපෘති | | PPA අත්සන් කළ ව්‍යාපෘති | | විවෘත කරන ලද ව්‍යාපෘති | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො) | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො) | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො) | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො) |
| කුඩා ජල විදුලිය | 5 | 17.3 | - | - | 7 | 10.75 | 2 | 5.4 |
| සුළං | - | - | - | - | 1 | 10 | 1 | 15 |
| සූර්ය (ග්‍රිඩ් සම්බන්ධිත) | - | - | 1 | 3 | 1 | 10 | 5 | 15 |
| ජෛව ස්කන්ධය (ඩෙන්ඩ්‍රෝ) | - | - | - | - | 1 | 10 | - | - |
| කෘෂිකාර්මික සහ කාර්මික අපද්‍රව්‍ය | - | - | - | - | 2 | 6 | - | - |
| නාගරික ඝන අපද්‍රව්‍ය | - | - | - | - | - | - | - | - |
| මුළු RE (මෙ.වො) | | 17.3 | | 3 | | 46.75 | | 30.40 |

3.1 සූර්ය බල සංග්‍රාමය වැඩසටහන SLSEA හි ප්‍රමුඛතම හා වේගයෙන් ඉදිරියට ගිය වැඩසටහන වේ. එහි වර්ධනය රූප සටහන 02 හි දැක්වේ. 2018 වන විට, එය කුඩා පරිමාණයේ සූර්ය PV ව්‍යාප්ත කිරීමේ ජාතික ධාරිතාවක් අත්කර ගනිමින් හා වේගවත් ක්‍රියාවලියක් ඔස්සේ මෙ.වො 100 පසුකරමින් සැලකිය යුතු සන්ධිස්ථානයක් අත්කරගෙන ඇත. ජාතික විදුලිබල පද්ධතියට සූර්ය බලශක්තිය ඒකාබද්ධ කිරීමේ යෝජනා ක්‍රම 3 යටතේ, එනම් ශුද්ධ මැනීම, ශුද්ධ ගිණුම්කරණය සහ ශුද්ධ එකතුව ආදී විවිධ අංශවලින් මෙ.වො. 130 කට වැඩි සූර්ය වහල පද්ධති ස්ථාපිත කිරීමට හැකි වී තිබේ.

රූප සටහන 02: සූර්ය වහල පද්ධතිවල වර්ධනය




2023දී ජූලි මස අවසානය වන විට පාරිභෝගිකයින් 3943 ක් සඳහා මෙ.වො. 82 ක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට SLSEA ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. SLSEA විසින් ඉන්දියානු ක්‍රෙඩිට් රේඛා වැඩසටහන යටතේ රජයේ ගොඩනැගිලි සඳහා මෙ.වො. 80 ක වහල මත සූර්ය PV ස්ථාපනයන් ද, අඩු ආදායම්ලාභී කුටුම්භ සඳහා බැටරි ගබඩා සහිත මෙ.වො. 50 ක වහල සූර්ය PV පද්ධති ද, ආගමික ස්ථාන සඳහා මෙ.වො. 50 ක වහල සූර්ය PV පද්ධති ද ප්‍රගතියක් ලබයි. ඉහත ව්‍යාපෘතිය සඳහා උපදේශක කණ්ඩායම් විසින් ස්ථානවලින් 86%ක් (4098) සමීක්ෂණය කර ව්‍යාපෘති විෂය පථය සංශෝධනය කරමින් සවිස්තර වාර්තාවක් සකස් කර ඇත. තාක්ෂණික විශේෂඥතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණික නිලධාරීන් 600 දෙනෙකු එක්දින පුහුණු වැඩසටහනකට භාජනය කරන ලදී. 90 දෙනෙකු ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සහ PUCSL සමඟ එක්ව NVQ 3 ජාතික මට්ටමේ සහතික ලබා ගත්හ.

## 3.2 කිරිඉබ්බන් වැවේ සහ චන්ද්‍රිකා වැවේ පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති

ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දළ වශයෙන් KRW බිලියන 14.3 ක් සහ KRW බිලියන 6.83 ක ප්‍රදාන අරමුදල් සැපයීමට කොරියාවේ වෙළඳ, කර්මාන්ත සහ බලශක්ති අමාත්‍යාංශය එකඟ වී ඇත. කිරිඉබ්බන් වැව සහ චන්ද්‍රිකා වැව මත මෙ.වො. 1 ක පාවෙන සූර්ය PV පද්ධති ස්ථාපනය කිරීම මෙම ව්‍යාපෘතිවලට ඇතුළත් වේ.

## 3.3 යාපනයේ කුඩා දූපත් වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධතියක් ඉදිකිරීම

මෙම ව්‍යාපෘතිය මගින් යාපනයේ අනලතිව්, ඩෙල්ෆ් සහ නයිනතිව් යන දූපත් වල ප්‍රකාශ වෝල්ටීයතා, සුළං බලය, ඩීසල් උත්පාදක යන්ත්‍රය සහ ලිතියම් අයන ගබඩා බැටරි මත පදනම් වූ දෙමුහුන් බලාගාර සමඟ විදුලිය ජනනය කිරීම අරමුණු කරයි. ප්‍රශස්ත ජනන මිශ්‍රණයට අනුරූප වන බැටරි ආවයනය සහිත PV, සුළං සහ ඩීසල් ප්‍රභවයන්ගේ ධාරිතාව පහත පරිදි වේ.

| දූපත | ඩීසල් ජෙනරේටර් | සෞර උත්පාදනය | සුළං උත්පාදනය | බැටරි ගබඩා |
|---|---|---|---|---|
| නයිනතිව් | 300 kW +500 kW | 700 kW | 200 kW | 1000 kWh (550 kW) |
| අනලතිව් | 150 kW +300 kW | 300 kW | 80 kW | 550 kWh (275 kW) |
| ඩෙල්ෆ් | 300 kW +500 kW | 700 kW | 250 kW | 800 kWh (650 kW) |

3.4 මහා පරිමාණ ජාතික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති SLSEA විසින් මෙ.වො 596ක සම්පූර්ණ ධාරිතාවයකින් සිදු කරනු ලබන අතර එමගින් රටේ වාර්ෂික බලශක්ති අවශ්‍යතාවයෙන් 17% ක් පමණ නියෝජනය කරමින් ගිගාවොට් පැය 2821 ක සම්පූර්ණ විදුලිය ජනනය කරයි. 03 සහ 04 වගුව මගින් සංවිධානයේ පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සහ ජාතික මට්ටමින් සහ ඒවායේ වර්තමාන ප්‍රගතිය සඳහා ඒවායේ සැලකිය යුතු දායකත්වය ඉස්මතු කරයි.

වගුව 03: ජාතික ව්‍යාපෘති පිළිබඳ විස්තර

| විස්තර | ඒකකය | පුනරීන් | මන්නාරම | සියඹලාණ්ඩුව | වෙරවිල් |
|---|---|---|---|---|---|
| ප්‍රතිලාභ | වර්ගය | සුළං | සුළං | සූර්ය | සුළං |
| | ධාරිතාව මෙ.වො | 234 | 286 | 100 | 210 |
| | වාර්ෂික බලශක්ති උත්පාදනය GWh | 807 | 1048 | 180 | 786 |
| | වාර්ෂික $CO_2$ විමෝචන ඉතිරිකිරීම් - ටොන් | 588,948 | 764,830 | 131,364 | 573,622 |
| | වාර්ෂිකව ඉන්ධන ඉතිරිය - ලීටර් මිලියන | 201.7 | 262 | 45 | 196.5 |
| ආරම්භ කළ වර්ෂය | | 2018 | 2020 | 2018 | 2023 |
| විවෘත කිරීමට අපේක්ෂිත | | 2026 | 2026 | 2025 | 2027 |

| ප්‍රගතිය | පුනරීන් | මන්නාරම | සියඹලාණ්ඩුව | වෙරවිල් |
|---|---|---|---|---|
| පෙර ප්‍රගතිය | 2020 දී නිම කරන ලද අඩවි තෝරාගැනීම සහ ශක්‍යතා සහ අදියර i (මෙ.වො. 100) සඳහා පාරිසරික අනුමැතිය 2022 දී ලැබුණු අතර 2022 දී 2 වන අදියර EIA අනුමැතිය ආරම්භ කර ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කරන ලදී. | ස්ථාන තේරීම සහ ශක්‍යතා 2021 දී අවසන් කරන ලදී. පාරිසරික බලපෑම් තක්සේරුව සහ කුරුළු අධ්‍යයනය ඇතුළුව සියලුම අධ්‍යයනවල ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කර 2022 දී EIA ක්‍රියාවලියේ අඩක් නිම කරන ලදී. අදාළ අධිකාරියෙන් සියලුම අනුමැතිය ඉල්ලා ඇත. | ස්ථාන තේරීම සහ ශක්‍යතා අධ්‍යයනය 2020 දී සම්පූර්ණ කරන ලදී. 2022 දී නිම කරන ලද අනෙකුත් අනුමත කිරීම් ඇතුළුව පාරිසරික අනුමැතිය ලැබී ඇත. කාලගුණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇති අතර, ව්‍යාපෘති සංවර්ධනය සඳහා වසරක ගබඩා දත්ත 2022 දී ලබා ගන්නා ලදී. | අදාල නැත |
| 2023 ප්‍රගතිය | අදියර 2 සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සම්පූර්ණ කර ඇති අතර අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අයදුම්පත් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. රජයේ ඉඩම් ලබාගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | කුරුළු අධ්‍යයනය සම්බන්ධයෙන් වනජීවී දෙපාර්තමේන්තු අවධානය හැර අනෙකුත් සියලුම අනුමැතිය ලැබී ඇති අතර පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය අනුමත කිරීමේ ක්‍රියාවලිය අවසන් කරන ලදී.<br><br>ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අයදුම්පත් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | ඉඩම ලබා ගැනීම සඳහා වන කැබිනට් පත්‍රිකාව අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සහ රුක් රෝපණ වැඩ-සටහනක් වැනි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රදානය ලංකා විදුලිබල මණ්ඩලය (සැ) විසින් ටෙන්ඩර් මගින් තෝරාගත් සංවර්ධකයෙකුට ලබා දෙන ලදී. | ස්ථාන තේරීම සහ ශක්‍යතා අධ්‍යයනය 2023 දී අවසන් කරන ලදී. අනෙකුත් අනුමැතියන් ඇතුළුව පාරිසරික අනුමැතිය අපේක්ෂා කෙරේ. වැඩසටහනේ සහාය ඇතිව මෙම පක්ෂි අධ්‍යයනය සිදු කෙරේ. USAID ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන සමඟ පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) ආරම්භ කිරීමට නියමිත අතර උපදේශක සමාගමක් තෝරා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. |

3.5 **2023 දී** SLSEA හි සම්පත් සිතියම්කරණ අංශය පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. එය පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කර මෙ.වො **500**ක් සඳහා ජාතික වනෝද්‍යාන ව්‍යාපෘති ආරම්භ කරන ලදී. තවත් ව්‍යාපෘති **500**ක් සඳහා ඉඩම් අයිතිය හඳුනා ගන්නා ලදී. තාක්ෂණිකව හා පාරිසරික වශයෙන් යහපත් සූර්ය හා සුළං බලාගාර සඳහා අවශ්‍ය නිවැරදි සම්පත් තක්සේරු කිරීම සඳහා මෙම අංශය ඉතා වැදගත් වේ. මෙ.වො. ධාරිතාව **100** ක ව්‍යාපෘති ජාල ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත. **2027** සිට **2030** දක්වා ජාල ඒකාබද්ධ කිරීම සඳහා අනාගත දිශාව අවසන් කර ඇත. SLSEA විසින් වේරවිල් සුළං උද්‍යානය සඳහා ටර්බයින ස්ථාන ද වෙනස් කරන ලද අතර ලංකා විදුලි බල මණ්ඩලයට (CEB) දිගුකාලීන ජනන ව්‍යාප්ති සැලැස්මට (**2023-2044**) ඇතුළත් කිරීම සඳහා මහා පරිමාණ පුනර්ජනනීය ස්ථාන ඉදිරිපත් කරන ලදී.

ජායාරූපය 03 : ප්‍රධාන ව්‍යාපෘතිවල පිහිටීම

**සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතිය**






**පුනරීන් ව්‍යාපෘතිය**





**මන්නාරම සුළං බලශක්ති ව්‍යාපෘතිය**





## (ආ) කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

**SLSE හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ බලශක්ති කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරමින් පවතින අතර ඒවායේ ප්‍රගතිය පහත දැක්වේ.**

- මූල්‍ය හා සිල්ලර අංශය ඉලක්ක කර ගනිමින් අනිවාර්ය බලශක්ති සංරක්ෂණ වැඩසටහනක් දියත් කරන ලදී.

- කාර්මික සහ වාණිජ අංශවල බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සඳහා බලශක්ති කළමනාකරුවන්, විගණකවරුන් සහ සේවා සපයන්නන් ප්‍රතීතනය කරන ලදී.

- උපකරණ බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහන මගින් ශීතකරණ, විදුලි මෝටර, සිටුවා තැබිය හැකි විදුලි පංකා/මේස/බිත්ති විදුලි පංකා සහ ජල පොම්ප සඳහා වන ප්‍රමිතීන්හි ප්‍රගතිය සමඟ බලශක්ති කාර්යක්ෂම නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ඇත. ස්වේච්ඡා LED පැනල් ලයිට් ලේබල් කිරීමේ වැඩසටහනක් දියත් කිරීමත් සමඟ විදුලි මෝටරවල බලශක්ති කාර්යක්ෂමතාව සඳහා මූලපිරීම් සිදු කරන ලදී.

- බලශක්ති කාර්යක්ෂමතාව සහ පුනර්ජනනීය බලශක්ති වැඩසටහන් වල ප්‍රතිපත්තිමය හිඩැස් සහ බාධක හඳුනා ගැනීම සඳහා SLSEA සමීක්ෂණ සහ පර්යේෂණ සිදු කරන ලදී.

- කාර්යක්ෂම ශීතකරණ ප්‍රතිස්ථාපන වැඩසටහන දියත් කරන ලදී.

- වීදි ආලෝක ආදේශ කිරීම සඳහා සුදුසු තාක්ෂණයන් පිළිබඳ අධ්‍යයනයක් ආරම්භ කරන ලදී.

- "සණස සමඟ ගමට", රියදුරු බලපත්‍ර පරීක්ෂණවල බලශක්ති සම්බන්ධ ප්‍රශ්න සහ පාසල් මුලපිරීම් ඇතුළු විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- සංරක්ෂී වැඩසටහනට බලශක්ති මාධ්‍යවේදීන් පුහුණු කිරීම, දැනුවත් කිරීම් සහ මාධ්‍ය සම්බන්ධවීම් ඇතුළත් විය.

- 2023 දී මෙම උත්සාහයන් විවිධ අංශ හරහා බලශක්ති කාර්යක්ෂමතාව සහ තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීමට SLSEA හි කැපවීම පෙන්නුම් කරයි.

## 4. 2024 සඳහා වැඩසටහන්

2024 දී SLSEA ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කිරීමට සූදානම් වේ. නව ස්ථාන 500 මෙ.වො සඳහා සම්පත් හඳුනා ගැනීම සහ හඳුනාගත් ඉඩම් හිමි ස්ථාන සඳහා සම්පත් තක්සේරු කිරීම මෙයට ඇතුළත් වේ. මීට අමතරව, පූනරීන්, සියඹලාණ්ඩුව, මන්නාරම සහ වේරවිල් වැනි දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති 2024 දී පූනරීන් සහ මන්නාරම ව්‍යාපෘති නිම කිරීමේ අරමුණින් අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. SLSEA විසින් ව්‍යාපෘති සංවර්ධකයින්ට බලපත්‍ර නිකුත් කිරීම සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පහසුකම් සැලසීම සිදු කරනු ඇත. 2024 සඳහා මෙගාවොට් 170ක පියසි සූර්ය පද්ධති ස්ථාපනයන් ඉලක්කයක් තබා ඇත.

තවද, රයිස් කුකර්, ප්‍රෙෂර් කුකර්, මේස සහ බිත්ති පංකා සඳහා ප්‍රමිතීන් ප්‍රකාශයට පත් කිරීමට, LED ලාම්පු ප්‍රමිතීන් සංශෝධනය කිරීමට සහ වෙබ් ද්වාරයක් සහ QR කේත සමඟ උපකරණ ලේබල් කිරීමේ වේදිකාව ඩිජිටල් කිරීමට SLSEA සැලසුම් කරයි. SLSEA විසින් විදුලි ජලය තාපාංක උපාංග, විදුලි කුකර් සහ රෙදි සෝදන යන්ත්‍ර සඳහා වන කෙටුම්පත් ප්‍රමිතීන් සංවර්ධනය කිරීම ආරම්භ කරනු ඇත.

මීට අමතරව, SLSEA තේ අංශයේ මිණුම් සලකුණු නියාමනය සඳහා අනිවාර්ය වැඩසටහනක් දියත් කරන අතර බලශක්ති විගණක යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් ආරම්භ කරනු ඇත.

# පස්වන පරිච්ඡේදය

## සී/ස එල් ටී එල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම

LTL HOLDINGS

### 1. ආයතනය පිළිබඳ කෙටි හැඳින්වීමක්

"ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම" යනුවෙන් මීට පෙර හඳුන්වන ලද එල්.ටී.එල් හෝල්ඩින්ග්ස් සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම) යන ආයතන දෙක අතර රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරීත්වය මත පවතින සමාගමක් වන අතර ආයතනයේ අයිතියෙන් 63% කොටසක් ලං.වි.ම.ටද 37% ක කොටසක් එල්.ටී.එල් හෝල්ඩින්ග්ස් සමාගමේ සේවකයන් නියෝජනය කරනු ලබන පුද්ගලික සමාගම් දෙකද සතුව පවතියි. එල්.ටී.එල් හෝල්ඩින්ග්ස් සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, පාකර් වීදියේ අංක 77 දරන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන අතර දශක හතරකට අධික ආයතනික ගමන් මග තුළ සවිමත් යහපත් මෙන් ම ස්ථාවර ප්‍රගතියක් අත්කර ගනිමින් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛ පෙළේ ඉංජිනේරු ආයතනයක් බවට පත්ව තිබේ.

විදුලිය බෙදාහරින ට්‍රාන්ස්ෆෝමර නිෂ්පාදනය කරමින් 1980 දශකයේ මුල් භාගයේ දී ස්වකීය ව්‍යාපාරික කටයුතු ආරම්භ කළ මෙම සමාගම පසුකාලීනව විදුලිබල උත්පාදනය, විදුලි යටිතල පහසුකම් සංවර්ධනය, විදුලිබලය බෙදාහැරීමේ ට්‍රාන්ස්ෆෝමර නිෂ්පාදනය කිරීම සහ ලෝහ සින්ක් තුළ ගිල්වීමෙන් ගැල්වනයිස් කිරීම (Hot Dip Galvanizing) ආදී වශයෙන් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයෙහි සමස්ත අගය දාමය ආවරණය කරමින් සම ආයතනයේ ව්‍යාපාරික කටයුතු විවිධ අංශ ඔස්සේ විවිධාංගීකරණයට බඳුන්ව තිබේ. තවද මෙම සමාගම ශ්‍රී ලංකාව සහ බංගලාදේශය, ටැන්සානියාව, උගන්ඩාව, කෙන්යාව, ඉතියෝපියාව, ඝානාව, ඕමානය, ඉන්දියාව, නේපාලය, ජෝර්දානය, මියන්මාරය, මාලදිවයින් දූපත් සහ ඕස්ට්‍රේලියාව ආදී විදේශීය රටවල විදුලි බලාගාර ආයෝජනය සහ ඉංජිනේරුමය, ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු නිම කිරීම සාර්ථක අන්දමින් ඉටු කර තිබේ.

එල්ටීඑල් හෝල්ඩිංස් සමාගම යනු ශ්‍රී ලංකාවේ විශාලතම ස්වාධීන බලශක්ති නිෂ්පාදකයා වන අතර එහි පරිපාලිත සමාගම් හරහා ජාතික විදුලිබල පද්ධතියට මෙගා වොට් 300 කට වැඩි විදුලියක් සපයනු ලැබේ.

මීට අමතරව 2021 වර්ෂයේදී විදුලිබල අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) විසින් සමාගමේ පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගමක් මෙන් ම බලාගාර මෙහෙයුම් අංශය වන ලක්ධනවි සමාගම වෙත මෙගා වොට් 350 ද්‍රවීකෘත ස්වභාවික වායු මගින් ක්‍රියාත්මක වන ද්විත්ව චක්‍රීය බලාගාරයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතිය සඳහා පිහිටුවා ඇති විශේෂ කාර්ය ඒකකය වන සොබාදනවි සමාගම ලංවිම සමඟ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම ද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ ඉන්ධන සැපයුම් ගිවිසුම ද සහ ශ්‍රී ලංකා රජය සමඟ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම ද ආදී වශයෙන් ව්‍යාපෘතිය හා සම්බන්ධ ගිවිසුම් සියල්ල 2021/2022 දී අත්සන් කරන ලදී. මූලික සිවිල් ඉදිකිරීම් කටයුතු අවසන් වෙමින් පවතින අතර අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ බොහොමයක් පාහේ 2022 ඔක්තෝබර් මාසයේ දී ලැබීමට අපේක්ෂිතය. මෙම බලාගාරය දිවයිනෙහි විදුලිය විසන්ධි කිරීම් නිමා කිරීමේ අරමුණින් 2024 දී සම්පූර්ණයෙන් අවසන් කර ලං.වි.ම ජාතික විදුලිබල පද්ධතියට එකතු කරනු ලැබේ. ඉදිකිරීම් කාර්යයන්හි ප්‍රගතිය මේ වන විට 60% ක් පමණ වන අතර 2024 ජනවාරි මාසයේ බලාගාරයේ පළමුවන අදියර සම්බන්ධයෙන් බලය පැවරීමට නියමිත අතර දෙවන අදියර 2025 ජනවාරි මාසයේ දී ක්‍රියාත්මක කරනු ලැබේ.

පාරිසරික, ඉංජිනේරු, මූල්‍ය සහ අනෙකුත් මූලික ව්‍යාපෘති සංවර්ධන කටයුතු කරගෙන යාමට සමාගමට හැකියාව සලසමින් ව්‍යාපෘති ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ගොඩනැගීම, හිමිකර ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම (BOOT) යන පදනම මත කෙරවලපිටියේ දෙවන මෙගා වොට් 300 ද්‍රවීකෘත ස්වභාවික වායු ඒකාබද්ධ චක්‍රීය බලාගාරයට අදාළව අභිප්‍රාය ලිපිය (LOI) නිකුත් කිරීම සම්බන්ධයෙන් සමාගම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ ලංවිම සමඟ සාකච්ඡා කරමින් සිටී.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායමේ මගපෙන්වීම යටතේ ජාත්‍යන්තර වශයෙන් දැනුම සහිත බලශක්ති අංශයේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ පසුගිය දශක හතරක කාලය තුළ නව්‍යකරණ මෙන්ම නවීන තාක්ෂණය තුළින් ලබා ගත් විශාල අත්දැකීම් සමඟින් වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් සහ මනා ලෙස සම්බන්ධ වූ තරුණ ඉංජිනේරුවන්ගේ කණ්ඩායමෙහි අනුග්‍රහය සහිතව සමාගම දැන් සැලකිය යුතු ලෙස වර්ධනය වී පසුගිය වසර 20 තුළ සාර්ථක ලෙස ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ගමන් කර තිබේ.

ආසියානු කලාපයේ හොඳම ස්වාධීන බලශක්ති නිෂ්පාදකයා (IPP) සඳහා වන කීර්තිමත් ස්වර්ණ සම්මානය ඇතුළත්ව විශිෂ්ට කාර්යසාධනය සඳහා සමාගම විසින් වසර ගණනාවක් පුරා ඉංජිනේරු

විශිෂ්ටත්වය සඳහා වන විවිධ සම්මානයන්ට පාත්‍ර වී තිබේ.

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය පිරිනමන ඉංජිනේරු විශිෂ්ටතා සම්මානය 2015 වර්ෂයේ දී හිමිකර ගන්නා ලදී.
- දකුණු කොරියාවේ පැවති විශිෂ්ට කාර්යසාධනය සඳහා වන ආසියානු බලශක්ති සම්මානය 2016 වර්ෂයේ දී හිමිකරගන්නා ලදී.









## 2. මුහුණදුන් අභියෝග සහ එම අභියෝග ජය ගැනීමට භාවිතා කළ උපක්‍රම:

**මෙගාවොට් 350 සොබාධනවි ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරය ඉදිකිරීම.**

අ). අඛණ්ඩව පවත්නා අනුපාතික බලය නොතකා ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමේ ජාතික වැදගත්කම හේතුවෙන් සහ රට තුළ ඇති වන විදුලිබල හිඟය වළක්වා ගැනීම සඳහා සමාගම ඉදිකිරීම් කටයුතු සඳහා ස්වකීය මූල්‍ය සම්පත් ප්‍රයෝජනයට ගනිමින් සද්භාවයෙන් යුතුව අඛණ්ඩව කටයුතු කළ බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ විදුලිබල මණ්ඩලය දැනුවත්ව සිටියි. අපගේ (SLFM) සමඟින් සමාගම සාධාරණ ගාස්තු ගැලපීමක් සඳහා ඉල්ලීමක් කර ඇති අතර ලංවිමට අපගේ ඉල්ලීම සාධාරණීකරණය කිරීම සඳහා ඉල්ලා සිටින සියලුම තොරතුරු ලබා දී තිබේ.

තවද විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම සඳහා සුදුසු සංශෝධන සිදුකිරීම සඳහා CANC හා PC/CEB සමඟ රැස්වීම් කිහිපයක් පවත්වා තිබේ. 2023 සැප්තැම්බර් 2/3 වැනි දින පැවැත් වූ රැස්වීම් මෙන් ම මෙම කාරණය දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට අපි රැස්වීම් කිහිපයක් ද පවත්වා තිබේ. 2023 වර්ෂයේ සැප්තැම්බර් අග භාගයේදී ධනාත්මක යෝජනාවක් ලැබෙනු ඇතැයි අපි විශ්වාස කරමු. කෙසේ වෙතත් එවැනි සාකච්ඡා අවසන් කිරීම හෝ ඒ හේතුවෙන් විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමෙහි සංශෝධනයක් ක්‍රියාත්මක කිරීම සඳහා කාල නියමය පිළිබඳ ඇඟවීමක් මේ වන තෙක් අපට ලැබී නොමැත.

ආ) ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික තත්ත්වය සහ එහි ණය ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු වන තෙක් ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ අනෙකුත් විදේශීය මූල්‍ය ආයතන සමඟ සාකච්ඡා කළ මුල් ව්‍යාපෘති ණය අත්හිටුවා තිබේ. කෙසේ නමුත් විදුලි බලාගාරයේ ආදායමෙන් පියවීමට යෝජිත තීරුබදු ගැලපුමට යටත්ව රුපියල් බිලියන 45.3 ක ව්‍යාපෘති ණයක් ලබා ගැනීම සඳහා දේශීය බැංකු 9 ක එකමුතුවක් සමඟ කළ සාකච්ඡා සාර්ථක වී තිබේ.

ව්‍යාපෘතියේ විදුලිබල කාර්යසාධන සහතිකය (EPC) මත වෙනස්වන සුලු සහ සර්පිලාකාර ඉදිකිරීම් පිරිවැයේ බලපෑම කළමනාකරණය කිරීම, එනම් බල උත්පාදන ඒකක, පිරියත/උපකරණවල විදුලි හා යාන්ත්‍රික ශේෂය, සිවිල් ඉදිකිරීම්, ඉදිකිරීම්, ස්ථාපනය, බර උපකරණ ප්‍රවාහනය, ඉංජිනේරු සහ අධීක්ෂණ සේවා, පරීක්ෂා කිරීම සහ බලය පැවරීම, උසස් තත්ත්වයට ළඟා වී තිබේ. භාණ්ඩ ප්‍රවාහන ගාස්තු, යන්ත්‍රෝපකරණ/උපකරණ ප්‍රවාහනය, තහවුරු කරන ලද ලිපි සඳහා අධික බැංකු ගාස්තු සහ වැට් බදු දේශීය ව්‍යාපෘති වියදම් ද සැලකිය යුතු අන්දමෙන් ඉහළ ගොස් ඇත. එබැවින්, මෙම තීරණාත්මක අවස්ථාවේදී විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුමෙහි සංශෝධනය නියමිත කාලසීමාව තුළ එය සම්පූර්ණ කිරීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති පිරිවැය සපුරාලීම සඳහා අතිශය වැදගත් වේ.

## 3. සමාලෝචිත කාලසීමාව තුළ සංවර්ධන ව්‍යාපෘතිවල ආයතනික ක්‍රියාකාරකම්වල ප්‍රගතිය (2023 ජනවාරි සිට 2023 අගෝස්තු දක්වා)

### 3.1 කෙරවලපිටිය පිහිටි මෙගාවොට් 300 යුගධනවි ද්විත්ව චක්‍රීය බලාගාරය



| | |
|---|---|
| ස්ථාපිත බලාගාරය | යුගදනවි බලාගාරය, කෙරවලපිටිය, ශ්‍රී ලංකාව |
| | |
| බලාගාරයේ මුළු ධාරිතාව | 300 MW Combined Cycle HFO fired Power Plant |
| GT/ STසැපයුම්කරු | GE France /USA |
| එන්ජින් වර්ගය | GT – Frame 9E, ST SC5 |
| ප්‍රත්‍යාවර්තක වර්ගය | GE 9A5 |
| ආකෘතිය | 2:2:1 |
| යන්ත්‍ර නිමැවුම | එක් යන්ත්‍රයකින් මෙගාවොට් 100 බැගින් |
| යන්ත්‍ර සංඛ්‍යාව | 2 GTs & 1 ST |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවි සුම් කාලසීමාව | 2010 මැයි මස සිට වසර 25 ක් |

2023 අගෝස්තු 31 දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගා වොට් පැය 985.49 ක් වූ අතර අත්කරගත් ශක්ති ප්‍රමාණය 89.17% කි. 2023 වර්ෂය තුළ වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 72% මත පදනම් තිබේ. ලංවිම විසින් බල ශක්තිය සැපයීම සඳහා වන බිල්පත් නොපියවීම ඇතුළත්ව කොවිඩ් 19 වසංගතයේ අහිතකර ප්‍රතිඵල සහ රට තුළ විදේශ විනිමය ක්ෂය වීම හේතුවෙන් විවිධ බාධක සහ බොරතෙල් සහ ඔටෝ ඩීසල් හිඟය ඇතිවුවද බලාගාරය කිසිදු බාධාවකින් තොරව අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර බලාගාරයේ 72% ඉලක්කයට සාපේක්ෂව සමාලෝචිත දින 199 කාලපරිච්ඡේදය තුළ උපයෝජ්‍යතාව 89.17% ක් ලෙස පවත්වාගෙන තිබේ.



## 3.2 කෙරවලපිටියේ පිහිටි මෙගාවොට් 350 ධාරිතාවයෙන් යුතු සොබාධනවි ද්‍රවීකෘත ස්වභාවික වායු ද්විත්ව චක්‍රීය බලාගාරය

ව්‍යාපෘතියෙහි පළමු අදියරෙහි සහ දෙවන අදියරෙහි කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා බලය පැවරීම පිළිවෙළින් 2024 ජනවාරි මස සහ 2025 ජනවාරි සිදුකිරීමේ අපේක්ෂාවෙන් පහත උපලේඛනයේ දැක්වෙන පරිදි ව්‍යාපෘති කටයුතු වලින් 60% ක් පමණ සිදු කර තිබේ.

වැඩබිමෙහි ඉදිකිරීම් කටයුතු සිදු කිරීමේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක් මෙහි දැක්වේ.









| | |
|---|---|
| ස්ථාපනය | සොබාධනවි බලාගාරය, කෙරවලපිටිය, ශ්‍රී ලංකාව |
| බලාගාරයේ මුළු ධාරිතාවය | මෙගාවොට් 350 ධාරිතාවයෙන් යුතු ද්‍රවීකෘත ස්වභාවික වායු ද්විත්ව චක්‍රීය බලාගාරය |
| GT&ST සැපයුම්කරු | සීමන්ස් - ජර්මනිය |
| එන්ජින් මාදිලිය | GT –SG5 1200A ; SST 3000 |
| ඕල්ටනනේටර් වර්ගය | GT –SG5 4000F ; 100A |
| ආකෘතිය | 1:1:1 |
| යන්ත්‍ර නිමැවුම | GT - මෙගාවොට් 220 ¬ ST - මෙගාවොට්130 = මෙගාවොට් 50 |
| යන්ත්‍ර සංඛ්‍යාව | 1 GTs & 1 ST |
| ව්‍යාපෘති ගිවිසුම් | 2021 ජූලි මස 19 වන දින අත්සන් තබන ලදී |
| විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමේ කාලය | 2024 ජනවාරි මස ආරම්භ වන විවෘත චක්‍රය සඳහා ද 2025 ජනවාරි මස ආරම්භ වන දිවිත්ව චක්‍රය සඳහා ද වසර 20 ක කාලයක් සඳහා ත්සන් තබන ලදී. |

### ව්‍යාපෘතියෙහි වර්තමාන තත්ත්වය සහ විශේෂ අවස්ථා

මූලික බැඳීම් කාලය අලුතින් සැලසුම් කර ඇති සම්පූර්ණ කිරීමේ දිනය 2023 නොවැම්බර් 07 වන අතර COD දිනයන් සඳහා අභ්‍යන්තර ඉලක්ක වන්නේ ජනවාරි 2024 (OC) සහ ජනවාරි 2025 (CC) ය.

අනුපාතික බලපෑම සහ නීති සිදුවීම් වෙනස් කිරීම හේතුවෙන් අධික පොලී අනුපාත (ඉදිකිරීම් අතරතුර පොලිය) හේතුවෙන් අධික ව්‍යාපෘති පිරිවැය වැඩිවීම ආවරණය කිරීම සඳහා සොබාධනවි ගාස්තු ගැලපීමක් අපේක්ෂා කරයි. ආසියානු සංවර්ධන බැංකු ණය දින නියමයක් නොමැතිව අත්හිටුවා ඇති බැවින් රටේ වත්මන් පැහැර හැරීම් තත්ත්වය හේතුවෙන් ණය කොටස

ආවරණය වන පරිදි දේශීය බැංකුවලින් වාරික ණයක් ලබා ගැනීම හැරුණු කොට වෙනත් විකල්පයක් සමාගමට නොමැත. මූල්‍ය වසා දැමීම් සාක්ෂාත් කර ගැනීමට අදාළ මූලික බැඳීම් කාලය තුළ වගකීම් ඉටු කිරීමට ඇති නොහැකියාව ඉස්මතු කරමින් 2022 ජූනි 30 වැනි දින අනුපාතික බලපෑම ප්‍රකාශයට පත් කරන ලද අතර පහත කරුණු දක්වනු ලැබේ.

1. ශ්‍රී ලංකාවේ වර්තමාන මූල්‍ය අර්බුදය හා සම්බන්ධ නියමිත අධිකාරීන්හි ක්‍රියාමාර්ග
2. වෙළඳපොළ පිළිබඳ සුදුසුකම්ලත් අධිකාරීන්හි එබඳු ක්‍රියාමාර්ග හේතුවෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵල
3. එබඳු ක්‍රියාමාර්ග සහ පසුව ඇතිවන වෙළඳපොළ වෙනස්කම් ව්‍යාපෘතිය කෙරෙහි බලපාන ආකාරය

වර්තමානයේ දී රටේ ද්‍රවශීලතා තත්ත්වය තරමක් දියුණු වී ඇති අතර ඇමෙරිකානු ඩොලර් අවශ්‍යතා සපුරාලීමට බැංකු කැමැත්තෙන් සිටී. ලක්ධනවි මේ වනවිටත් කොටස් දායකත්වය අනුව එහි සීමාවන් කරා ළඟා වී ඇති නිසාත් එහි කාරක ප්‍රාග්ධන ණය බහුතරය අවසන් වී ඇති නිසාත් සෝබාධනවි සමාගමට වහාම ලංකා රුපියල් වලින් කාලීන ණය සුරක්ෂිත කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, වර්තමාන විදුලිබල මිලදීගැනීම් ගිවිසුම් ව්‍යුහය යටතේ දේශීය බැංකු හරහා ණය මූල්‍යකරණය ශක්‍ය නොවන අතර එය විසඳීම සඳහා විදුලිබලය මිලදීගැනීමේ ගිවිසුම සංශෝධනය කළ යුතුය.

අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව (CANC), ලංකා විදුලිබල මණ්ඩලය (CEB)සහ ව්‍යාපෘති කමිටුව (PC) ගාස්තු සංශෝධනය සඳහා අවශ්‍ය සංශෝධන පිළිබඳව සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති අතර 2023 සැප්තැම්බර් මස අග භාගයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කෙරේ. විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම සංශෝධනය කිරීම මත ගාස්තු සංශෝධනය සඳහා මාස 1-2 ක් ඇතුළත මූල්‍ය වසා දැමීම සාක්ෂාත් කරගත හැකිය.

මේ අතර අදාළ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙහි ප්‍රගතියක් ලබමින් සිටින අතරතුර ව්‍යාපාරික මණ්ඩලය විසින් රුපියල් බිලියන 44.5 ක මූල්‍යකරණය සඳහා මූලික බැඳීමක් ලෙස පහත ලැයිස්තුගත කර ඇති බැංකුවලින් ණය කමිටු අනුමැතිය ලබා ගැනීමට සොබාධනවි සමත් වී ඇත.

| බැංකුවේ නම | විශේෂ කරුණු | මුදල රුපියල් බිලියන වලින් Bn |
|---|---|---|
| හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුව, කොමර්ෂල් බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව සහ එන්ඩීබී බැංකුව | බිලියන 6 බැගින් | 36.0 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | | 5.0 |
| කාර්ගිල්ස් බැංකුව | | 2.5 |
| **ජාතික ඉතිරිකිරීමේ බැංකුව** | | 1.0 |
| **එකතුව** | | 44.5 |

සවිස්තරාත්මක ඉංජිනේරු ක්‍රියාකාරකම් වේගවත් කර ඇති අතර විවෘත චක්‍ර ආශ්‍රිත සවිස්තරාත්මක ඉංජිනේරු කටයුතුවලින් 97% කට වඩා අවසන් කර තිබේ. ST සහායක මොඩියුලය, වැඩමුළු ගොඩනැගිල්ල," ST SEE ට්‍රාන්ස්ෆෝමරය" ST PCC සිසිලන ජලනල ආධාරක" ST GCB" ජල පවිත්‍රාගාරය සහ Mixed Bed සම්බන්ධ පදනම් චිත්‍ර කිහිපයක් හැර විවෘත චක්‍ර ආශ්‍රිත අත්තිවාරම් සැලසුම් සහ චිත්‍රවලින් 97%ක් සම්පූර්ණ කර ඇති අතර ඒකාබද්ධ චක්‍ර ආශ්‍රිත පදනම් සැලසුම් සහ චිත්‍ර වලින් 86%ක් සම්පූර්ණ කර තිබේ.

යාන්ත්‍රික සැලසුම් ක්‍රියාකාරකම් ද සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරන අතර ඉතා වැදගත් පද්ධති සැලසුම් 2.3 වගන්තියට අනුව සම්පූර්ණ කර තිබේ. (විවෘත චක්‍ර සැලසුම් වලින් 95% සහ ඒකාබද්ධ චක්‍ර සැලසුම් වලින් 90%). විද්‍යුත් සැලසුම්වලට අදාළව මූලික සමාකරණ සහ මූලික ඉංජිනේරු කටයුතු අවසන් කර ඇති අතර සම්පූර්ණ විදුලි සැලසුම් ක්‍රියාවලිය ප්‍රගතියෙන් 94.5%කට ළඟා වී තිබේ. විදුලි සැලසුම් සම්බන්ධ විස්තර සඳහා කරුණාකර 2.2 වගන්තිය බලන්න.

ප්‍රසම්පාදන සාකච්ඡා සහ ක්‍රියාකාරකම් ඉදිරියට යමින් පවතින අතර සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක වේ. 2022 දෙසැම්බර් සිට 2023 අගෝස්තු දක්වා මාසවලදී ඇමෙරිකානු ඩොලර් මිලියන 11.2 ක් වටිනා ණයවර ලිපි සනාථ කරන ලද අතර, 2023 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවලදී ඇමෙරිකන් ඩොලර් මිලියන 6.3ක් වටිනා ණයවරලිපි තැන්පත් කිරීමට අපේක්ෂා කෙරේ.

### 3.3. රාජ් ලංකා විදුලි බලාගරය, නටෝර්, බංගලාදේශය

| ස්ථාපිත බලාගාරය | රාජ් ලංකා විදුලි බලාගාරය, නටෝර්, බංගලාදේශය |
|---|---|
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 52.2 |
| එන්ජින් සැපයුම්කරු | වාර්ට්සිලා පින්ලන්තය |
| එන්ජින් වර්ගය | W20V32 |
| යන්ත්‍ර නිමැවුම | මෙගාවොට් 8.9 |
| යන්ත්‍ර සංඛ්‍යාව | 6 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2014 ජනවාරි මස සිට වර්ෂ 15 ක් |



රාජ් ලංකා විදුලි බලාගාරයේ 2023 අගෝස්තු දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 31.7 ක් වූ අතර එම කාලය සඳහා අත්කරගත් උපයේජ්‍යතාව 10.5% ක් වන අතර අත්කරගත් සමස්ත උපයෝජ්‍යතාව 94.30% කි. 2023 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 90% ට වඩා වැඩි අගයක් මත පදනම් වී ඇත. ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි ශ්‍රී ලංකාවට අයත් ප්‍රථම තාප බලාගාරය මෙයයි.

### 3.4 ලක්ධනවි බංග්ලා විදුලි බලාගාරය, කොමිලා, බංගලාදේශය

| ස්ථාපිත බලාගාරය | ලක්දනවි බංග්ලා විදුලි බලාගාරය, කොමිලා, බංගලාදේශය |
|---|---|
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 52.2 |
| එන්ජින් සැපයුම්කරු | වාර්ට්සිලා ෆින්ලන්තය |
| එන්ජින් වර්ගය | W20V32 |
| යන්ත්‍ර නිමැවුම | මෙගාවොට් 8.9 |
| යන්ත්‍ර සංඛ්‍යාව | 6 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2014 දෙසැම්බර් මාසයේ සිට වසර 15 ක් |



ලක්දනවි බංගලාදේශය බලාගාරයේ 2023 අගෝස්තු 31 දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 99.58 ක් වූ අතර එම කාලසීමාව සඳහා වන සාමාන්‍ය බලාගාර සාධකය 32.8% ක් විය. අත්කරගත් උපයෝජ්‍යතාව 93.89% කි. 2023 වර්ෂය සඳහා වාර්ෂික උප බලාගාර සාධකය යෝජ්‍යතා ඉලක්කය 90% ට වඩා වැඩි අගයක් මත පදනම් වී තිබේ.

### 3.5 ෆෙනි ලංකා විදුලි බලාගාරය, ෆෙනි, බංගලාදේශය

| ස්ථාපිත බලාගාරය | ෆෙනි ලංකා විදුලිබලාගාරය, |
|---|---|
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 114 |
| එන්ජින් සැපයුම්කරු | වාර්ට්සිලා ෆින්ලන්තය |
| එන්ජින් වර්ගය | 18V50 හයක් සහ W20V32 එකක් |
| යන්ත්‍ර නිමැවුම | 18'415*6 + මෙගාවොට් 9.78*1 |
| යන්ත්‍ර සංඛ්‍යාව | 7 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2019 නොවැම්බර් මස සිට වසර 15 ක කාලයක් |



2023 අගෝස්තු 31 දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 197.60 ක් වූ අතර සාමාන්‍ය බලාගාර සාධකය 9.8% ක් විය. අත කරගන්නා ලද උපයෝජ්‍යතාව 97.02% විය. 2023 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 92.00% ට වඩා වැඩි අගයක් මත පදනම් වී ඇත.

### 3.6 පවන්දනව් සුළං බලාගාරය, නොරොච්චෝලෙ

| | |
|---|---|
| ස්ථාපිත බලාගාරය | පවන්දනව් සුළං බලාගාරය, ඉලන්තඩිය, නොරොච්චෝලෙ |
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගා වොට් 9.8 |
| ටර්බයිම සැපයුම්කරු | .මේසා |
| ටර්බයිම වර්ගය | G58 |
| ටර්බයිම නිමැවුම | කිලෝවොට් 850 |
| ටර්බයිම සංඛ්‍යාව | 12 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2012 සැප්තැම්බර් මාසයේ සිට වසර 20 ක් |



2023 අගෝස්තු 31 දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 15.8 ක් වන අතර ළඟාකරගත් බලාගාර සාධකය 27.5% කි. 2023 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 97.5% මත පදනම් වී ඇත. සමාලෝචිත වර්ෂය තුළ මෙම බලාගාරයෙහි වාරික නඩත්තු සේවා ඉටු කරන ලදී.

### 3.7 බෙලිහුල්ඔය පිහිටි නිව්දු කුඩා ජල විදුලි බලාගාරය

| | |
|---|---|
| **ස්ථාපිත බලාගාරය** | **බෙලිහුල්ඔය නිව්දු කුඩා ජල විදුලිබලාගාරය** |
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 2.2 |
| ටර්බයිම සැපයුම්කරු | Wasserkraft VoLK AG, ජර්මනිය |
| ටර්බයිම වර්ගය | Horizontal Turbo Impulse |
| ටර්බයිම නිමැවුම | මෙගාවොට් 1.1 |
| ටර්බයිම සංඛ්‍යාව | 2 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2023 මැයි මස සිට වසර 15 ක් 1 වන දිගුව 22.05.19 දින කල් ඉකුත් විය 2 වන දිගුව 2038.12.31 දක්වා වලංගු වේ. |

2023 අගෝස්තු දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 3.5 ක් වූ අතර බලාගාර සාධකය 28% කි. 2023 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 95.00% මත පදනම් වී ඇත. විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම 2038 දෙසැම්බර් මස 31 දක්වා දීර්ඝ කර තිබේ.

### 3.8 අසුපිනිඇල්ල කුඩා ජලවිදුලි බලාගාරය

| | |
|---|---|
| ස්ථාපිත බලාගාරය | උසු පිනිඇල්ල කුඩා ජලවිදුලි බලාගාරය, අරණායක |
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 4 |
| ටර්බයින සැපයුම්කරු | VA Tech Hydro |
| ටර්බයින සැපයුම්කරු | Horizontal Pelton |
| ටර්බයින නිමැවුම | මෙගාවොට් 2 |
| ටර්බයින සංඛයාව | 2 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2005 නොවැම්බර් මස සිට වසර 15 ක් 1 වන දිගුව 2025.10.30 දක්වා වලංගු වේ. |



2023 අගෝස්තු මස 31 දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 6.2 ක් වන අතර ළඟාකරගත් ගත් බලාගාර සාධකය 27% කි. 2023 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 95% මත පදනම් වී ඇත. විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම 2025 ඔක්තෝබර් මස 30 දක්වා දීර්ඝ කර තිබේ.

### 3.9 මෙගා වොට් 10 ක ධාරිතාවයෙන් යුතු මකරිගාඩ් ජල විදුලි (පුද්ගලික) සමාගම, නේපාලය





| | |
|---|---|
| **ස්ථානය** | ජල මූලාශ්‍රය - දුරින් පිහිටි පෙරදිග නේපාලයේ කන්දේශ්වරීහි චර්මෙලියා නදියෙහි සහ ධර්චුලා දිස්ත්‍රික්කයේ ගුජාර් ගම්මානයේ අතු ගංගාවක් වන මකරිගාඩ් |
| සමස්ත බලාගාර ධාරිතාව | මෙගාවොට් 10 |
| බලශක්තිය - අලෙවි කළ හැකි ගිවිසුම්ගත | 74.1 MU<br>69.8 MU |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | අත්සන්කර තිබේ |
| ටර්බයිම නිමැවුම | WkV - ජර්මනිය |
| ටර්බයිම වර්ගය | Horizontal 2 Jet Pelton |
| ජල ප්‍රභවය | වර්ෂය පුරාම වර්ෂාපතනය සහ හිම පතනය |

බලාගාරයේ වාණිජ ක්‍රියාකාරකම් 2023 මාර්තු මස 11 වන දින සිට සාර්ථකව ක්‍රියාත්මක වේ. 2023 අගෝස්තු මස 31 වන දින දක්වා බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 22.8 ක් වන අතර COD වලින් 58% ක් බලාගාර සාධකයක් අත්කරගෙන තිබේ. එල්ටීඑල් හෝල්ඩිංස් පුද්ගලික සමාගමේ පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගමක් වන එල්ටීඑල් එනර්ජි (පුද්.) සමාගමේ කොටස් හිමිකාරීත්ව ව්‍යුහය පහත වගුවේ දක්වා තිබේ.

| අනු අංකය | කොටස් හිමිකරුවන් | කොටස් ප්‍රමාණය | කොටස් හිමිකාරීත්ව අනුපාතය |
|---|---|---|---|
| 1 | එල්ටීඑල් එනර්ජි පුද්. සමාගම | 8,173,361 | 99.17% |
| 2 | ස්කයි පවර් රිනීවබලස්, LLC | 68,389 | 0.83% |
| | | 8,241,750 | |

## 3.10 සියඹලාණ්ඩුවේ පිහිටි මෙගාවොට් 100 සූර්ය බල අංගන පහසුකම

ලක්දනවි සමාගම විසින් සීමාසහිත වයින්ඩ් ෆෝර්ස් පීඑල්සී සහ ද බ්ලූ සර්කල් (පීටීඊ) ලිමිටඩ් ඒකාබද්ධ ව්‍යාපාර හවුල්කාරිත්වය සහිතව 2022 දෙසැම්බර් 02 වැනි දින ලංසුව ඉදිරිපත් කරන ලදී. අපගේ ආයතන සමූහය එකම සුවිශේෂී ලංසුකරු වූ අතර ලංසුව 2023 ජනවාරි 24 වැනි දින විවෘත කරන ලද අතර ලංවිම විසින් ලංසු ප්‍රදාන ලිපිය නිකුත් කරන ලදී. ලක්දනවි සමාගම විසින් මෙම ව්‍යාපාර සමූහයේ ප්‍රධාන සාමාජිකයා ලෙස ලක්ධනවි ආයතනයේ බැංකු පහසුකම් ප්‍රයෝජනයට ගනිමින් එක්සත් ජනපද ඩොලර් 267,900ක ලංසු බැඳුම්කරය ව්‍යාපාර සමූහයේ නමින් ලංවිම වෙත ලබා දෙන ලදී.

මෙම ව්‍යාපෘතියට අන්තර් සම්බන්ධතා ලක්ෂ්‍යයේ දී මෙගාවොට් 100 (AC) දක්වා විදුලි බලයක් සැපයීමේ හැකියාව ඇති අතර බලාගාරයේ සැලසුම් ආයු කාලය වසර 20 ක් වේ. ව්‍යාපෘතියේ විෂය පථය වන්නේ ව්‍යාපෘති ඉඩම් බදු දීම, සැලසුම් කිරීම, මූල්‍යකරණය, ඉදිකිරීම, අයිති කර ගැනීම සහ ගොඩනැගීම, අයිතිය, ක්‍රියාත්මකකිරීම සහ පැවරීම පදනම් කරගෙන විදුලි පද්ධතිය සම්බන්ධිත උපයෝගිතා පරිමාණ සූර්ය බලාගාර අංගනයක් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීමයි. එහි ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ඇමෙරිකන් ඩොලර් මිලියන 154 ක් වන අතර, එය 70:30 ණය අනුපාතයක් මත වේ. ව්‍යාපාර සමූහයෙහි කොටස් The Blue Circle (PTE) Ltd - 40%, WindForce PLC - 30% සහ Lakdhanavi Ltd - 30% යන ආයතන වල කොටස් වලින් සමන්විත වේ.

සම්මුතිය වෙනුවෙන් විශේෂ ව්‍යාපෘති ඒකකය (PV) "රිවිධනවි" නමින් ව්‍යාපාර සමූහය වෙනුවෙන් ස්ථාපිත කර ඇත/සංස්ථාගත කරන ලද අතර සම්පත් බැංකුවේ පහසුකම් භාවිතා කරමින් 2023 සැප්තැම්බර් මස 15 වන දින ලංවිම වෙනුවෙන් සහ මූලික වගකීම් බැඳුම්කර (POB) ඇති කරන ලදී. කරන ලදී. ව්‍යාපෘති ගිවිසුම් අත්සන් කිරීම සහ විදුලි බලය මිලදී ගැනීම පිළිබඳ සාකච්ඡා සිදු වෙමින් පවතී.

### 3.11 ට්‍රාන්ස්ෆෝමර නිෂ්පාදනය සහ අලෙවිය



අඟුලාන ට්‍රාන්ස්ෆෝමර යන්ත්‍රාගාරය අලෙවිය සඳහා පිටත් කිරීමට සූදානම් කර ඇති ට්‍රාන්ස්ෆෝමර

2023.01.01 සිට 2023.08.31 දක්වා කාලය සඳහා වාර්තා වුණු නිෂ්පාදනය පහත පරිදි වේ

| ජන.-අගෝ | | 2023 | 2022 |
|---|---|---|---|
| (අ) | ලංවිම / ලංකා විදුලි පෞද්ගලික සමාගම වෙත සපයන ලද ට්‍රාන්ස්ෆෝමර් සංඛ්‍යාව | 1421 | 760 |
| (ආ) | වෙනත් දේශීය ගනුදෙනුකරුවන් වෙත සපයන ලද සමාගම වෙත සපයන ලද ට්‍රාන්ස්ෆෝමර් සංඛ්‍යාව | 20 | 125 |
| (ඇ) | වෙනත් රටවලට අපනයනය කරන ලද සමාගම වෙත සපයන ලද ට්‍රාන්ස්ෆෝමර් සංඛ්‍යාව | - | - |
| | මුළු නිෂ්පාදනය | 1441 | 885 |

ග්‍රාමීය විද්‍යුත්කරණය සංවර්ධනය වීමත් සමඟ ලංවිම වෙත බෙදාහැරීමේ ට්‍රාන්ස්ෆෝමර් සැපයුම සමාලෝචිත කාලසීමාවට සාපේක්ෂව අංක 661 කින් වැඩි කර ඇති අතර එය 86% ට සමාන වේ. දේශීය පාරිභෝගිකයන් වෙත බෙදාහැරීමේ ට්‍රාන්ස්ෆෝමර් සැපයීම අදාළ කාලසීමාවට සාපේක්ෂව 105 කින් අඩුවීමක් පෙන්නුම් කරයි. මේ වන තෙක් අපනයන අරමුණු සඳහා ඇණවුම් මේ දක්වා ලැබී නොමැත අතර අනුමාන වශයෙන් ඊට හේතුව ලොව පුරා පවතින ආර්ථික තත්ත්වය විය හැකිය.



එල්.ටී.එල් සමාගම "මිඩ්ල් ඊස්ට් එනර්ජි (MEE 2020)" ප්‍රදර්ශනයට සහභාගීවීම

### 2023 වර්ෂය සඳහා සැලසුම් කරන ලද වැඩි දියුණු කිරීම

සුහුරු කම්හල් කළමනාකරණ සහ සෙවීම් කළමනාකරණ මෘදුකාංගය වැඩිදියුණු කිරීම

▪ **සේවා ස්ථාන ඉංජිනේරු සහ ප්‍රමිතිකරණ ව්‍යාපෘතිය**

අ) නිෂ්පාදන බිම් ක්‍රියාකරුවන්ගේ වැඩ අධ්‍යයන සැකැස්ම අඛණ්ඩව වැඩිදියුණු කිරීම
ආ) එක් එක් අවස්ථාවේ දී නිෂ්පාදන ක්‍රියාවලිය ප්‍රශස්ත කිරීම සහ ලාභ නොලබන නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම

- **තුනී පිරිසැලැස්ම සහ VSM සම්බන්ධක ව්‍යාපෘතිය**

අ) සකසන ලද කන්බන් ද්‍රව්‍ය ලැයිස්තු එස් පහ (5S) ක්‍රියාත්මක කිරීම සහ දෘශ්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
අ) නිෂ්පාදන වැඩපොළේ සහ මුළු කර්මාන්ත ශාලාවේ පවතින 5S තවදුරටත් වැඩිදියුණු කිරීම.
ඉ) දෘශ්‍ය කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ සුහුරු කම්හල් නිෂ්පාදනය සමඟ ඒකාබද්ධ කිරීම.

- වර්ගය පරීක්ෂා කරන ලද OLTC ට්‍රාන්ස්ෆෝමර් සැලසුම කිරීම සහ දිරාපත්විය හැකි ට්‍රාන්ස්ෆෝමර් සහ සමාගම් නිෂ්පාදනයට හඳුන්වා දීම.
- ශ්‍රී ලංකා රුපියල් මිලියන 35 ක පමණ වියදම්කර ගොඩනැගිලි වැඩිදියුණු කිරීමල රථගාල ඉදිකිරීම, මායිම් තාප්පය ඉදිකිරීම, විදුලි ජනක ශබ්ද ආරක්ෂණ ව්‍යාපෘතිය සහ එසවුම් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය.

### 3.12 සපුගස්කන්ද පිහිටි බලාගාර ගැල්වනයිස් කිරීම සහ ෆැබ්‍රිකේට් කිරීම



නිෂ්පාදන විස්තර - ගැල්වනයිසින් බලාගාරය

| කාල සීමාව | 2023 (ජන. - අගෝ.) | 2022 (ජන. - අගෝ.) | විචලයතාව |
|---|---|---|---|
| **නිෂ්පාදනය** | **මෙට්‍රික් ටොන්** | **මෙට්‍රික් ටොන්** | **මෙට්‍රික් ටොන්** |
| ලංවිම | 1,143 | 550 | 593 |
| පුද්ගලික ආයතන | 3,996 | 5,716 | (1,720) |
| එකතුව | **5,139** | **6,266** | **(1,127)** |

පෞද්ගලික ආයතනයන්හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අමුද්‍රව්‍ය හිඟය සහ අසීමිත මිල ගණන් හේතුවෙන් සැලකිය යුතු අන්දමෙන් අඩුවීමෙන් මෙම වර්ෂයේ නිෂ්පාදනය පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට වඩා මෙට්‍රික් ටොන් 1, 127 කින් අඩුවී තිබේ.

පෞද්ගලික ආයතනයන්හි යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අමුද්‍රව්‍ය හිඟය සහ අසීමිත මිල ගණන් හේතුවෙන් සැලකියයුතු අන්දමෙන් අඩුවීමෙන් මෙම වර්ෂයේ නිෂ්පාදනය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට වඩා මෙට්‍රික් ටොන් 1, 127 කින් අඩුවී තිබේ.

විද්‍යුත් සම්ප්‍රේෂණ මාර්ග සඳහා විශේෂයෙන්ම ග්‍රාමීය විද්‍යුත්කරණ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ගැල්වනයිස් කරන ලද වානේ ව්‍යුහ සපයා ගැනීමේදී ලංවිම අඛණ්ඩව සහයෝගය ලබා දෙයි. මෙම පහසුකම් සැසීමේ ප්‍රගතියට පහත සඳහන් බාධාවන් සැලකිය යුතු ප්‍රමාණයකට බලපා තිබේ.

**ටෙන්ඩර් අවලංගු කිරීම:**

2022 § වානේ මිල ඉහළයාම බොහෝ ටෙන්ඩර් අවලංගු කිරීමට හේතු විය. ද්‍රව්‍යවල මිල ඉහළ යාම නිසා සැලසුම් කළ පරිදි ව්‍යාපෘති ඉදිරියට ගෙන යාම මූල්‍යමය වශයෙන් අභියෝගාත්මක විය.

**ගැල්වනයිස් කිරීමේ මිල උච්චාවචනය:**

ගැල්වනයිසින් මිල 2022 රු. 98 ක් වූ නමුත් එය රු. 2023 දී රු. 198 ක් දක්වා ඉහළ ගියේය. . මෙසේ උග්‍ර ලෙස මිල ඉහළ යාම පිරිවැය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ඔවුන්ගේ ව්‍යාපෘති සඳහා විකල්ප විසඳුම් සෙවීමට පාරිභෝගිකයින් පොළඹවන ලදී.

එල්ටීඑල් ගැල්වනයිස්කරුවන් 2020 පෙබරවාරි 20 සිට 23 දක්වා පැවති Architect 2020 ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ අතර කාර්මික විශිෂ්ටත්වය සඳහා ක්‍ෂෂ Achiever Award 2019 හි ජාතික මට්ටමේ නිෂ්පාදන අංශයේ කුසලතා සම්මානය ලබා ගත්තේය.






### 3.13 ඒසියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විච්ජියර් (පුද්ගලික) සමාගම, නවදිල්ලිය,ඉන්දියාව





සමාලෝචිත කාල සීමාව තුළ ස්ථාවර ප්‍රගතියක් ලබා තිබේ. ඒසියාටික් හොඳ මූල්‍ය තත්ත්වයක පවතින අතර ඉන්දියන් රුපියල් මිලියන 784.66 ක විකුණුම් ආදායමක් වාර්තා කර තිබේ (අපනයන රු.මි. 348.99 + දේශීය 2023 ජනවාරි සිට 2023 අගෝස්තු 31 දක්වා රු.මි. 435.67) සහ පෙර බදු ශුද්ධ ලාභයක් ලබා තිබෙන අතර සහ මෙය ස්ථාවර ප්‍රවණතාවයකි.මෙම තත්ත්වය සාර්ථකව ඉදිරියට ගමන්කර තිබේ. පසුගිය 2022/23 මූල්‍ය වර්ෂයේදී, සමාගම ඉනදියන රුපියල් බිලියන 1 ක වාර්තාගත පිරිවැටුමක් ලබා ගත් අතර එය ඒසියාටික් ඉතිහාසයේ වාර්තා කළ ඉහළම අගය වේ. ඒසියාටික් පාරිභෝගික තෘප්තිය මත වර්ධනය වන අතර පාරිභෝගික තෘප්තිය කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර තිබේ. ඒසියාටික් හි සාර්ථකත්වය සඳහා හේතු වන්නේ වන්නේ ඔවුන්ගේ කණ්ඩායම් වැඩ, කැපවීම සහ අවසාන පාරිභෝගික තෘප්තිය ලබා ගැනීම සඳහා වන අඛණ්ඩ උත්සාහයයි.

ඒසියාටික් ලොව පුරා ස්වකීය පා සටහන් තබා ඇති අතර DEWA Dubai"Abu Dhabi,MEW Oman,MEW Kuwait,EWA Bahrain,EAC Cyprus,Kahramaa,EEU Ethiopia,CEB Sri Lanka,Eskom දකුණු අප්‍රිකාව, KPLC ආදී ලොව පුරා ඇති සියලුම ප්‍රධාන සේවා සපයන ආයතනයන්හි අනුමත කර ඇත. ඉහත ආයතන හැරුණු විට එය නිතිපතා එක්සත් රාජධානිය, උගන්ඩාව, ඝානාව, නේපාලය, බංගලාදේශය සහ වෙනත් රටවලට සිය නිෂ්පාදන අපනයනය කරනු ලැබේ.

ඉන්දියාවේ, JVVNL ජයිපූර්, AVVNL- අජ්මීර්, JdVVNL- ජෝද්පූර්, BEST-මුම්බායි"BSES- දිල්ලිය, TPDDL- දිල්ලිය, MPPVVC- මධ්‍ය ප්‍රදේශ්, බෙස්කොම් බැංගලෝර්, KSEB-කේරළ වැනි සියලුම ප්‍රධාන විදුලි බෙදාහැරීමේ සමාගම් වෙත ඒසියාටික් ස්වකීය නිෂ්පාදන සපයනු ලැබේ. ඉහත ආයතන හැරුණුවිට අපි රජයේ සහ පෞද්ගලික ව්‍යාපෘති සඳහා සේවා සපයන දේශීය කොන්ත්‍රාත්කරුවන්ට සැලකිය යුතු MV පැනල් ප්‍රමාණයක් සපයන්නෙමු.

**මුහුණ දුන් අභියෝග සහ යොදාගත් උපක්‍රම:**

- ඉන්දියාවේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් බැංකු සීමාවන් අඩු කිරීමත් සමඟ සමාගම වෙළඳපොලේ දැඩි තරඟයකට සහ ඇතැම් අමුද්‍රව්‍ය සඳහා හිඟයකට මුහුණ දුන්නේය.

- ගැටළු විසඳීම සඳහා අනුවර්තනය කරන ලද උපාය මාර්ග අතරට සැලසුම් ප්‍රශස්තිකරණය, නව සැපයුම්කරුවන් ආකර්ෂණය කර ගැනීම සහ ක්‍රියාවලි කාර්යක්ෂමතා ක්‍රම යොදා ගනිමින් අමුද්‍රව්‍ය පිරිවැය අඩු කිරීම සහ අරමුදල් අවශ්‍යතා සඳහා මව් සමාගමේ මැදිහත්වීම ලබා ගැනීම ඇතුළත් වේ.

## 2024 වර්ෂය සඳහා කාර්යසාධනය

අ) ඒසියාටික් 2024/25 දී නිෂ්පාදන ආයෝජන කළඹ වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර සංයුක්ත උපපොළවල්, 33 kV VCB Kiosks, 11 kV බිම සවිකර ඇති බ්‍රේකර්, 11 සහ 33 kV පෝසිලේන් ක්ලැඩ් වැනි VCB පැනල් ආදිය නව නිෂ්පාදන එකතු කිරීමට සැලසුම් කරමින් සිටියි.

ආ) සමාගම ඉන්දියාවේ සේවා සැපයීම් 3-4 කෙරෙහි අවධානය යොමු කරන අතර අලෙවි කණ්ඩායම වැඩි කිරීමට සහ පිරිවැටුම වැඩි කිරීම සඳහා රට තුළ තවත් පොදු පහසුකම් සැපයීම් ග්‍රහණය කර ගනිමින් සිටියි.

ඇ) SEO ප්‍රශස්තීකරණය, සමාජ මාධ්‍ය හැසිරවීම් සහ ජාතික/ජාත්‍යන්තර ප්‍රදර්ශන සඳහා සහභාගී වීමෙන් ආයතනික ප්‍රතිරූපය සහ සන්නාම දෘශ්‍යතාව වැඩිදියුණු කිරීමට සමාගම අදහස් කරයි, ජාත්‍යන්තර පාරිභෝගිකයින් ආකර්ෂණය කරගැනීම සඳහා එහි ප්‍රධාන කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරයි.

ඈ) හිස් ප්‍රදේශයේ නව ගොඩනැගිලි ඉදිකිරීම, පවතින බිම් ප්‍රමාණය ප්‍රශස්තකරණය, පැරණි හා අකාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ඉවත් කිරීම, එකලස් කිරීමේ මාර්ග සංකල්පය සහ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා නව මෙවලම් හඳුන්වාදීම මගින් බලාගාර ධාරිතාව පුළුල් කිරීම.

ඉ) ජාත්‍යන්තර වෙළඳපොලවල ව්‍යාපාරික ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සඳහා අප්‍රිකානු රටවල වෙළඳපොළට විනිවිද යාමේ හැකියාව ගවේෂණය කිරීම.

### 4. ආයතනයේ මූල්‍ය තත්ත්වය

**2023 ජනවාරි සිට අගෝස්තු දක්වා මූල්‍යමය විශේෂතා ඇතුළත්ව මූල්‍ය වර්ෂය තුළ එල් ටී එල් හෝල්ඩිංස් සමාගම් සමූහය ලද කාර්යසාධනය**

පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රධාන මෙහෙයුම් වලින් ලද මූල්‍යමය කාර්යසාධනයේ සාරාංශය පහත සඳහන් පරිදි වේ.

| කාලසීමාව | 2022 ජනවාරි 01 සිට 2023 අගෝස්තු 31 දක්වා | 2021 ජනවාරි 01 2022 දෙසැම්බර් 31 දක්වා ලිත් වර්ෂය | 2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ලිත් වර්ෂය |
|---|---|---|---|
| පිරිවැටුම | | (රු.මි) | (රු.මි) |
| නිෂ්පාදනය හා විවිධ සේවා | 9,278 | 8,480 | 7,162 |
| විදුලිබල උත්පාදනය | 25,610 | 48,206 | 24,586 |
| **එකතුව** | **34,888** | **56,686** | **31,748** |
| **දළ ලාභය** | | | |
| නිෂ්පාදනය හා විවිධ සේවා | 3,284 | 2,536 | 1,601 |
| විදුලිබල උත්පාදනය | 7,754 | 11,909 | 7,329 |
| **එකතුව** | **11,038** | **16,057** | **8,930** |

රට තුළ පැවති ආර්ථික අර්බුදය නොතකා 2023 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ උපයාගත් දළ ලාභය පසුගිය වසරේ අදාළ කාලසීමාවට වඩා 46% ක වර්ධනයක් වාර්තා කළේය.

2020 මාර්තු මාසයේ සිට රටේ ආර්ථිකය සැලකිය යුතු ලෙස අඩපණ කරමින් කොරොනා/කොවිඩ් 19 වසංගතයේ පශ්චාත් ප්‍රතිඵල තිබුණේ නම් වසර මීට වඩා යහපත් විය හැකිව තිබුණි. ක්ෂය වූ විදේශ විනිමය තත්ත්වය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආනයනය සඳහා පනවා ඇති සීමා කිරීම් ද සමාගම් සමූහයේ ක්‍රියාකාරීත්වයට දැඩි ලෙස බලපා තිබේ.

ලෝකය පුරා ද්‍රවීකෘත ස්වභාවික වායු මිල ඉතා ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් විදුලි ජනන ආදායම ඉහළ ගොස් තිබේ. බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය (BPDB) රටේ බලශක්ති උත්පාදන අවශ්‍යතා සඳහා ගෑස් බලාගාරවල සිට ඉන්ධන පදනම් වූ බලාගාර වෙත යැපීම මාරු කර තිබෙන බැවින් බංගලාදේශයේ (රාජ් ලංකා / ලක්ධනවි බංග්ලා/ ෆෙනි ලංකා) අපගේ බලාගාර සඳහා බලාගාර සාධකය සැලකිය යුතු ලෙස වැඩි වී තිබේ.

**<u>විදේශීය පරිපාලිත සමාගම් වලින් ලද ලාභාංශ ආදායම- 2023</u>**

පහත වගුවේ විස්තරාත්මකව දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂය තුළදී රටට අවශ්‍ය විදේශ විනිමය ඉපැයීමට සමාගමට එහි විදේශ ආයෝජනවලින් ලාභාංශ ආදායමක් ලැබී ඇති අතර එය ඩොලර් මිලියන 4.5 කට ආසන්න මුදලක් විය.

**විදේශීය පරිපාලිත සමාගම් වලින් ලද ලාභාංශ ආදායම- 2023**

1. ඒසියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විස්ජියර් (පුද්.) සමාගම, ඉන්දියාව ඇ.ඩො. 85,000.00
2. බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් පුද්. සමාගම, සිංගප්පූරුව ඇ.ඩො.100,000.00
3. ලක්ධනවි බංගලා පවර් සමාගම,බංගලාදේශය ඇ.ඩො.750,000.00
4. ෆෙනි ලංකා පවර් ඇ.ඩො.3,600,000.00
5. රාජ් ලංකා පවර් සමාගම,බංගලාදේශය **ඇ.ඩෝ. ශූන්‍ය**

මුළු මුදල ඇ.ඩො 4,535,000.00

සමාලෝචිත වර්ෂය තුළ එහි පාර්ශවකරුවන්ට ලාභාංශ ගෙවීම් වැඩිදියුණු කිරීම සඳහා පවතින සියලු විභවයන් උපයෝගී කර ගනිමින් බංග්ලාදේශ විදුලි බලාගාර මෙහෙයුම් විශාල දියුණුවක් ලබා ඇති අතර කැපී පෙනෙන ලාභයක් උපයා ඇත.

**ලංවිම ගාස්තු ගැළපුම් සංශෝධනය වෙමින් ගාස්තු ඉහළයාම**

ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ ලංවිම සමග සාකච්ඡා වට කිහිපයක් පැවැත්වීමෙන් අනතුරුව, 2022 අගෝස්තු මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ගාස්තු ඉහළ නැංවීමට අනුමැතිය ලබා දී ඇත. ජාත්‍යන්තර බලශක්ති මිලදීගන්නන් සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සඳහා ගෙවිය යුතු සියලුම හිඟ බිල්පත් පියවීම කඩිනම් කිරීමේදී ඉදිරි මාසවලදී මෙම ගාස්තු වැඩිවීම ලංවිම මූල්‍ය අර්බුදය සැලකිය යුතු ප්‍රමාණයකින් විසඳෙනු ඇත.

**5. 2024 වර්ෂය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති**

**(අ) විදුලි බලාගාර ව්‍යාපෘති සංවර්ධනය**

(ආ) ජනවාරි 18 වන දින INSTA සමග මාර්ග ගත ක්‍රමයට රැස්වීමකට සහභාගී විය.

(ඇ) පෙබරවාරි 02 වන දින Codevs නියෝජිතයන් (නියාමන සභාව සඳහා මාර්ගස්ථ බලපත්‍ර ක්‍රමය සහ අනුමත කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්කරු) සමඟ රැස්වීමකට සහභාගී විය.

(ඈ) පෙබරවාරි 15 වන දින විකිරණ ආරක්ෂණ පිලිබඳ පසු විපරම් පරීක්ෂණයක් දඹුල්ලේ Alchemy Heavy Metals (Pvt) Ltd ආයතනයේදී සිදු කරන ලදී.

(ඉ) පෙබරවාරි 25 වන දින අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැදීමේ රැස්වීමකට පරිසර අමාත්‍යාංශයේදී සහභාගී විය.

(ඊ) පෙබරවාරි 28 වන දින විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල ගැටළු සම්බන්ධව සාකච්චා කිරීමේ රැස්වීමකට අමාත්‍යාංශයේදී සහභාගී විය.

(ඔ) මාර්තු 15 වැනි දින නාවික හමුදා CBRN කමිටුව සඳහා දේශන පවත්වන ලදී.

(ඕ මාර්තු 17 වැනි දින යුධ හමුදා CBRN කමිටුව සඳහා දේශන පවත්වන ලදී.

(ක) මාර්තු 27 වෙනි දින ත්‍රිකුණාමලයේ නාවික හමුදා පුහුණු ඇකඩමියේ තුවක්කු විශේෂඥ පාඨමාලාව සඳහා සහභාගී වන නිලධාරීන්ට දේශන පවත්වන ලදී.

(ච) අප්‍රියෙල් 18 වෙනි දින ගරු විදුලි බල නියෝජ්‍ය අමාත්‍යතුමා සමග විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේදී ප්‍රගති සමාලෝචන රැස්වීමට සහභාගි විම.

(ජ) අප්‍රියෙල් 18 වෙනි දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආපදා සූදානම සහ ප්‍රතිචාර අංශය මගින් සංවිධානය කල හදිසි සැලසුම් සහ ප්‍රතිචාර දැක්වීමේ පුහුණු වැඩ මුළුවකට සම්පත් දායකයෙකු වශයෙන් සහභාගී වීම.

(ට) මැයි 02 වෙනි දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආපදා සූදානම් කිරීමේ ඒකකය සංවිධානය කල පුහුණු වැඩ මුළුවකට සහභාගී වීම.

(ඩ) මැයි 10 වෙනි දින ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ ප්‍රගති සමාලෝචනයේ රැස්වීමට සහභාගී විය.

(ණ) මැයි 11 වෙනි දින ප්‍රවේසම් සහිතව හා සුරක්ෂිතව විකිරණ ශීලි ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ දැනුවත් කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදී.

(ත) මැයි 18 හා 19 වෙනි දිනවල විකිරණ ආරක්ෂණ පිලිබඳ පරීක්ෂණයක් පුල්මුඩේ ඛනිජ වැලි නිස්සාරණ මධ්‍යස්ථානයේදී සිදු කරන ලදී.

(ද) මැයි 16 හා 18 වෙනි දිනවල හදිසි අවදානම් කළමනාකරණය පිලිබඳ පුහුණු පාඨමාලාවකට සෞඛ්‍ය අමාත්‍යාංශය හා මෙරට ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිතයින් සමග සහභාගී වීම.

(න) ජුනි 23 වෙනි දින රුසියාවේ ROSATOM ආයතනය න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන පිළිබඳව ඉදිරිපත් කල ගිවිසුම සම්බන්ධව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේදී අතිරේක ලේකම් වරයෙකු සමග සාකච්ඡා කිරීම.

(ප) ජුනි 25 වෙනි දින ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් සංවිධානය කරනු ලැබූ ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම පිලිබඳ පුහුණු වැඩමුළුවකට සහභාගී වීම.

(බ) SRL 9013 ව්‍යාපෘතිය යටතේ වන වැඩ කටයුතු සකස් කිරීම .

(ම) අගෝස්තු මාසයේ පැවැත්වෙන හදිසි කළමනාකරණයේ පාර්ශවකරුවන්ගේ රැස්වීම සඳහා වන මුලික කටයුතු සකස් කිරීම.

(ය) ජූලි 05 වෙනි දින අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැදීමේ රැස්වීමකට පරිසර අමාත්‍යාංශයේදී සහභාගී විය.

(ර) ජූලි 05 වෙනි දින හදිසි කළමනාකරණය පිලිබඳ Table Top Exercise සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආපදා සූදානම් කිරීමේ ඒකකය සඳහා පැවැත්වීම.

(ව) ජූලි 17 වෙනි දින ඒකාබද්ධ ආහාර පාලනය සම්බන්ධ අනුමැතින් ලබා දීමේ රැස්වීමකට අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේදී සහභාගී වීම

(ව) ජුලි 17 වෙනි දින ඒකාබද්ධ ආහාර පාලනය සම්බන්ධ අනුමැතින් ලබා දීමේ රැස්වීමකට අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේදී සහභාගී වීම

(ස) ජුලි 26 වෙනි දින වාර්ෂික කාර්ය සාධන සමාලෝචන රැස්වීම පවත් වීම පිලිබඳ මුලික සාකච්චාවක් නියාමන සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමග පැවැත්වීම

(හ) විකිරනශීලි ප්‍රවේසම හා බලාත්මක කිරීමේ ප්‍රතිපත්ති සැදීම පිළිබඳව කටයුතු කිරීම

(ළ) ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් සංවිධානය කිරීමට නියමිත IHR/ 2005 ඒකාබද්ධ බාහිර ඇගයීමේ වැඩ සටහන සම්බන්ධ මුලික කටයුතු සකස් කිරීම

## 4. 2024 සඳහා ප්‍රධාන වැඩසටහන්

### 4.1 නියාමන ක්‍රියාකාරකම්

| වැඩසටහන | 2024 සඳහා සිදු කළ යුතු ක්‍රියාකාරකම් |
|---|---|
| 1 රෙගුලාසි, රීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම | 1.1 අයනීකරණ විකිරණ ආරක්ෂණය සහ විකිරණ ප්‍රභවයන්ගේ ආරක්ෂාව පිළිබඳ කෙටුම්පත් රෙගුලාසි සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සහ සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම සහ රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම.<br>1.2 විකිරණ ප්‍රභවයන්ගේ සුරක්ෂිතතාව පිළිබඳ රෙගුලාසි එහි අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සහ එහි අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම .<br>1.3 විකිරණ සේවකයින්ගේ සුදුසුකම් සඳහා වන නිර්ණයක සඳහා වන රීතියට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සහ සිංහල සහ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.<br>1.4 බලයලත් පරීක්ෂකවරුන් විසින් පරීක්ෂණ පටිපාටිය ක්‍රියාත්මක කිරීම<br>1.5 විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.<br>1.6 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ දක්වා ඇති අවශ්‍යතාවයන් වන ප්‍රවේසම් සහිතව විකිරණශීලි ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ රීතිය, ප්‍රවේසම හා සුරක්ෂිතතාව පිලිබඳ ප්‍රතිපත්තිය, නෂ්ටික හෝ විකිරණශීලි ද්‍රව්‍ය හදිසි අවස්ථා කළමනාකරන රීතිය හා බලාත්මක කිරීමේ පටිපාටිය ආදීය ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම |
| 2 විකිරණ ප්‍රභවයන් සහ විකිරණ පහසුකම් සඳහා බලපත්‍ර ලබා දීම සහ පරීක්ෂා කිරීම | 2.1. නිකුත් කිරීමට සැලසුම් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව (නව සහ අලුත් කිරීම) - 350<br>2.2. අතුරු බලපත්‍ර සඳහා දීර්ඝ කිරීම් සංඛ්‍යාව - 100<br>2.3. පැවැත්වීමට සැලසුම් කර ඇති පරීක්ෂණ .ණන - 220 |
| 3 විකිරණ ආරක්ෂාව පිළිබඳ ජාතික පුහුණු පාඨමාලාව | 3.1 වෛද්‍ය හා කාර්මික ක්ෂේත්‍ර බලපත්‍රලාභී පහසුකම්වල ක්‍රියාකරුවන් සහ විකිරණ ආරක්ෂණ නිලධාරීන් සඳහා ජාතික පුහුණ පාඨමාලා පැවැත්වීම (විකිරණ ආරක්ෂණ නිලධාරීන් සහ යන්ත්‍ර ක්‍රියාකරුවන් සඳහා)<br>3.2 ජාතික න්‍යෂ්ටික හෝ විකිරණ හදිසි කළමනාකරණ සැලැස්මේ අවශ්‍යතා අනුව පත් කරන ලද ප්‍රතිචාර කණ්ඩායම් සහ කමිටු සඳහා පුහුණුවීම් පැවැත්වීම |
| 4 අනුමැතිය ලබා දීම සහ සහතික නිකුත් කිරීම | 4.1 විකිරණශීලී ද්‍රව්‍ය සහ ප්‍රවිකිරණ උපකරණ ආනයනය/අපනයනය සඳහා අනුමැතිය ලබා දීම.<br>ලබා දීමට ඇස්තමේන්තු කර ඇති අනුමත කිරීම් ගණන 480<br>4.2 ආහාර පරීක්ෂාව සඳහා සහතික නිකුත් කිරීම<br>නිකුත් කිරීමට ඇස්තමේන්තු කර ඇති සහතික ගණන 800<br>4.3 විකිරණ පහසුකම් සැලසුම් සඳහා අනුමැතිය ලබා දීම.<br>ලබා දීමට ඇස්තමේන්තු කර ඇති අනුමත කිරීම් ගණන 80 |

| වැඩසටහන | 2024 සඳහා සිදු කළ යුතු ක්‍රියාකාරකම් |
|---|---|
| 5 මාර්ගගත ක්‍රමයට බලපත්‍ර සහ අනුමත කිරීම් නිකුත් කිරීම | මාර්ගස්ථ බලපත්‍ර සහ අනුමත කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සහ තෝරාගත් පහසුකම් කිහිපයකට බලපත්‍ර ලබා දීම සහ ආනයනය සහ අපනයන අනුමැතිය සඳහා එය භාවිතා කිරීම |
| 6 දත්ත සමුදාය සහ විකිරණ ප්‍රභව ලේඛනය නඩත්තු කිරීම | 6.1 බලපත්‍ර, පරීක්ෂණ සහ අනෙකුත් අදාළ තොරතුරු සඳහා දත්ත .බඩාව පවත්වාගෙන යාම<br>6.2 විකිරණ ප්‍රභවයන් පිළිබඳ ජාතික ලේඛනය නඩත්තු කිරීම |
| 7 නියාමන සභාවේ වෙබ් අඩවියේ බලපත්‍රලාභී පහසුකම් පිළිබඳ තොරතුරු ප්‍රකාශනය කිරීම | සේවා ලබා ගැනීම සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම සඳහා මහජන තොරතුරු සඳහා කවුන්සිලයේ වෙබ් අඩවියේ ඇති සියලුම බලපත්‍රලාභී පහසුකම් පිළිබඳ යාවත්කාලීන තොරතුරු නියාමන සභාවේ වෙබ් අඩවියට උඩු ගත කිරීම |
| 8 අධි ක්‍රියාකාරී විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම | ඉල්ලීම අනුව අධි ක්‍රියාකාරී විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා අනුමැතිය ලබා දීම හා ඒවා අධීක්ෂණය කිරීම |

**4.2 ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ තාක්ෂනික සහයෝගිතා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

2022-2023 ව්‍යාපෘති කාල සිමාව සඳහා SRL 9013 න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා පෙරසූදානම ශක්තිමත් කිරීම˜ තාක්ෂනික සහයෝගිතා ව්‍යාපෘතිය ජාත්‍යන්තර පරමාණුක බල ශක්ති ඒජන්සිය (IAEA) හරහා ක්‍රියාත්මක කරන ලද අතර සමහර ක්‍රියාකාරකම් 2022 -2023 කාල සිමාව තුල සම්පූර්ණ කිරීමට නොහැකි විය. ඒවා 2024 වසර තුල පහත දැක්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවේ.

අ) ඉහත ව්‍යාපෘතිය යටතේ නියාමන සභාවේ ප්‍රථමයෙන් ප්‍රතිචාර දක්වන ආයතන වල සහ තාක්ෂණික ආයතනවල නිලධාරීන් කිහිප දෙනෙකු විදේශ පුහුණු ශිෂ්‍යත්ව, විද්‍යාත්මක චාරිකා සහ ජාතික පුහුණු හා අභ්‍යාස මගින් පුහුණු කිරීමට නියාමන සභාව සැලසුම් කර ඇත.

ආ) හදිසි අභ්‍යාස පැවැත්වීම සහ සැබෑ හදිසි අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම සිදුකරන අතර ඒ යටතේ, පුද්ගල ආරක්ෂණ උපකරණ "මිනුම් උපකරණ" පුහුණු උපකරණ සහ විකිරණ වලින් වූ දූෂිත ස්ථාන පවිත්‍ර කිරීමේ උපකරණ මෙම ව්‍යාපෘතිය හරහා ලැබෙනු ඇත.

ඇ) නව පූර්ව අනතුරු ඇඟවීමේ අනාවරක පද්ධතියක් ස්ථාපිත කෙරේ. මෙම පද්ධතිය ජාත්‍යන්තර විකිරණ නිරීක්ෂණ තොරතුරු හුවමාරු පද්ධතිය (IRMIS) සමග අනුකූල වන අතර න්‍යෂ්ටික ව්‍යසනයකදී පූර්ව අනතුරු ඇඟවීම් ලබා ගැනීමට උපකාරී වනු ඇත.

# නවවන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම යනු 2011 පළමු කාර්තුවේදී සංස්ථාපිත සමාගමක් වන අතර එය ලංකා විදුලිබල මණ්ඩලයේ 100% හිමිකාරී අනුබද්ධිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ.

සම්ප්‍රේෂණ වත්කම් සංවර්ධනය, මිනිස් බල සම්පත් සම්පාදනය සහ ප්‍රසම්පාදනය යන අනෙකුත් අරමුණු අතර පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය පිළිබඳ දැක්මකින් SLE කටයුතු කරයි.

## 2. කාලපරිච්ඡේදය තුළ මුහුණ දුන් අභියෝග සහ එවැනි අභියෝගවලට මුහුණ දීම සඳහා අනුගමනය කළ උපාය මාර්ග.

a) බොහෝ ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් සඳහා විවිධ නීති, රෙගුලාසි සහ බලපත්‍රවලට අනුකූල වීම අවශ්‍ය වන අතර, එය පාරිසරික අධිකාරියෙන් සහ අනෙකුත් ප්‍රාදේශීය නියාමන අධිකාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීම වැනි සංකීර්ණ හා කාලය ගතවන ක්‍රියාවලියක් විය හැකිය.

b) උදා:- ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) සඳහා සීතාවක ජල විදුලි බලාගාරයේ අනුමැතිය බලාපොරොත්තු වේ.

c) ප්‍රාදේශීය කලාපකරණ නීති සහ ඉඩම් පරිහරණ රෙගුලාසි සංකීර්ණ විය හැකි අතර අනුමත කිරීමේ ක්‍රියාවලිය අභියෝගාත්මක කරමින් නිශ්චිත ව්‍යාපෘති සඳහා විචල්‍යතා හෝ වෙනස්කම් අවශ්‍ය විය හැකිය.
උදා:- සීතාවක ජල විදුලි බලාගාරය

d) ඉහළ පොලී අනුපාත හේතුවෙන් සහ ණය සඳහා සහනදායී අනුපාත නොලැබීම හේතුවෙන් අරමුදල් සැකසීම් ඉතා අභියෝගාත්මක ය.

e) සමහර අනුමත ක්‍රියාවලීන් සඳහා දීර්ඝ සමාලෝචන ක්‍රියාවලීන් සමාලෝචනයේ අදියර කිහිපයක් ඇතුළත් වේ, එය කාලය ගතවන සහ මිල අධික විය හැකිය.

**අනුගමනය කරන ලද උපාය මාර්ග**

i. මෙම අභියෝග ජය ගැනීම සඳහා බොහෝ විට අදාළ බලධාරීන් සමඟ සමීපව කටයුතු කිරීම අවශ්‍ය වන බැවින් එය සාකච්ඡා සාක්ෂාත් කර ගැනීම සඳහා කමිටු පත් කර ඇත.

ii. ව්‍යාපෘතිය හෝ ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යාම සඳහා සහයෝගය ගොඩනගා ගැනීම සඳහා ඵලදායි සන්නිවේදනය සහ මහජන සම්බන්ධතා ප්‍රයත්නයන් සඳහා කමිටු රැස්වීම්වලට යොමු වීම හේතු විය.

iii. අදාළ පාර්ශව සමඟ හරිත බැඳුම්කර සාකච්ඡා සංවිධානය කළේය.

## 3. කාර්ය සාධනය 2023 සහ 2024 සඳහා වැඩසටහන්

- **කුඹල්ගමුව කුඩා ජල විදුලි බලාගාරය**

සමනලවැව ජලාශයෙන් වසර 20කට වැඩි කාලයක සිට කාන්දු වන ජලය භාවිතා කරමින් ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්) සමාගම කුඹල්ගමුව කුඩා ජල විදුලි බලාගාරය ඉදිකර ඇත.

කුඹල්ගමුව කුඩා ජලවිදුලි බලාගාරයේ මෙගාවොට් 1.2 ක ෆ්‍රැන්සිස් ටර්බයිනයේ වැඩකටයුතු 2016 පෙබරවාරි 19 වන දින අවසන් කර ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කරන ලදී.



| බලාගාරයේ සාරාංශය (ජනවාරි-අගෝස්තු 2023 දක්වා) | | |
|---|---|---|
| ස්ථාපිත ධාරිතාව | 1.3 | MW |
| සමුච්චිත බලශක්ති උත්පාදනය(ජනවාරි -අගෝස්තු 2023 දක්වා) | 4.16 | GWH |
| සම ආදායම් (ජනවාරි-අගෝස්තු 2023 දක්වා) | 76.39 | රු. මිලියන |
| ලංවිම මගින් ප්‍රාග්ධන ආයෝජනය | 115 | රු. මිලියන |
| මෙහෙයුම් කාලය | 7.6 (අවුරුදු 7ක් හා මාස 7ක්) | අවුරුදු |

- **දැදුරුඔය කුඩා ජල විදුලි බලාගාරය සංවර්ධනය**

2021 ජනවාරි මස කටුවන්නාව ප්‍රදේශයේ දැදුරුඔය ජලාශයේ වාරිමාර්ග මුදාහැරීමේ දී මෙගාවොට් 1.3 ක බලාගාරය සාර්ථකව ආරම්භ කරන ලදී. කැප්ලාන් ටර්බයින් සහිත ජෙනරේටරය මගින් වාර්ෂිකව බලශක්තිය ලබා දීමට අපේක්ෂා කරන අතර, එහි වටිනාකම රුපියල් මිලියන 90 ක් වේ.

| බලාගාරයේ සාරාංශය (ජනවාරි-අගෝස්තු 2023 දක්වා) | | |
|---|---|---|
| ස්ථාපිත ධාරිතාව | 1.3 | MW |
| සමුච්චිත බලශක්ති උත්පාදනය (ජනවාරි-අගෝස්තු 2023 දක්වා) | 2.71 | GWH |
| සම ආදායම් | 48.13 | රු. මිලියන |
| මෙහෙයුම් කාලය | 2.8 (අවුරුදු 2ක් හා මාස 8ක්) | අවුරුදු |



- **ලංවිමට අවශ්‍ය මිනිස් බලය කළමනාකරණය කිරීම**

මව් සමාගම විසින් ඉල්ලා සිටින පරිදි සමාගම විසින් ලංවිම වෙත පුහුණු සහ නුපුහුණු මානව සේවා 126 ක සේවාවන් සපයයි.

ආරම්භයේදී සමාගම ලංවිම වෙත මිනිස් බල සේවා 3000කට ආසන්න ප්‍රමාණයක් හසුරුවා ඇත.



- **මීටර් ආවරණ නිෂ්පාදන කම්හල.**

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ LECO සමාගමේ ප්ලාස්ටික් මීටර ආවරණ අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2016 සැප්තැම්බර් මස 05 වන දින ප්ලාස්ටික් තනි මුහුණත් මීටර ආවරණ නිෂ්පාදනය කර්මාන්ත ශාලාවේ ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

ඉදිකිරීම් සහ යන්ත්‍ර සවිකිරීම අවසන් කරමින් 2017 සැප්තැම්බර් මස 05 වන දින කර්මාන්ත ශාලාව විවෘත කරන ලදී. වාර්ෂික අවශ්‍යතාවයක් වන මීටර් 250,000 ක් ආවරණය වන පරිදි මෙම කර්මාන්ත ශාලාව මගින් ලංකා විදුලිබල මණ්ඩලයට හා ලංකා විදුලි (පුද්ගලික) සමාගමට නිෂ්පාදනය කර සපයනු ලැබේ.

මේ වන විට විදුලිබල මණ්ඩලයේ සහ LECO සමාගමෙහි සම්පූර්ණ මීටර ආවරණ අවශ්‍යතාවය සපුරාලීම සඳහා කර්මාන්ත ශාලාව සිය ධාරිතාවය ක්‍රියාත්මක කරයි.



- සූර්ය බල ව්‍යාපෘතිය (උඩු මහල)

2023 වසරේ සිට ව්‍යාපෘතියක් ලෙස දිවයින පුරා වහල මුදුන් මත සූර්ය පැනල ක්‍රියාත්මක කිරීම පිළිබඳව පළාත් පාලන ආයතන සමඟ සාකච්ඡා කිරීමට SLE කටයුතු කරමින් සිටී.

මෙම සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස SLE විසින් නියමු ව්‍යාපෘතියක් ලෙස ගල්ගමුව ප්‍රාදේශීය සභාවේදී වහල මත සූර්ය බලශක්ති යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී.

දදුරුඔය කුඩා ජල විදුලි බලාගාරය සඳහා වහල මත සූර්ය බලශක්තියක් ද ක්‍රියාත්මක කරන ලදී.



| ව්‍යාපෘති සාරාංශය | | |
|---|---|---|
| බලාගාර ධාරිතාව | 700 | kW |
| වසරකට අපේක්ෂිත බලශක්තිය | 4.8 | GWH |
| අපේක්ෂිත වාර්ෂික ආදායම | 86 | රු. මිලියන |

**4. 2024 සඳහා වැඩසටහන් සහ ව්‍යාපෘති**

- **ඉහළ සමනලවැව කුඩා ජල විදුලි බලාගාරය**

SLE ආයතනය විසින් කරන ලද අධ්‍යයනයට අනුව දැනට පවතින කුඹල්ගමුව වැල්ලට කාන්දු වන ස්ථානයේ සිට මීටර් 28 ක් උසින් ජල ශීර්ෂයක් ඇත. මෙම ජල ශීර්ෂයෙන් 600kw බලාගාරයක් 4.8GWh වාර්ෂික බලශක්ති බලාගාරයක් ඉදි කළ හැකිය.

මෙම ජල ශක්තිය වසර 21 කට වැඩි කාලයක් කිසිදු ඵලදායි භාවිතයකින් තොරව අපතේ යයි.

දැනට පවතින කාන්දු වන ස්ථානයට හෝ අවට ප්‍රදේශයට කිසිදු බාධාවක් නොකර, සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂඥයන් සමඟ ඉහත සඳහන් පරිදි බලාගාරයක් ඉදිකිරීමේ සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයක් SLE ආයතනය විසින් සිදු කරන ලදී.

- **සීතාවක ජල විදුලි බලාගාරය**

සීතාවක ජලවිදුලි ව්‍යාපෘතිය මෙගාවොට් 7 බැගින් වන කුඩා ජල විදුලි බලාගාර දෙකක් ලෙස ඉදිකිරීමට නියමිතය. අපේක්ෂිත වාර්ෂික බලශක්තිය 40GWH පමණ වේ.

SEA විසින් කර්මාන්තශාලා දෙකක් සඳහා තාවකාලික අනුමැතිය ලබා දී ඇති අතර, ඉලෙක්ට්‍රෝ යාන්ත්‍රික උපකරණ ටෙන්ඩර් කර ඇති අතර ප්‍රාග්ධන ආයෝජනය ලෙස හරිත බැඳුම්කර භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. 2024 ජූනි මාසයට පෙර මෙම බලාගාර දෙකම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.







- **ඉවතලන ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය**




කර්මාන්ත ශාලාවේ ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදනය කරමින් පවතී. 2023 සැප්තැම්බර් මාසයේදී කර්මාන්ත ශාලාව ක්‍රියාත්මක වේ. විදුලිබල මණ්ඩලයෙන් ඉවත් කරන ලද සියලුම ඇලුමිනියම් සන්නායක (AAC) මෙම කර්මාන්තශාලාවේ ප්‍රතිචක්‍රීකරණය කිරීමට නියමිත අතර ඇලුමිනියම් දඬු නිෂ්පාදනය කිරීම සඳහා පසුව එය ගුවන් බණ්ඩල් කේබල් (ABC) නිෂ්පාදනය සඳහා භාවිතා කළ හැකිය. සැකසූ ඇලුමිනියම් දඬු සාකච්ඡා කළ මිලකට නැවත ලංවිම වෙත යවනු ලැබේ.



වර්තමාන සන්දර්භය තුළ මෙම ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය පරිසරයට ඉතා ඉහළ වටිනාකමක් ලබා දෙන අතර වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 4 කට වඩා ඉතිරි කරයි. එසේම සිදු කරන ලද ගණනය කිරීම්වලට අනුව මෙම ව්‍යාපෘතියේ නිමැවුම ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික ඇලුමිනියම් අවශ්‍යතාවයෙන් තුනෙන් එකක් සපයයි.

මේ වන විට ලංවිම ඩිපෝවෙන් පරණ ඇලුමිනියම් එකතු කිරීම ආරම්භ කර ගලිගමුව කර්මාන්තශාලා පරිශ්‍රයේ තාවකාලිකව ගබඩා කර ඇත.



# දසවන පරිච්ඡේදය

# ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1. හැඳින්වීම

ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, අපනයනය කිරීම, පිරිපහදු කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදාහැරීමට අදාළ ව්‍යාපාරික කටයුතු කර ගෙන යාම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පිහිටුවන ලද අතර ඊට අයත් කාර්යයන් ඉටු කිරීමට අදාළ නෛතික ප්‍රතිපාදන 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත මගින් ලබා දෙන ලදී.

**දැක්ම**

"ඛනිජ තෙල් ක්ෂේත්‍රය හා අදාළ කර්මාන්ත සඳහා තිරසාර භාවයක් ලබා දීම මෙන්ම නව අවස්ථාවන් මගින් සේවාදායකයින්ට නිරන්තර වටිනාකම් සැපයීම"

**මෙහෙවර**

| | |
|---|---|
| **තරඟකාරීත්වය** | - ඛනිජ තෙල් සහ ඒ හා බැඳුණු නිෂ්පාදන තරඟකාරී මිල ගණන් යටතේ ලබා දෙමින් වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීමට ප්‍රයත්න දැරීම. |
| **තිරසාර බව** | - ආර්ථිකමය සමාජමය සහ පාරිසරික වශයෙන් තිරසාර ව්‍යාපාරයක් ලෙස දීර්ඝකාලීන අනාගත ප්‍රතිලාභ උදා කර දීම. |
| **නිරන්තර වර්ධනය** | - මානව සම්පත සහ ක්‍රියාදාමයන් හි සංවර්ධනය මත සංස්ථාවේ වර්ධනය තහවුරු කිරීම මෙන්ම අදාළ සියලු අංශයන්හි වර්ධනය ගැන සුපරීක්ෂාකාරී වීම. |
| **අවංක බව** | - සංස්ථාවේ යහපත සඳහා සියලු අවස්ථාවන්හී දී විශ්වාසදායී ලෙස කටයුතු කිරීම. |
| **පොදු යහපත** | - රටේ සංවර්ධනය වෙනුවෙන් සහයෝගය ලබාදීමේ ඉලක්ක සපුරා ගැනීම. |

## 2. 2023 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්හි ප්‍රගතිය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දේශීයව අවශ්‍ය වන ඛනිජ තෙල් නිෂ්පාදන ඉල්ලුමෙන් වැඩි ප්‍රතිශතයක් ආනයනය කර සැපයීම සිදු කරනු ලබන අතර එම කටයුතුවල ප්‍රගතිය මෙම පරිච්ඡේදය මගින් ඉදිරිපත් කරනු ලැබේ.

### 2.1 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රධාන දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනකරුවා වන අතර සමස්ත ඉල්ලුමෙන් 90% ක් පමණ ආනයනය කර බෙදාහැරීම සිදු කරනු ලබයි. තවද බොරතෙල් ආනයනය කර පිරිපහදු කර සැපයීම 1969 වර්ෂයේ සිට සංස්ථාවේ තනි අයිතිය යටතේ සිදු කරනු ලබන අතර එමගින් දේශීය සමස්ත ඛනිජ තෙල් ඉල්ලුමෙන් 25% ක් පමණ පිරිපහදු කර සැපයීම සිදු කරනු ලැබේ. 2022 වර්ෂයේ මුහුණ දුන් ආර්ථික අර්බුදකාරී තත්ත්වය 2023 වසර වන විටත් පැවතීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් ආනයන කෙරෙහි අහිතකර ලෙස බලපෑම් කළද දේශීය ඛනිජ තෙල් අවශ්‍යතාවය සපුරාලීම සඳහා උපරිම දායකත්වයක් දක්වන ලදී. ඒ අනුව සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කර සැපයීමේ ප්‍රගතිය වගු අංක 10.1 මගින් ඉදිරිපත් කරනු ලැබේ.

වගුව 10.1
**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන තොරතුරු**
2020.01.01 සිට 2023.08.31 දක්වා

| නිෂ්පාදන | ප්‍රමාණය (මෙ.ටො) ('000) | | | |
|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023.08.3 1 දක්වා |
| ඔටෝ ඩීසල් | 951 | 1,254 | 1,267 | 457.7 |
| සුපර් ඩීසල් | 56 | 68 | 128 | 11.5 |
| පෙට්‍රල් - 92 ඔක්ටේන් | 837 | 893 | 888 | 552.1 |
| පෙට්‍රල් - 95 ඔක්ටේන් | 91 | 103 | 46 | 18.9 |
| ජෙට් ඒ-1 | 101 | 178 | 269 | 73.2 |
| අඩු සල්ෆර් දැවි තෙල් (180 **CST**) | 206 | 245 | 124 | 61.4 |
| වැඩි සල්ෆර් දැවි තෙල් (180 **CST**) | 146 | 31 | - | - |
| **පිරිපහදු කළ නිෂ්පාදන ආනයන ප්‍රමාණය** | 2,388 | 2,772 | 2,723 | 1,174.8 |
| බොරතෙල් | 1,666 | 1,130 | 743 | 1,006 |
| **සමස්ත ආනයන ප්‍රමාණය** | 4,054 | 3,902 | 3,465 | 2,181 |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2020 වර්ෂයේ සිට 2023 වර්ෂයේ අගෝස්තු 31 දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන ප්‍රමාණයන් සැලකිල්ලට ගැනීමේ දී 2020 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 2,388,000 ක් ආනයනය කර ඇති අතර එම ප්‍රමාණය 2021 සහ 2022 වර්ෂවල දී පිළිවෙලින් මෙට්‍රික් ටොන් 2,772,000 ක් සහ මෙට්‍රික් ටොන් 2,723,000 ක් දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, 2023 වර්ෂයේ පළමු මාස 08 තුළ පිරිපහදු කළ නිෂ්පාදන ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,174,800 ක් දක්වා විශාල අඩුවීමක් දක්නට ලැබේ. රට තුළ පැවති ඛනිජ තෙල් ඉල්ලුම පාලනය කිරීමේ උපක්‍රමවල බලපෑම සහ සපුගස්කන්ද පිරිපහදුව පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීම 2023 වර්ෂයේ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය පහත වැටීම සඳහා බලපාන ලදී.

තවද, පසුගිය වර්ෂයන්හි බොරතෙල් ආනයන ප්‍රමාණයන් සලකා බැලීමේදී 2020 වර්ෂයේදී බොරතෙල් මෙට්‍රික් ටොන් 1,666,000ක ප්‍රමාණයක් ආනයනය කර ඇති අතර එම ප්‍රමාණය 2021 වර්ෂයේ මෙට්‍රික් ටොන් 1,130,000 ක් සහ 2022 වර්ෂයේ මෙට්‍රික් ටොන් 743,000 දක්වා ක්‍රමයෙන් අඩුවී ඇත. 2021 වර්ෂයේ දේශීයව ඛනිජ තෙල් සඳහා පැවති අඩු ඉල්ලුම සහ නඩත්තු කටයුතු සඳහා පිරිපහදු කටයුතු නතර කිරීම මෙන්ම 2022 වසරේ පැවති ආර්ථික අර්බුදය ද බොරතෙල් ආනයනය සීමාවීමට බලපාන ලදී. කෙසේ වෙතත් 2023 වර්ෂයේ පළමු මාස 08 පිළිබඳව සලකා බැලීමේ දී බොරතෙල් මෙට්‍රික් ටොන් 1,006,000 ක් පමණ ආනයනය කරන ලදී. මෙම ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව ඉහළ අගයක් ගනී.

ප්‍රස්තාරය 10.1
**පසුගිය වසර තුන තුළ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය**
(2020.01.01 සිට 2023.08.31 දක්වා)




## 2.2 සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුවේ දායකත්වය

1969 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද සපුගස්කන්ද පිරිපහදුව මේ දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් දේශීය ඛනිජ තෙල් අවශ්‍යතාවය මෙරටදීම පිරිපහදු කර සැපයීමට දායකත්වය දක්වනු ලැබේ. ඒ අනුව 2023 වර්ෂයේ පළමු මාස 08 තුළ බොරතෙල් මෙට්‍රික් ටොන් 1,145,392 ක් පිරිපහදු කරමින් විවිධ වර්ගයේ ඛනිජ තෙල් නිෂ්පාදන මෙට්‍රික් ටොන් 1,093,500 ක් පමණ නිෂ්පාදනය කරන ලද අතර එම ප්‍රමාණය දේශීය ඛනිජ තෙල් සැපයුමින් 48% කට ආසන්න අගයක් ගනී. සපුගස්කන්ද පිරිපහදුව මඟින් පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි සංයුතිය ප්‍රස්ථාර අංක 10.2 මගින් දක්වා ඇත.

ප්‍රස්තාරය 10.2
**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පිරිපහදුවේ නිෂ්පාදනය සංයුතිය (මෙ.ටො.)**
**2023 ජනවාරි සිට අගෝස්තු 31 දක්වා**



## 2.3 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය

ජනගහනයේ වර්ධනයත් සමග වැඩි වන අවශ්‍යතාවලට අනුකූලව ගෘහස්ත සහ වාණිජ අංශවල පමණක් නොව විදුලිය නිෂ්පාදනය, ප්‍රවාහනය, කර්මාන්ත සහ කෘෂිකාර්මික අංශවල ද ඛනිජ තෙල් පරිභෝජනය ඉහළ ගොස් ඇත. ඒ අනුව ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පවත්නා ඉල්ලුම සපුරාලීම පිණිස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සියලු අංශයන් ඔස්සේ නිෂ්පාදන අලෙවි කටයුතුවල නිරත වන අතර එම අලෙවි මිශ්‍රණය 10.1 සටහන මඟින් දක්වා ඇත.

10.1 සටහන
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන අලෙවි මිශ්‍රණය




2021 වර්ෂයේ සිට 2023 අගෝස්තු 31 දින දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ඉන්ධන අලෙවිය පිළිබඳ තොරතුරු 10.2 වගුව මඟින් දක්වා ඇත. එම තොරතුරු සලකා බැලීමේදී 2021 වර්ෂයේ ඉන්ධන මෙට්‍රික් ටොන් 4,776,334.80 ක සමස්ත අලෙවියක් සහ 2022 වර්ෂයේදී ඉන්ධන මෙට්‍රික් ටොන් 3,310,619.55 ක සමස්ත අලෙවියක් වාර්තා කර ඇති අතර 2023 වර්ෂයේ අගෝස්තු 31 දක්වා කාලය තුළ මෙට්‍රික් ටොන් 2,399,294.22 ක අලෙවියක් වාර්තා කර ඇත. 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සමස්ත ඉන්ධන අලෙවියෙහි ක්‍රමික අඩුවීමක් පෙන්නුම් කරනු ලබන අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් ඉන්ධන සැපයුමෙහි සිදු වූ පසුබෑම සහ ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් ඇති වූ ඉල්ලුම් සංකෝචනය බලපාන ලදී.

වගුව 10.2
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ඉන්ධන අලෙවිය 2021 සිට 2023.08.31 දින දක්වා

| නිෂ්පාදන වර්ගය | සමස්ත අලෙවිය (මෙ. ටො.) | | |
|---|---|---|---|
| | 2021 | 2022 | 2023.08. 31 දිනට |
| ලංකා පෙට්‍රල් - 92 ඔක්ටේන් | 1,102,551.70 | 964,844.219 | 681,731.72 |
| ලංකා පෙට්‍රල් - 95 ඔක්ටේන් | 102,809.50 | 55,697.245 | 20,633.79 |
| ලංකා ඔටෝ ඩීසල් | 1,706,041.80 | 1,475,577.154 | 876,531.77 |
| ලංකා සුපර් ඩීසල් | 65,721.50 | 72,474.383 | 20,244.42 |
| ලංකා භූමිතෙල් | 185,312.60 | 98,367.966 | 47,046.95 |
| ලංකා කර්මාන්ත භූමිතෙල් | 2,903.30 | 5,647.035 | 1,097.88 |
| ලංකා රසායනික නැප්තා | 333,459.20 | 32,262.861 | 96,187.47 |
| ලංකා දැවි තෙල් 800 | 99,321.80 | 0.00 | 0.00 |

| නිෂ්පාදන වර්ගය | සමස්ත අලෙවිය (මෙ. ටො.) | | |
|---|---|---|---|
| | 2021 | 2022 | 2023.08.31 දිනට |
| ලංකා දැවි තෙල් 1500 (වැඩි සල්ෆර්) | 340,198.00 | 198,891.936 | 136,361.02 |
| ලංකා දැවි තෙල් 1500 (අඩු සල්ෆර්) | 407,868.40 | 103,379.876 | 204,027.68 |
| ලංකා දැවි තෙල් - සුපර් | 203,994.20 | 54,978.319 | 76,702.73 |
| ජෙට් ඒ-1 | 223,666.30 | 245,796.923 | 237,671.57 |
| ලංකා සොල්වන්ට් (SBP) | 2,486.50 | 2,701.635 | 1,057.22 |
| **එකතුව** | **4,776,355.20** | **3,310,619.55** | **2,399,294.22** |

මූලාශ්‍රය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ප්‍රස්තාරය 10.3

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පෙට්‍රල්, ඩීසල් හා ගුවන්යානා ඉන්ධන අලෙවි ප්‍රමාණය (2020 සිට 2023.08.31 දක්වා)



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ප්‍රස්තාරය 10.4

2023 වර්ෂයේ ගුවන් යානා ඉන්ධන අලෙවි ප්‍රමාණය (මෙ.ටො.)



මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 2.4 විදුලිබල අංශයට ඉන්ධන අලෙවි කිරීම

වගුව 10.3
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විදුලිබල අංශයට අලෙවි කළ ඉන්ධන ප්‍රමාණය 2016 - 2023 (ලීටර '000)

| වසර | ලංකා ඔටෝ ඩීසල් | නැප්තා | දැවි තෙල් | ලංකා සුපර් ඩීසල් | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| 2016 | 364,974 | 174,270 | 415,611 | - | 954,855 |
| 2017 | 397,330 | 201,989 | 701,983 | - | 1,301,302 |
| 2018 | 206,485 | 100,568 | 559.173 | - | 866,226 |
| 2019 | 400,085 | 180,665 | 673,547 | - | 1,254,296 |
| 2020 | 188,762 | - | 780,080 | - | 968.842 |
| 2021 | 120,041 | 15,407 | 474,341 | - | 609,789 |
| 2022 | 201,974 | 46,781 | 304,472 | 17,825 | 571,051 |
| 2023.08.31 දක්වා | 99,347 | 139,472 | 400,413 | - | 639,232 |

මූලාශ්‍රය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 3. යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

### 3.1 ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සම්බන්ධයෙන් 2022 ජනවාරි මාසයේදී අත්සන් කරන ලද ගිවිසුම අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ඉන්ධන ගබඩා ටැංකි 24 ක් ලැබී ඇත. ඒ අනුව, දේශීයව බෙදාහරින ඛනිජ තෙල් ගබඩා කිරීමේ අරමුණ සඳහා මෙම ටැංකි අදියර වශයෙන් සංවර්ධනය කිරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සැලසුම් කර ඇත. පළමු අදියර ලෙස ටැංකි 12ක් ප්‍රතිසංස්කරණය කිරීමට නියමිත අතර ඉදිකිරීම මෙහෙයවීම හා පවරාදීම යන ව්‍යාපාරික පදනම මත ඉහත යෝජිත සංවර්ධනය සඳහා අනුමැතිය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගන්නා ලදී.




### 3.2 කටුනායක ගුවන් තොටුපොළේ ගුවන් යානා ඉන්ධන සැපයුම් පද්ධතිය (Fuel Hydrant System) සංවර්ධනය කිරීම

කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ජෙට් ඒ 1 ගුවන් යානා ඉන්ධන ගබඩා ධාරිතාවය පුළුල් කිරීම, ඉන්ධන සැපයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ඉන්ධන සැපයීම සහතික කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි II වන අදියරේ 2 වන පියවරේ සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව මෙම ව්‍යාපෘතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආරම්භ කරන ලදී.

ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 51.5 ක බදු රහිත මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමන ලද අතර ව්‍යාපෘතිය මූල්‍යනය කොන්ත්‍රාත් වටිනාකමින් 85% ක් චීන ජාතික කෙමිකල් ඉංජිනියරින් ඉදිකිරීම් (China National Chemical Engineering Construction) ආයතනයේ සහාය දක්වන ස්වයං මූල්‍යකරණ පහසුකමින් ආවරණය කරන ලදී. ඉතිරි 15% මහජන බැංකුවේ ණය පහසුකමකින් ආවරණය කෙරේ. 2023.08.31 දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 82.6% ක් අත්කර ගෙන ඇති අතර මූල්‍ය ප්‍රගතිය 76.35% කි. ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු 2024.03.31 නිම කිරීමට සැලසුම් කර ඇත.

## 4. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අනාගත සැලසුම් - 2024

- මුතුරාජවෙල සිට ගුවන් තොටුපළ දක්වා ගුවන්යානා ඉන්ධන ප්‍රවාහන නළ මාර්ගයක් සහ තෙල් ටැංකි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම.

- පවතින අභියෝග සලකා බලමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා අනාගතයේ දී පිවිසිය හැකි ව්‍යාපාර සංවර්ධන අවස්ථා හඳුනා ගැනීම.

- ශුද්ධ ශුන්‍ය කාබන් (Net-zero C) ඉලක්ක සපුරා ගැනීම සඳහා අනාගතයේ දී පොසිල ඉන්ධන ප්‍රතිස්ථාපනය කළ හැකි හරිත හයිඩ්‍රජන්, හරිත ඇමෝනියා, ජෛව ඉන්ධන, සූර්යබල ආදී විකල්ප බලශක්ති/ඉන්ධන ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යයනය සහ ධාරිතා සංවර්ධනය.





# එකොළොස්වන පරිච්ඡේදය

# ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

## 1. හැඳින්වීම

ඛනිජ තෙල් වෙළඳපොළට තරඟකරුවන් පිවිසීමත් සමඟම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පැවති ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ කටයුතු වෙන් වශයෙන් හඳුනාගෙන, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඉන්දියානු තෙල් සමාගම යන ආයතන දෙකෙහි ඉන්ධන ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ කටයුතුවලට අදාළ පොදු පහසුකම් සපයන්නෙකු ලෙස, සමාගම් පනත යටතේ "ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම" ස්ථාපනය කරන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන මෙහි කොටස් වලින් 2/3ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් වන අතර ඉතිරි 1/3 ලංකා ඉන්දියානු තෙල් සමාගමට අයත් වේ.

### දැක්ම

''දකුණු ආසියාවේ වඩාත් කාර්යක්ෂම ඛනිජ තෙල් ක්‍රියාකරවුම් පර්යන්තය බවට පත්වීම''

### මෙහෙවර

''පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කරමින් දකුණු ආසියාවේ වඩාත් කාර්යක්ෂම හා ක්‍රියාකාරී සේවාවක් පවත්වා ගැනීමටත්, පාරිභෝගික අවශ්‍යතා සපුරාලමින් සපයන්නා වූ ඛනිජ තෙල් නිෂ්පාදන ධාරිතාවේ නියමිත ගුණාත්මකභාවය සහතික කරමින්, අඛණ්ඩ වර්ධනයකින් යුතු පාරිභෝගිකයා තෘප්තිමත් කරන්නා වූ සේවයක් සැලසීම සඳහා කැපවීමටත්, මහජන හා පාරිභෝගිකයින්ගේ ප්‍රතිචාර හා මාර්ගෝපදේශකත්වය මත පදනම් වූ පරිසරයට ගෞරවය දක්වන හා එහි ප්‍රමිතීන් සුරකින, නීතිගරුක, තෘප්තිමත්, මනා පුහුණුවක් හා කැපවීමකින් යුත් ශ්‍රම බලකායේ සහභාගිත්වය ලබා දීම''

## 2. 2023 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්හි ප්‍රගතිය

ඉන්ධනවල ඉහළ ගුණාත්මකභාවය රැකගනිමින් අඛණ්ඩ ඉන්ධන සැපයුමක් තහවුරු කිරීම සඳහා නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදාහැරීම ඉතා වැදගත් වන අතර, එහිදී ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ඉහළ කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. මෙම පරිච්ඡේදයෙන් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි ඉන්ධන ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඉදිරිපත් කරනු ලැබේ.

### 2.1 ඉන්ධන ගබඩා කිරීම

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් කොලොන්නාව පර්යන්තයෙහි මෙට්‍රික් ටොන් 252,012 ක ධාරිතාවයකින් ද මුතුරාජවෙල පර්යන්තයෙහි මෙට්‍රික් ටොන් 205,649 ක ධාරිතාවයකින් ද ප්‍රාදේශීය තොග ගබඩා 11 හි මෙට්‍රික් ටොන් 20,794 ක ධාරිතාවයකින් ද යුතුව ඉන්ධන ගබඩා පහසුකම් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් මෙට්‍රික් ටොන් 478,455 ක සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවයක් රට තුළ පවත්වාගෙන යනු ලැබේ. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන පර්යන්ත දෙක හා ප්‍රාදේශීය තොග ගබඩා 11 මගින් 2023 වර්ෂය තුළ ඉන්ධන ගබඩා කිරීම සඳහා සක්‍රීය දායකත්වයක් සපයන ලද අතර ප්‍රධාන පර්යන්ත දෙකෙහි ගබඩා ධාරිතාවය 11.1 වගුව මගින් දක්වා ඇත.

වගුව 11.1
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ
ඉන්ධන ගබඩා ධාරිතාවය 2023.09.30 දිනට

| ඉන්ධන වර්ගය | කොලොන්නාව පර්යන්තය (මෙ.ටො) | මුතුරාජවෙල පර්යන්තය (මෙ.ටො) | එකතුව | ගබඩා ධාරිතා දින ගනන |
|---|---|---|---|---|
| නැප්තා | 10,100 | - | 10,100 | - |
| ඔක්ටේන් 95 පෙට්‍රල් | 27,769 | - | 27,769 | 137 |
| ඔක්ටේන් 92 පෙට්‍රල් | 58,941 | 68,746 | 127,687 | 31 |
| භූමිතෙල් | 9,813 | - | 9,813 | 39 |
| ගුවන් යානා ඉන්ධන | 47,493 | - | 47,493 | - |
| ඔටෝ ඩීසල් | 31,910 | 117,403 | 149,313 | 26 |
| සුපර් ඩීසල් | 17,680 | - | 17,680 | 82 |
| දැවි තෙල් | 44,582 | 19,500 | 64,082 | - |
| සොල්වන්ට් | 1,938 | - | 1,938 | 148 |
| කාර්මික භූමිතෙල් | 1,786 | - | 1,786 | 148 |
| **එකතුව** | **252,012** | **205,649** | **457,661** | |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

## 2.2 ඉන්ධන බෙදාහැරීම

දිවයින පුරා ඉන්ධන බෙදාහැරීමේ ක්‍රියාවලිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමේ ඉන්ධන අවශ්‍යතාවයන්ට අනුව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ බෙදාහැරීම් අංශය මඟින් සිදු කරනු ලබයි. තවද සිනොපෙක් ආයතනය දේශීය ඉන්ධන වෙළඳපොළට පිවිසීමත් සමගම එම ආයතනය වෙනුවෙන් ඉන්ධන තොග බෙදාහැරීම් ද ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ආරම්භ කරන ලදී. කොලොන්නාව නිමාව, මුතුරාජවෙල පර්යන්තය සහ රටපුරා පිහිටි ප්‍රාදේශීය තොග ගබඩා උපයෝගී කර ගනිමින් ඉන්ධන බෙදාහැරීම් කටයුතු නිසි අයුරින් ක්‍රියාත්මක කරනු ලබන අතර ඉන්ධන බෙදාහැරීම සඳහා දුම්රිය ගැල්, නළ මාර්ග සහ ඉන්ධන ටැංකි රථ යොදා ගනු ලැබේ. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මඟින් 2023.01.01 සිට 2023.09.30 දක්වා එක් එක් ආයතනය වෙත බෙදාහරින ලද නිෂ්පාදන ප්‍රමාණයන් පහත 11.2, 11.3 සහ 11.4 වගු මඟින් දක්වා ඇත.

ඒ අනුව 2023 වර්ෂයේ පළමු මාස නමය තුළ වාර්තා කරනු ලබන මුළු බෙදාහැරීම් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2,415,442 ක් වන අතර එම බෙදාහැරීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන මෙට්‍රික් ටොන් 2,282,058 ක්, ලංකා ඉන්දියානු තෙල් සමාගම් ඉන්ධන මෙට්‍රික් ටොන් 120,766 ක් සහ සිනොපෙක් සමාගමේ ඉන්ධන මෙට්‍රික් ටොන් 12,618 කින් සමන්විතවේ. ඒ අනුව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සමස්ථ ඉන්ධන බෙදාහැරීම්වලින් 94% ක් ලංකා ඛනිජ තෙල් සංස්ථාව සතු ඉන්ධන වන අතර ඉතිරි 6% ක ප්‍රමාණය ලංකා ඉන්දියානු තෙල් සමාගම සහ සයිනොපෙක් සමාගම සතු ඉන්ධන වේ.

## 11.2 වගුව
## 2023 වසර තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය ( මෙ.ටො.)

| මාසය | පෙට්‍රල් - 92 ඔක්ටේන් | පෙට්‍රල් - 95 ඔක්ටේන් | ලංකා ඔටෝ ඩීසල් | ලංකා සුපර් ඩීසල් | ජෙට් ඒ-1 | LSK | දැවි තෙල් | නැප්තා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 66,234 | 2,022 | 80,150 | 1,857 | 29,667 | 4,588 | 16,613 | 13,193 | 214,324 |
| පෙබරවාරි | 60,262 | 1,519 | 78,553 | 1,747 | 27,710 | 4,544 | 23,717 | 2,910 | 200,961 |
| මාර්තු | 70,640 | 1,661 | 91,554 | 1,549 | 31,232 | 5,247 | 42,402 | 10,737 | 255,022 |
| අප්‍රේල් | 74,659 | 2,930 | 91,852 | 1,714 | 26,517 | 4,872 | 44,783 | 7,509 | 254,837 |
| මැයි | 70,258 | 3,175 | 89,088 | 3,274 | 24,474 | 4,232 | 26,149 | 11,053 | 231,703 |
| ජූනි | 77,572 | 2,818 | 98,108 | 3,472 | 24,492 | 6,136 | 41,305 | 17,273 | 271,176 |
| ජූලි | 74,966 | 3,316 | 99,314 | 3,530 | 32,917 | 5,590 | 39,467 | 11,727 | 270,827 |
| අගෝස්තු | 77,700 | 2,623 | 130,932 | 2,838 | 35,113 | 6,341 | 51,990 | 19,045 | 326,583 |
| සැප්තැම්බර් | 69,910 | 2,100 | 87,584 | 3,097 | 32,726 | 6,299 | 34,629 | 20,279 | 256,625 |
| **එකතුව** | **642,202** | **22,164** | **847,136** | **23,078** | **264,849** | **47,849** | **321,055** | **113,726** | **2,282,058** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

## 11.3 වගුව
## 2023 වසර තුළ ලංකා ඉන්දියන් තෙල් සමාගම වෙත ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය (මෙ.ටො.)

| මාසය | පෙට්‍රල් - 92 ඔක්ටේන් | පෙට්‍රල් - 95 ඔක්ටේන් | ලංකා ඔටෝ ඩීසල් | ලංකා සුපර් ඩීසල් | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 9,605 | 669 | 3,995 | 94 | 14,363 |
| පෙබරවාරි | 3,328 | 513 | 6,701 | 160 | 10,702 |
| මාර්තු | 7,155 | 313 | 8,502 | 143 | 16,113 |
| අප්‍රේල් | 6,006 | 615 | 5,450 | 215 | 12,286 |
| මැයි | 7,087 | 918 | 4,051 | 303 | 12,359 |
| ජූනි | 5,710 | 342 | 4,596 | 314 | 10,962 |
| ජූලි | 5,588 | 694 | 5,235 | 259 | 11,776 |
| අගෝස්තු | 5,273 | 1,314 | 9,258 | 358 | 16,204 |
| සැප්තැම්බර් | 5,079 | 1,079 | 9,484 | 358 | 16,001 |
| **එකතුව** | **54,831** | **6,457** | **57,274** | **2,204** | **120,766** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

## 11.4 වගුව
## 2023 වසර තුළ සිනොපෙක් සමාගම වෙත ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය ( මෙ.ටො.)

| මාසය | පෙට්‍රල් - 92 ඔක්ටේන් | පෙට්‍රල් - 95 ඔක්ටේන් | ලංකා ඔටෝ ඩීසල් | ලංකා සුපර් ඩීසල් | එකතුව |
|---|---|---|---|---|---|
| අගෝස්තු | 19 | 5 | 17 | 0 | 41 |
| සැප්තැම්බර් | 5,843 | 269 | 6,118 | 347 | 12,577 |
| **එකතුව** | **5,862** | **274** | **6,135** | **347** | **12,618** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

ප්‍රස්තාරය 11.1

2023 වසර තුළ ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය




## 3. 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් වැඩසටහන්හි ප්‍රගතිය

### 3.1 සිනොපෙක් එනර්ජි ලංකා ආයතනය (M/s Sinopec Energy Lanka Pvt Limited) සමඟ ගිවිසුමකට ඇතුල්වීම

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම 2023.08.11 දින පෙට්‍රෝලියම් නිෂ්පාදනය, ගබඩා කිරීම සහ බෙදා හැරීම සඳහා සිනොපෙක් එනර්ජි ලංකා ආයතනය සමඟ ගිවිසුමකට එළඹුණි. 2023 සැප්තැම්බර් මාසයේ සිට සිනොපෙක් ආයතනයේ ඉන්ධන පිරවුම්හල් සඳහා ඉන්ධන බෙදා හැරීම ආරම්භ කරන ලදී.

### 3.2 ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම සතු බවුසර් ඇණිය සඳහා GP පද්ධතියක් හඳුන්වාදීම

තොග ගබඩා හා පිරවුම්හල් වෙත ඉන්ධන බෙදා හැරීම සඳහා බවුසර් 133 කින් යුත් (ධාවන තත්වයේ පවතින) තමන්ගේම බවුසර් සංචිතයක් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම පවත්වාගෙන යයි. එම බවුසර් ඇනිය සඳහා 2022 ඔක්තෝම්බර් මාසයේදී GPS-පාදක බෙදාහැරීම් කළමනාකරණ සහ අධීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම ආරම්භ කරන ලද අතර 2023 අප්‍රේල් මාසයේදී එම කටයුතු සාර්ථකව නිම කරන ලදී. GPS පද්ධතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අධීක්ෂණ කටයුතු අභ්‍යන්තර විගණන කාර්යාංශය මගින් සිදු කෙරෙන අතර මාසික ඉන්ධන පරිභෝජනය විශ්ලේෂණය කිරීමේදී, GSP පද්ධතිය ස්ථාපනය කිරීමෙන් පසු 2023 අප්‍රේල් මාසයේදී CPSTL බවුසර් රථවල ඉන්ධන පරිභෝජනය මසකට ඉන්ධන ලීටර 100,000 (රුපියල් මිලියන 30) න් ඉතිරියක් වූ බව අනාවරණය විය.

### 3.3 කොළඹ වරායේ සිට කොලොන්නාව දක්වා දිවෙන විෂ්කම්භය අඟල් 14 න් යුතු නළ මාර්ගය ප්‍රතිසංස්කරණය

ඉන්ධන ප්‍රවාහනය සඳහා පවත්නා නළ මාර්ග පද්ධතිය ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතී. එබැවින් කොළඹ වරායේ සිට කොලොන්නාව දක්වා දිවෙන විෂ්කම්භය අඟල් 14 ක් වූ මීටර් 5,750 ක් දිග නළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම 2021 දී ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 133 ක ඇස්තමේන්තුගත මුදලක් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් වෙන් කරන ලද අතර එමගින් 2023.09.31 වන විට 85% ක පමණ භෞතික ප්‍රගතියක් අත්කර ගන්නා ලදී. ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු 2023 වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කර ඇත.

## 4. 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති

- ඉන්ධන ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා කොළඹ වරායේ සිට කොලොන්නාව දක්වා දිවෙන විෂ්කම්භය අඟල් 18 න් යුතු නළ මාර්ගයක් ඉදිකිරීම



- ඉන්ධන ගබඩා ධාරිතාවය වැඩි කිරීම සඳහා අතර මග නතර කරන ලද කොලොන්නාව පර්යන්තයේ සමස්ත ධාරිතාවය ඝන මීටර් 64,000 කින් යුත් ඉන්ධන තොග ගබඩා ටැංකි 06 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම



# දොළොස්වන පරිච්ඡේදය

# ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය

PDASL
ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය
இலங்கை பெற்றோலிய அபிவிருத்தி அதிகாரசபை
Petroleum Development Authority of Sri Lanka

## 1. හැඳින්වීම

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL) 2021 අංක 21 දරණ ඛනිජ තෙල් සම්පත් පනත බලාත්මක කිරීමෙන් ස්වාධීන නෛතික අධිකාරියක් ලෙස ස්ථාපිත කර ඇති අතර ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් හා ස්වාභාවික වායු ගවේෂණ, සංවර්ධන සහ නිෂ්පාදන මෙහෙයුම් සියල්ලෙහිම නියාමනය සහ කළමනාකරණය සඳහා බලය ලත් ආයතනය වේ. මෙම කටයුතු සිදු කිරීමේදී ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය විසින් ඛනිජ තෙල් සම්පත් ගවේෂණය, ක්ෂේත්‍රයේ යහපත් සෞඛ්‍ය ආරක්ෂාව සහ පාරිසරික පිළිවෙත් වලට අනුකූලව සිදු කරන බවට සහතික වීම සඳහා වගකීම දරයි.

**දැක්ම**

රටේ ඛනිජතෙල් සම්පත් ප්‍රතිලාභ සියලු ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම තහවුරු වන පරිදි සාධාරණ, සුරක්ෂිතව හා පාරිසරික වශයෙන් හිතවාදීව තිරසාර ලෙස කර්මාන්තය කළමනාකරණය සහතික වීම.

**මෙහෙවර**

අවසාන ආර්ථික තෙල් සංචිතය දක්වා ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ සහ දැනුම ගලායාම දිරිගැන්වීමේ අරමුණින් දේශීයව වේගයෙන් සංවර්ධනය වන ආර්ථික අපේක්ෂාව මුදුන්පත් වන පරිදිත් ස්ථාවර හා කාර්යක්ෂම නියාමන රාමුවක් නිර්මාණය වන පරිදිත් මූල්‍ය ප්‍රතිපත්තියක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

**අරමුණු**

ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියේ මූලික ඉලක්කය දේශීය ඛනිජ තෙල් හා ස්වාභාවික වායු ගවේෂණය සහ ඒ තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට මෙන්ම ජාතික බලශක්ති සුරක්ෂිතතාවට දායකවීම වන අතර එය සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් අරමුණු කාලෝචිතව ඉටු කර ගැනීම අත්‍යාවශ්‍ය වේ.

- උද්ගාමී ඛනිජ තෙල් ක්‍රියාකාරකම් (ගවේෂණය සහ නිෂ්පාදනය) වැඩි දියුණු කිරීම.
- ජාතික ඛනිජ තෙල් දත්ත ගබඩාවෙහි දත්ත පරිමාව සහ දත්තවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- උද්ගාමී ඛනිජ තෙල් ක්‍රියාකාරකම් නියාමනය කිරීම.
- ඛනිජ තෙල් මෙහෙයුම් ක්‍රියාත්මක වන විට එහි අනුක්‍රමික අවධීන්හි දී ජාතික සමාජ ආර්ථික ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම.
- ඛනිජ තෙල් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී පරිසර දූෂණය වැළැක්වීම සහ සෞඛ්‍යය ආරක්ෂණ පාරිසරික අවධානම අවම කිරීමට පියවර ගැනීම.

## 2. 2023 වසර තුළ සිදු කළ ක්‍රියාකාරකම්

මෑත කාලීනව රටතුළ ඇතිවූ විදේශ විනිමය අර්බුදය හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය මහත් අභියෝගාත්මක කරුණක් වූ බැවින්, දේශීයව රට තුළ පවතින බවට තහවුරුව පැවති ඛනිජ තෙල් හා වායු සම්පත් විදුලිබල හා බලශක්ති විෂය භාර අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය මගපෙන්වීම යටතේ ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය මඟින් උපයෝජනයට අවශ්‍ය පියවර ගනිමින් පවතී. 2023 වසර තුලදී ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකාවේ අනෙකුත් විකල්ප බලශක්ති ව්‍යාපෘති සමඟ සහයෝගය ඇතිව අක්වෙරළ ඛනිජ තෙල් ගවේෂණ සහ නිෂ්පාදන ක්‍රියාවලිය ජාතික ආර්ථිකයේ තිරසාර වර්ධන ධාවකයෙකු බවට පත් කරලීම උදෙසා වන උපාය මාර්ග සමගින් නව ප්‍රවේශයකට එළඹෙන ලදී. එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට, අවම කාර්ය මණ්ඩලයක උපරිම ධාරිතාවය යොදවමින් කාර්යක්ෂම පරිපාලනමය සහ නීතිමය වැඩපිළිවෙළක් යටතේ ආකර්ශනීය/හිතකර උද්ගාමී ආයෝජන පරිසරයක් නිර්මාණය කරමින් ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියේ තිරසාර ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා වන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරන ලදී.

### 2.1 කෙටුම්පත් කරන ලද/ප්‍රකාශයට පත් කරන ලද උද්ගාමී ඛනිජ තෙල් රෙගුලාසි

නව පනතේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සහ ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියෙහි ක්‍රියාකාරිත්වය තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා නව පනතින් ප්‍රකාශ කර ඇති ක්ෂේත්‍රවල ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම සඳහා රෙගුලාසි සකස් කිරීමට පියවර ගනිමින් සිටී. ඒ අනුව ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් රෙගුලාසි කෙටුම්පත් කරන ලදී.

- 2023 අංක 1 දරන ඛනිජ තෙල් සම්පත් (ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම්) රෙගුලාසි
- 2023 අංක 2 දරන ඛනිජ තෙල් සම්පත් (සේවා සපයන්නන් සඳහා බලපත්‍ර ලබා දීම) රෙගුලාසි

ඉහත ප්‍රකාශිත රෙගුලාසි වලට අමතරව හයිඩ්‍රොකාබන් ගවේෂණ ක්‍රියාකාරකම් සඳහා දත්ත උත්පාදනය, ඛනිජ තෙල් දත්ත බැලීම, බලපත්‍ර ලබා දීම සහ භාවිතය සඳහා අයිතිවාසිකම් ලබා දීම යන අත්‍යවශ්‍ය රෙගුලාසි කෙටුම්පත් කර නුදුරේදීම සම්මත කර ගැනීමට කටයුතු සම්පාදනය කරමින් පවතී.

## 2.2 ඒකාබද්ධ අධ්‍යයන වැඩසටහන් හරහා අක්වෙරළ ගවේෂණ බිම් කොටස් ගවේෂණය කිරීම.

ඒකාබද්ධ අධ්‍යයන වැඩසටහන් හරහා අක්වෙරළ බිම් කොටස් ගවේෂණය කිරීමට උනන්දුවක් දක්වන ආයෝජකයින් සමග ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය අඛණ්ඩව සාකච්ඡා පවත්වනු ලැබේ. මේ අතරතුර, විවෘත බිම් ප්‍රමාණ මත අක්වෙරළ ඛනිජ තෙල් ගවේෂණ කටයුතු කිරීම යටතේ මන්නාරම, කාවේරි සහ ලංකා යන ද්‍රෝණි තුනටම ඒකාබද්ධ අධ්‍යයනයන් සඳහා ආයෝජක අභිලාෂ කැඳවීමට 2023 ජූලි මාස 31 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සමග එක්ව ද්‍රෝණි තුනෙහිම ඒකාබද්ධ අධ්‍යයනයන් සිදු කිරීම සඳහා අභිලාෂ කැඳවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් සිටී.

## 2.3 බහු-සේවාදායක දත්ත ලබා ගැනීම, සැකසීම/නැවත සැකසීම, අලෙවිකරණය සහ බලපත්‍ර ලබා දීමේ වැඩසටහන්

ස්ලම්බජර් (Schlumberger) සහ බෙල් ජියෝස්පේස් (Bell Geospace) සමාගම් බහු-සේවාදායක දත්ත සැකසීම/නැවත සැකසීම, අලෙවිකරණය සහ දත්ත බලපත්‍ර ලබා දීමේ වැඩසටහන් අඛණ්ඩව සිදු කරයි. මෙම සමාගම් විසින් ජාත්‍යන්තර සම්මන්ත්‍රණවල දී ශ්‍රී ලංකාවේ බහු-සේවාදායක දත්ත ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරන ලදී.







## 2.4 ග්‍රීන්ස්ටැට් පුද්ගලික සමාගම විසින් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සහ නියමු ව්‍යාපෘති

ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය, ග්‍රීන්ස්ටැට් ආයතනය සමග එළඹෙන ලද අවබෝධතා ගිවිසුම අනුව ගෘහස්ථ හයිඩ්‍රජන් භාවිතය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනය ක්‍රියාත්මක කරමින් පවතින අතර වසර 2048 දක්වා වන ශ්‍රී ලංකාවේ ජාතික හයිඩ්‍රජන් ක්‍රියාත්මක කිරීම උදෙසා වන උපාය මාර්ග ඇතුළත් මාර්ග සිතියම 2023 සැප්තැම්බර් මස දී ප්‍රකාශයට පත් කරන ලදී. තවද, 2023 නොවැම්බර් වන විට විශිෂ්ටතා පිළිබඳ මූලික මධ්‍යස්ථානයක් (Centre of Excellence) ආරම්භ කිරීම සඳහා ග්‍රීන්ස්ටැට් පුද්ගලික සමාගම ජාතික විද්‍යා පදනම සහ අනෙකුත් ප්‍රමුඛ විශ්ව විද්‍යාල සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකරමින් පවතී. ප්‍රධාන පාර්ශ්වකරුවන් සහ ඉදිරිපෙළ කර්මාන්තකරුවන් සමග ශක්‍යතා අධ්‍යයන සහ හරිත හයිඩ්‍රජන් නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන්ද සාකච්ඡා පවත්වයි.

## 3. 2024 වසර සඳහා යෝජිත කාර්යයන්හි සාරාංශය

- ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම්වලට එළැඹීමට සහ එකඟ වූ බිම් කොටස්වල ගවේෂණ කටයුතු ආරම්භ කිරීම.

- කඩිනමින් ඛනිජ තෙල් නිෂ්පාදනයක් ලබා ගැනීමේ අපේක්ෂාව ඉලක්ක කර ගනිමින් දැනට සොයා ගන්නා ලද ස්වාභාවික වායු නිධි (විශේෂයෙන් ඩොරාඩෝ නිධිය) තක්සේරු කිරීම සහ උපාය මාර්ගිකව සංවර්ධනය කිරීම.

- පිළිගත් සේවා සපයන්නන් සමග බහු සේවාදායක පදනම මත නව දත්ත අත්පත් කර ගැනීම, සැකසීම, සිතියම්ගත කිරීම සහ නැවත සැකසීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියට නව තාක්ෂණික කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ ජාතික ඛනිජ තෙල් දත්ත ගබඩාවට ගුණාත්මක දත්ත එකතු කිරීම පිණිස ජාත්‍යන්තර ප්‍රවීණයන්ගේ සහාය ඇතිව අභ්‍යන්තර දත්ත පරිවර්ථනය කිරීම සහ ද්‍රෝණි විශ්ලේෂණයන් තවදුරටත් සිදුකිරීම.

- දත්ත ගබඩා කිරීම, උපස්ථ කිරීම, මාරු කිරීම, වර්ගීකරණය, මිලකරණය, දත්ත බැලීම, බලපත්‍ර ලබා දීම සහ අදාළ මෘදුකාංග/දෘඩාංග සංවර්ධනය සඳහා ඛනිජ තෙල් දත්ත

කළමනාකරණ විසඳුම් සමාලෝචනය කර යාවත්කාලීන කිරීම.

- කර්මාන්තයේ විශේෂඥයන්ගේ සහාය ඇතිව උද්ගාමී ඛනිජ තෙල් කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.

- උද්ගාමී ඛනිජ තෙල් මෙහෙයුම් කටයුතුවල දේශීය සහභාගීත්වය වර්ධනය කිරීම සහ උපරිම කිරීම සඳහා නව රෙගුලාසි මත පදනම් වූ ඵලදායී දේශීය අගය වර්ධන උපාය මාර්ගයක් සමාලෝචනය කර ක්‍රියාත්මක කිරීම.

- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ග්‍රීන් හයිඩ්‍රජන් ව්‍යාපෘතිය සඳහා ග්‍රීන්ස්ටැට් සමාගම හා එක්ව ඔවුන් විසින් සැලසුම් කර ඇති පරිදි ශක්‍යතා අධ්‍යයන සහ නියමු ව්‍යාපෘති අඛණ්ඩව සිදු කිරීම.

**විදුලිබල අංශය**

අංක 437, ගාලු පාර, කොළඹ 03.
இல. 437, காலி வீதி, கொழும்பு 03.
No. 437 Galle Rd, Colombo 03.

Tel. - 0112 57 49 22

Web - www.powermin.gov.lk

Fax - 0112 57 47 41

**බලශක්ති අංශය**

අංක 80, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
இல. 80, சேர் ஏர்னஸ்ட் டி சில்வா மாவத்தை, கொழும்பு 07.
No. 80, Sir Ernest de Silva Mw, Colombo 07.

Tel. - 0112 37 00 32/33

Web - www.energymin.gov.lk

Fax - 0112 37 21 15


රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව